# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 13 ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)




ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපෑල : info@nie.lk

# බුද්ධ ධර්මය
## ගුරු මාර්ගෝපදේශය
## 13 ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)


ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

බුද්ධ ධර්මය

13 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2018

C ජාතික අධ්‍යාපන ආයතනය

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය :
මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂය සම්බන්ධීකරණය** : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
පූජ්‍ය උඩුගම සුදස්සී හිමි,
දෙපාර්තමේන්තු ප්‍රධාන,
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**විෂය විශේෂඥ උපදෙස්** :

**අතිපූජ්‍ය ගන්තුනේ අස්සජි මහානායක මාහිමිපාණන් වහන්සේ**
- හිටපු කථිකාචාර්ය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

**මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි** - හිටපු මහාචාර්ය,
කැලණිය විශ්වවිද්‍යාලය.

**ලේඛක මණ්ඩලය** :

**පූජ්‍ය නාඔටුන්නේ විමලඤාණ හිමි** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
කැලණිය විශ්වවිද්‍යාලය.

**පූජ්‍ය උඩුගම සුදස්සී හිමි** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
දෙපාර්තමේන්තු ප්‍රධාන,,
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපා.
ජාතික අධ්‍යාපන ආයතනය.

**පූජ්‍ය මඩාටුගම සුරක්ඛිත හිමි** - ගුරු සේවය,
ශ්‍රී පේමානන්ද විද්‍යායතන පිරිවෙන,
මඩාටුගම.

**මහාචාර්ය උදිත ගරුසිංහ මහතා** - මහාචාර්ය,
කැලණිය විශ්වවිද්‍යාලය.

**පී.ඒ. සරත්කුමාර මහතා** - ගුරු සේවය
තක්ෂිලා මහපිරිවෙන, කඩුවෙල.

| | | |
|---|---|---|
| **ආර්.එම්.තිලක් තුෂාර රත්නායක මහතා** | - | ගුරු සේවය,<br>ශ්‍රී විමලධර්ම මහපිරිවෙන, දන්ගොල්ල,<br>මහනුවර. |
| **විෂය සංස්කරණය :** | | |
| **පූජ්‍ය උඩුගම සුදස්සී හිමි** | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>දෙපාර්තමේන්තු ප්‍රධාන,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **එස්.බී.එම්. නිමල් ධර්මසිරි මහතා** | - | අධ්‍යාපන අධ්‍යක්ෂ, ආගමික හා<br>සාරධර්ම ශාඛාව, අධ්‍යාපන<br>අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. |
| **භාෂා සංස්කරණය :** | | |
| **ශ්‍රීනාත් ගණේවත්ත මහතා** | - | භාෂා සංස්කාරක |
| **පරිගණක වදන් සැකසුම :** | | |
| **මංගලිකා විජේරත්න මහත්මිය** | - | ජාතික අධ්‍යාපන ආයතනය |
| **විවිධ සහය :** | | |
| එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය | - | ජාතික අධ්‍යාපන ආයතනය |
| ඩයස් අමරසිංහ මහතා | - | ජාතික අධ්‍යාපන ආයතනය |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

කාලීන අවශ්‍යතා පදනම් කොට 2009 වසරේ දී අ.පො.ස. (උ.පෙළ) පන්තිවල අදාළ විෂයමාලා වෙනස්කම්වලට අනුකූලව තවදුරටත් නවීකරණයට භාජනය කරමින් 2017 වර්ෂයේ සිට පද්ධතිය තුළ ක්‍රියාත්මක වන 12 ශ්‍රේණිය සඳහා වූ විෂයමාලා වෙනස්වීම් සහිත මෙම ගුරු මාර්ගෝපදේශය ඔබ අතට පත් වනු ඇත.

නව සහස්‍රයේ අභියෝග ජය ගැනීමට වෙර දරණ ගුරු පරපුරට සාර්ථක ජීවන ගමනක් සඳහා මගපෙන්වීම උදෙසා සිසුන් තුළ ප්‍රගුණ කළ යුතු නිපුණතා හා නිපුණතා මට්ටම් නිවැරදි පෙළ ගැස්වීමකට හා සවිස්තරාත්මක ව තොරතුරු ඉදිරිපත් කිරීමකට මෙම මාර්ගෝපදේශය භාජනය කොට තිබේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදකව ඉටු කිරීම සඳහා ප්‍රබලතාවයකින් යුතුව පෙර අත්දැකීම් ද සැලකිල්ලට ගෙන මෙම ගුරු මාර්ගෝපදේශය විෂයමාලා සම්පාදකවරු විසින් ඔබ වෙත සංග්‍රහ කොට ඇත. මෙම විෂයධාරාවට අදාළ ව ගුරු භවතුන්ගේ නව නිර්මාණාත්මක හැකියාව එක් කොට ගනිමින් අනුමත කොට ඇති විෂය නිර්දේශය නිපුණතා පාදකව අනාගත අපේක්ෂණ කරා දරුවන් පෙළ ගැස්වීමට ඉගෙනුම් ඉගැන්වීම් කාර්ය සඳහා යොදා ගැනීම ගුරු භවතුන්ගේ කාර්යයකි.

මෙය ඔබ අතට පත් වූ වහාම මෙහි ඇති විෂය නිර්දේශයෙහි වැදගත්කම හා පෙළගැස්ම පළමුව මනාව වටහා ගත යුතු ය. අනුමත කාලච්ඡේද සියල්ල සැළකිල්ලට ගෙන වාරයට නියමිත විෂය කොටස් හඳුනා ගනිමින් වාර සටහන් හා දින සටහන් ක්‍රමානුකූලව නිවැරදිව සකස් කර ගැනීමට වගබලා ගැනීම ඔබ සතු යුතුකමක් බව සිහිපත් කරමි.

පැවති ගුරු මාර්ගෝපදේශය හා සැසඳීමේ දී සෑම නිපුණතා මට්ටමක්ම ඉටු කර ගැනීම සඳහා අදාළ ඉගනුම් පල කීපයක් හඳුන්වා දී ඇත. මෙය මෙම විෂය නිර්දේශය තුළ නව ප්‍රවණතාවයකින් යුතු එක් කිරීමක් ලෙස හඳුන්වා දිය හැකි ය. එම ඉගෙනුම් පල ඉටුවන ලෙසත් ඒ තුළින් නිපුණතා මට්ටම සාක්ෂාත් කර ගැනීමටත් අවැසි පහසුව සැලසීම උදෙසා උපදෙස් ලබා දී ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනයේ දී ගුරු භවතුන්ට තම අභිමතය පරිදි නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීම සඳහා නිපුණතා පාදක ක්‍රමවේදයට ගැළපෙන නිදහස් විකල්ප ඉගෙනුම් ක්‍රමවේද භාවිත කිරීමට අවස්ථාව සැලසේ. ඔබ විසින් යොදා ගන්නා ඉගෙනුම් ප්‍රවේශය සතුටුදායක සිසු මනසට ගැලපෙන කුතුහලය උපදවන පෙර අත්දැකීම් ද සැලකිල්ලට ගත් කාර්යක්ෂම ක්‍රමවේදයක් වීම ඉතා වැදගත් වේ.

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා ලබා දී ඇති උපදෙස් අනිවාර්ය වූවක් නොවන අතර අදාළ කටයුත්ත නිසි පරිදි ඉටුවේ යැයි මැන බලා ගැනීම සඳහා ඔබේ අභිමතය පරිදි වෙනස්කම්

සිදු කර ගැනීමට අවකාශ සැලසේ. එසේ වුවද නිපුණතාව හා නිපුණතා මට්ටම් පිළිබඳ ව දක්වන සැළකිල්ල වෙනස් නොවිය යුතු ය. සෑම නිපුණතාවක් අවසානයේ දී ම ලබා දී ඇති පරිශීලනයත් පිළිබඳ ව මනා මගපෙන්වීමක් සිසුන් වෙත දැක්වීම අතිශයින් වැදගත් වේ.

මෙම ගුරු මාර්ගෝපදේශය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදකව සිදු කිරීම සඳහා අත්පොතක් වේවා යි ප්‍රාර්ථනා කරන අතර, නව සහස්‍රය ජය ගැනීමට දරුවාගේ මනස නිවැරදිම මාවතට යොමු කිරීම සඳහා මගපෙන්වන ධාර්මික අත්වැලක් වේවායි ප්‍රාර්ථනා කරමි.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**ශාස්ත්‍රපති පූජ්‍ය උඩුගම සුදස්සී හිමි,**
**දෙපාර්තමේන්තු ප්‍රධාන,**
**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව.**

| පටුන | පිටුව |
|---|---|


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | ii |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | iv |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | viii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-60 |
| පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම සහ ඉගෙනුම් උපකරණ | 61-71 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

# හැඳින්වීම

අධ්‍යාපන සංවර්ධනයේ දී විෂයමාලාවට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. ජාතික අවශ්‍යතාවලට ගැළපෙන අයුරින් විෂයමාලා සැකසීම කාලීන අවශ්‍යතාවකි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 6-11 ශ්‍රේණිවල සිසුන්ට 2015 වර්ෂයේ සිට හඳුන්වා දෙනු ලැබූ බුද්ධ ධර්මය නව විෂය නිර්දේශය තුළින් බුදුදහමේ ප්‍රධාන ඉගැන්වීම්, ශාසන ඉතිහාසය හා බෞද්ධ සංස්කෘතිය යටතේ අදාළ ශ්‍රේණිවලට ප්‍රමාණවත් වන පරිදි කරුණු හැදෑරීමට අවස්ථාව සලසන ලදි. එය නිපුණතා පාදකව සිදුවුණි.

එම අරමුණු ඉටුකර ගනිමින් අ.පො.ස. (සා. පෙළ) කඩඉම පසුකර උසස් පෙළට පිවිසෙන ශිෂ්‍යයා මෙම විෂය හැදෑරීමෙන් බුද්ධ කාලීන භාරතීය ආගමික චින්තා මෙන් ම ඊට සාපේක්ෂව බෞද්ධ ඉගැන්වීමේ අර්ථාන්විත බවද, ත්‍රිවිධ රත්නය, බුදු දහමේ මූලික ඉගැන්වීම්, බෞද්ධ ආචාර ධර්ම, ශාසන ඉතිහාසය, බෞද්ධ ආර්ථික හා දේශපාලන දර්ශනය ආදී ක්ෂේත්‍ර පිළිබඳ විස්තරාත්මක, විචාරාත්මක හා තුලනාත්මක ගවේෂණයට යොමු කරවනු ලැබේ.

බුද්ධ ධර්මය විෂය නිර්දේශය හුදෙක් තත් විෂයයේ මූලධර්ම හා න්‍යායාත්මක කරුණු අධ්‍යයනයකට වඩා, ප්‍රායෝගික ජීවන දර්ශනයක් වශයෙන් මෙන් ම විමුක්ති මාර්ගයක් වශයෙන් තම දැනුම ඵලදායකව උපයෝග කරගත හැකි අයුරින් සකස් කොට ඇත. තව ද විද්‍යාර්ථියා තුළ විචාරශීලීත්වය, ස්වාධීනත්වය හා නිර්මාණශීලී භාවිතය වැඩි දියුණු වන අයුරින් විෂය අන්තර්ගතය සකස් කොට තිබේ.

අසා දැන ගැනීමට වඩා තමා විසින් ම කරුණු එක්රැස් කිරීම, ඒවා බෙදා විග්‍රහ කිරීම, එම කරුණුවල අන්තර්ගතය භාවිතයට ගැනීම පිළිබඳ අවබෝධය ශිෂ්‍යයා තුළ වැඩිදියුණු වන පරිදි විෂය නිර්දේශයේ කරුණු ක්‍රියාවට නැගිය යුතු වේ.

නිපුණතා සියල්ල සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය විෂය දැනුමෙන්, ආකල්පවලින්, කුසලතාවන්ගෙන් හා ජීවන යහපුරුදුවලින් පිරිපුන් බෞද්ධ සාරධර්මවලින් පෝෂණය වූ මනා පෞරුෂයකින් හෙබි ඉගෙනුම්ලාභියෙකුගේ බිහිවීම බලාපොරොත්තු වේ.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වු ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**
   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

**5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

# විෂය අරමුණු

මිනිසා අවිද්‍යාවෙන් විද්‍යාවටත්, අන්ධකාරයෙන් ආලෝකයටත්, පරාධීනත්වයෙන් ස්වාධීනත්වයටත්, දීන මානසිකත්වයෙන් අභිමානයටත් පත් කොට මෙලොව හා පරලොව වශයෙන් භෞතික හා ආධ්‍යාත්මික උභයාර්ථ සාධනය වෙත යොමු කිරීමත්, ස්වාර්ථය හා පරාර්ථය සම ව සිතන, මානව වර්ගයාට පමණක් නොව සමස්ත සත්ත්ව ප්‍රජාවට මෙන් ම, පරිසරයට ද හිතකාමී සත්පුරුෂ පුද්ගලයකු බවට පත් කිරීමත් බුද්ධ ධර්මය විෂයයෙහි අපේක්ෂාව වේ. එම අපේක්ෂාවන් සාක්ෂාත් කරගනු වස් පහත දැක්වෙන විෂය අරමුණු පිළිබඳ මනා අවධානයකින් ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම ඵලදායක ය.

- බුදු සිරිතින් සහ පරමාදර්ශී ශ්‍රාවක- ශ්‍රාවිකා චරිතවලින් ප්‍රකට වන විශිෂ්ට ගුණ චරිතායනය කරමින් තෙරුවන් ගුණ ඇසුරෙන් පෞරුෂය ගොඩනඟා ගැනීම.
- සමකාලීන සමයාන්තර චින්තා හා බෞද්ධ ඉගැන්වීම් තුලනාත්මක ව හා විචාරාත්මකව අධ්‍යයනය කරමින් නිදහස්, නොවහල්, විචාරශීලී මනසකින් යුතු ව කටයුතු කිරීම.
- බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මක ව අධ්‍යයනය කර සත්ත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවදියෙන් යුතු, ලෝක ධර්මතා හමුවේ නොසැලෙන ප්‍රායෝගික ජීවන දර්ශනයක් ගොඩනඟාගැනීම.
- කර්මය, පුනර්භවය හා කුසල් අකුසල් පිළිබඳ අවබෝධයෙන් හා විශ්වාසයෙන් යුතු සදාචාර සම්පන්න චරිතයක් ගොඩනඟා ගැනීම.
- බෞද්ධ ඉතිහාසය පිළිබඳ ගවේෂණශීලී ව අතීත ශ්‍රාවක- ශ්‍රාවිකාවන්ගේ උදාර කැපවීම අගයමින් ශාසන සංරක්ෂණයට දායක වීම.
- සිය යුතුකම් හා වගකීම් මැනවින් දැන හඳුනාගෙන මනා සමාජ සම්බන්ධතා ජාලයක් සහිත පුද්ගලයකු ලෙස කටයුතු කිරීම.
- කරුණාව, දයාව, මෛත්‍රිය හා ශ්‍රද්ධාව වැනි භාවාත්මක ගුණවලින් පෝෂිත ව, මිනිසා හා පරිසරය පිළිබඳ සංවේදී ව එළඹ සිටි සිහියෙන් හා ප්‍රඥාවෙන් කටයුතු කිරීම.

## 13 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 06.<br>සත්ත්වයා හා ලෝකය පිළිබඳ බෞද්ධ විග්‍රහය අධ්‍යයනය කර යථාර්ථාවබෝධයෙන් යුත් සමාජ හිතකාමී දිවිපෙවෙතක් ගත කරයි. | 6.1<br>සත්ත්වයා හා ලෝකය පිළිබඳ යථාර්ථය දැක අකම්පිත ව කටයුතු කරයි. | • ත්‍රිලක්ෂණය<br>– ඛන්ධ විභාගය<br>– ආයතන විභාගය<br>– ධාතු විභාගය<br><br>• අටලෝ දහම<br>– ත්‍රිලක්ෂණය පිළිබඳ අවබෝධයෙන් හා අෂ්ටලෝක ධර්මයෙහි අකම්පිත වීමෙන් ගොඩනැඟෙන ජීවන දර්ශනය | • සත්ත්වයා හා ලෝකය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විශ්ලේෂණය කරයි.<br>• සත්ත්වයා හා ලෝකය පිළිබඳ යථාර්ථය ත්‍රිලක්ෂණය බව පිළිගනියි.<br>• ත්‍රිලක්ෂණයෙන් හා අටලෝ දහමින් අකම්පිත ව ජීවත් වෙයි.<br>• ගැටලු නිරාකරණයෙහි ලා මෙකී මූලධර්ම උපයෝගී කර ගනියි. | 35 |
| | 6.2<br>ජීව අජීව පරිසරයට හිතකාමී ව ජීවත් වෙයි. | • ජීව අජීව පරිසරය කෙරෙහි දැක්විය යුතු ආකල්පය<br>• අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් | • ජීව අජීව පරිසරය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම හඳුනා ගනියි.<br>• පරිසරය විෂයයෙහි හිතකාමී වෙයි.<br>• පාසල් පරිසර සංගමයේ ක්‍රියාකාරීය ව කටයුතු කරයි.<br>• සමාජය විෂයයෙහි ඉටු කළ යුතු යුතුකම් නොපිරිහෙළා ඉටු කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 07.<br>සත්‍යය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් තම ජීවන දර්ශනය ගොඩනගා ගැනීමට ක්‍රියා කරයි. | 7.1<br>ජීවන ගැටලු විසඳීමෙහි ලා චතුරාර්ය සත්‍යයේ උපයෝගිතාව වටහාගෙන අන්තගාමිත්වයෙන් තොර ව කටයුතු කරයි. | • චතුරාර්ය සත්‍යය<br>• කාමසුඛල්ලිකානු යෝගය, අත්තකිලමථානු යෝගය හා මධ්‍යම ප්‍රතිපදාව<br>• චතුරාර්ය සත්‍යය ඇසුරෙන් ගොඩනැගෙන ජීවන දර්ශනය<br>• ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ලෞකික හා ලෝකෝත්තර උපයෝගිතාව | • චතුරාර්ය සත්‍යය විවරණය කරයි.<br>• අන්තගාමීත්වය බැහැර කළ යුතු බව පිළිගනියි.<br>• මැදුම් පිළිවෙත සිය ජීවන දර්ශනය කර ගනියි.<br>• ජීවිතයේ යාථාර්ථය පිළිබඳ අවදිකමින් ජීවත් වෙයි. | 25 |
| | 7.2<br>සන්තානගත හා සමාජගත දුකෙහි හේතුඵල සම්බන්ධය දැන යථාර්ථවාදී ව ක්‍රියා කරයි. | • පටිච්චසමුප්පාදය<br>• ශාස්වත සහ උච්ඡේද දෘෂ්ටි විචාරය<br>• සන්තානගත දුක සහ සංස්ථාගත දුක ගොඩනැගෙන අයුරු | • පටිච්චසමුප්පාදය විවරණය කරයි.<br>• ශාස්වත උච්ඡේද දෘෂ්ටි බැහැර කළ යුතු බව පිළිගනියි.<br>• දෛනික ජීවිතයේ දී සන්තානගත දුක අවම කර ගැනීමට කටයුතු කරයි.<br>• දෘෂ්ටි බැහැර කර නිදහස් මනසකින් දිවි ගෙවයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| 08.<br>බුදු දහමෙහි මානව කේන්ද්‍රීය බව තේරුම් ගෙන බෞද්ධ ආචාරධර්මවලට අනුගත සාර්ථක ජීවිතයක් ගොඩනඟා ගනියි. | 8.1<br>මානව ස්වාමීත්වය හා ශක්‍යතා පසක් කර සිය විභව්‍යතා වර්ධනය කර ගනියි. | • මිනිසාගේ ස්වාමීත්වය සහ ශ්‍රේෂ්ඨත්වය<br>• ස්වච්ඡන්දතාව, වගකීම හා මිනිසාගේ කායික මානසික ශක්‍යතා<br>• කුසලාකුසල විනිශ්චය කිරීමේ බෞද්ධ නිර්ණායක | • පුද්ගල ස්වාමීත්වය, ශක්‍යතාව හා වගකීම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පැහැදිලි කරයි.<br>• පෞරුෂ සංවර්ධනයට පෙලඹෙයි.<br>• අභියෝග ජය ගනියි.<br>• ආත්ම විශ්වාසයෙන් කටයුතු කරයි. | 30 |
| | 8.2<br>කර්මය, පුනර්භවය හා කුසල් අකුසල් පිළිබඳ විශ්වාසයෙන් සදාචාරාත්මක ජීවිතයකට හුරු වෙයි. | • දස කුසල් හා දශ පුණ්‍ය ක්‍රියා, පංච ශීලය, අෂ්ටාංග ශීලය, ආජීව අෂ්ටමක ශීලය හා දශ ශීලය<br>• සතර බ්‍රහ්ම විහරණ<br>• ශ්‍රද්ධාව හා භක්තිය අතර වෙනස<br>  • අමූලිකා ශ්‍රද්ධාව ආකාරවතී ශ්‍රද්ධාව<br>  • කර්මය හා පුනර්භවය | • කුශලාකුශල කර්ම හා පුනර්භවය පිළිබඳ බෞද්ධ විවරණය ඉදිරිපත් කරයි.<br>• කර්මඵල සිද්ධාන්තය පිළිගනියි.<br>• සදාචාරාත්මක ජීවිතයක් ගත කරයි.<br>• සමාජ සාරධර්ම සංරක්ෂණයට දායක වෙයි. | 40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 09.<br>බෞද්ධ ආර්ථික හා දේශපාලන චින්තනය තේරුම් ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | 9.1<br>ධනෝපායනය හා කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පදනම් කරගත් දැහැමි දිවිපෙවෙතක් ගත කරයි. | • ධනය පිළිබඳ බෞද්ධ ආකල්පය<br>• ඉපයීම, ආයෝජනය හා පරිභෝජනය<br>• ආර්ථික සුරක්ෂිතතාව හා සම්පත් කළමනාකරණය<br>• ආර්ථිකය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පදනම් කරගත් ජීවන දර්ශනය | • ධනෝපායනය හා කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විශ්ලේෂණය කරයි.<br>• ගෘහස්ථ ජීවිතයට ආර්ථික සමෘද්ධිය අත්‍යවශ්‍ය සාධකයක් ලෙස පිළිගනියි.<br>• ධාර්මික ව ධනය උපයයි.<br>• බෞද්ධ ආර්ථික දර්ශනයට අනුකූල ව ජීවත් වෙයි. | 30 |
| | 9.2<br>බෞද්ධ දේශපාලන මූලධර්ම අධ්‍යයනය කර දැහැමි පාලනයකට දායක වෙයි. | • බෞද්ධ දේශපාලන මූලධර්ම<br>- දස රාජධර්ම<br>- දස සක්විති වත්<br>- සප්ත අපරිහානීය ධර්ම<br>- සතර අගති විරතිය<br>- සතර සංග්‍රහ වස්තු<br>- පඤ්ච සීලය<br>- රාජ්‍ය පාලනයට අදාළ වෙනත් ඉගැන්වීම්<br>• බෞද්ධ දේශපාලන මූලධර්ම මඟින් ගොඩනැගෙන ධර්මිෂ්ඨ රාජ්‍යය | • බෞද්ධ දේශපාලන මූලධර්ම අධ්‍යයනය කරයි.<br>• බෞද්ධ දේශපාලන මූලධර්ම යහපත් පාලන තන්ත්‍රයක් සඳහා පදනම බව පිළිගනියි.<br>• ප්‍රජා නායකයකු ලෙස සමාජ සුභසාධන කටයුතුවල නිරත වෙයි.<br>• දැහැමි පාලන තන්ත්‍රයක් උදෙසා දායක වෙයි. | 40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.<br>බෞද්ධ භාවනාවේ අගය වටහාගෙන එය ජීවන ගැටලු විසඳා ගැනීමෙහි ලා ප්‍රායෝගික ව භාවිත කරයි. | 10.1<br>බෞද්ධ භාවනාවේ සුවිශේෂතා හැඳින එහි උපයෝගීතාව පරීක්ෂා කරයි. | • බෞද්ධ භාවනාවේ සුවිශේෂත්වය<br>• සමථ විදර්ශනා භාවනා<br>• සතර සතිපට්ඨාන<br>• සතර කමටහන්<br>• කර්මස්ථාන ආචාර්යවරයා සතු ගුණාංග<br>• යෝගාවචරයාගේ චරිත ලක්ෂණ පිළිබඳ සරල හැඳින්වීමක් | • භාවනාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විස්තර කරයි.<br>• බෞද්ධ භාවනාවේ උපයෝගීතාව පිළිගනියි.<br>• නිරන්තරයෙන් සිහි නුවණින් ජීවත් වෙයි.<br>• ගැටුම් නිරාකරණයෙහි ලා දායකත්වය සපයයි. | 30 |
| | 10.2<br>භාවනාව ප්‍රායෝගික ව ප්‍රගුණ කරමින් සාමකාමී දිවිපෙවෙතක් ගත කරයි. | • බුද්ධානුස්සති භාවනාව<br>• මෛත්‍රී භාවනාව<br>• ආනාපානසති භාවනාව<br>• භාවනාවේ අනුසස්<br>• භාවනාව හා ධාරණ ශක්තිය<br>• භාවනාව හා කායික මානසික සෞඛ්‍යය<br>• භාවනාව හා ගැටලු නිරාකරණය<br>• භාවනාවේ උපයෝගීතාව පිළිබඳ නූතන ඇගයීම් | • භාවනාවේ ප්‍රායෝගික වටිනාකම පැහැදිලි කරයි.<br>• භාවනාව කායික මානසික නීරෝගතාව සඳහා සෘජු ව බලපාන බව පිළිගනියි.<br>• දෛනික ව භාවනාවක නියැළී ධාරණ ශක්තිය වැඩිදියුණු කරගනියි.<br>• කායික මානසික නීරෝගතාව ඇති කරගෙන යහපත් ජීවිතයක් ගත කරයි. | 30 |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 6.0** : සත්ත්වයා හා ලෝකය පිළිබඳ බෞද්ධ විග්‍රහය අධ්‍යයනය කර යථාර්ථාවබෝධයෙන් යුත් සමාජ හිතකාමී දිවිපෙවෙතක් ගත කරයි.

**නිපුණතා මට්ටම 6.1** : සත්ත්වයා හා ලෝකය පිළිබඳ යථාර්ථය දැක අකම්පිතව කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 35 යි.

**ඉගෙනුම් පල** :

- සත්ත්වයා හා ලෝකය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විශ්ලේෂණය කරයි.
- සත්ත්වයා හා ලෝකය පිළිබඳ යථාර්ථය ත්‍රිලක්ෂණය බව පිළිගනියි.
- ත්‍රිලක්ෂණයෙන් හා අටලෝදහමින් අකම්පිතව ජීවත් වෙයි.
- ගැටලු නිරාකරණයෙහි ලා මෙකී මූලධර්ම උපයෝගී කර ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සත්ත්වයා හා ලෝකය පිළිබඳ යථාර්ථය අවබෝධ කරදීම හා ත්‍රිලක්ෂණය හා අටලෝදහම පිළිබඳ අවබෝධයෙන් ජීවන ගැටලු නිරාකරණය කර ගැනීමට මඟපෙන්වීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**ත්‍රි ලක්ෂණය**

- අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන පොදු ලක්ෂණත්‍රයය බුදු දහමේ මූලික සිද්ධාන්තයක් වන බව.
- ලෝකයෙහි සචේතන - අචේතන, බාහිර- අභ්‍යන්තර සියල්ල ත්‍රි ලක්ෂණයට යටත් බව
- හේතු ප්‍රත්‍යය ඇති කළ ඇති වන, නැති කළ නැති වන ස්කන්ධ ආදි ධර්මයන් සංස්කාර ධර්ම ලෙස හැඳින්වෙන බව.
- අනිත්‍ය වූ ධර්ම නිත්‍ය යැයි ද දුක් සහිත වූ ධර්ම සැප යැයි ද අනාත්ම වූ ධර්ම ආත්ම යැයි ද අසුභ වූ ධර්ම සුභ යැයි ද ලෝකයා නිතර ම විකෘත හැඟුමෙන් (සඤ්ඤා) සිතීමෙන් විපර්යාසයකට හෙවත් විකෘති කරණයකට එළඹ සිටින බව
- එම විකෘතියෙන් මුදවාගෙන ප්‍රකෘතිය පෙන්වාදීම ත්‍රි ලක්ෂණ දේශනයෙන් අපේක්ෂිත බව. (විපල්ලාස සූත්‍රය- අ.නි. 2)
- සබ්බෙ සංඛාරා අනිච්චා, අනිච්චාවත සංඛාරා, වයධම්මා සංඛාරා යන සූත්‍රාගත යෙදුම්වලින් සංස්කාර ධර්මවල පවත්නා අනිත්‍යතාව ප්‍රකාශ වන බව.
- සංස්කාර ධර්මවල උප්පාදො (හට ගැනීම හෙවත් උපත) ඨිතස්ස අඤ්ඤථත්තං (උපත හා විපත අතර පැවැත්ම) වයො (විනාශය හෙවත් අවසානය) යනුවෙන් ලක්ෂණ තුනක් ඇති අතර එහි දෙවන හා තෙවන ලක්ෂණවලින් අනිත්‍යතාව කියවෙන බව (තික නිපාත, චුල්ලවග්ග - අ.නි.1)
- හේතු ප්‍රත්‍යය සමවායෙන් හට ගන්නා සියලු සංස්කාර ධර්මයන් ත්‍රිලක්ෂණ ස්වභාවයට යටත් වන බව. (සේලා සූත්‍රය - ස.නි. 1) ''හේතුංපටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති''
- ''ලෝක'' යන්නෙහි මූලික අර්ථය අනිත්‍ය බව හෙවත් කැඩෙන, බිඳෙන, පළුදු වන, වෙනස් වන ස්වභාවයෙන් යුක්ත ය යන්න බව. (ලෝක සූත්‍රය - ස.නි.1)

- සියලු සංස්කාරයෝ අනිත්‍යය, වෙනස් වන සුලු ය. සංස්කාර සැපත හෝ සතුට හෝ ලබා නොදෙයි. සංස්කාර හේතුකොට පුද්ගලයා විඩාවට පත් ව කලකිරී ඉන් සම්පූර්ණයෙන් මිදිය යුතු යැයි දේශනා කර ඇති බව. (මහාවග්ගය- අ.නි. 1)
- බුදු රජාණන් වහන්සේ, රූප, වේදනා, සංඥා, සංඛාරා, විඤ්ඤාණ යන පඤ්චස්කන්ධයෙහි පවත්නා අනිත්‍ය භාවය පිළිබඳ ව පස්වග භික්ෂූන්ට දේශනා කළ බව (අනත්ත ලක්ඛණ සූත්‍රය- ස.නි.3 )
- සංස්කාර ධර්මවල පවත්නා සබ්බේ සංඛාරා අනිච්චා (සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍ය වෙති) සබ්බේ සංඛාරා දුක්ඛා (සියලු සංස්කාර ධර්මයෝ දුක් සහිත වෙති.) සබ්බේ ධම්මා අනත්තා (සියලු ධර්මයෝ අනාත්ම වෙති) යන මෙම තිලකුණ නුවණින් දැකීම විසුද්ධියට හෙවත් නිවනට මඟ වන බව. (ධම්ම පදය මග්ග වග්ගය- ඛු.නි. 1)
- සංසාරගත දුක දුක්ඛ, දෝමනස්ස උපායාස වැනි යෙදුම්වලින් අර්ථවත් වන අතර එයින් කායික දුක මෙන් ම, මානසික දුක ද ප්‍රකට වන බව
- තෘෂ්ණාව හේතු කොට ගෙන සියලු දෙනා නිරතුරු ව ම ඌනතාවෙන් පෙළෙමින් අතෘප්තියට අසහනයට පත් ව සිටින බව. (රට්ඨපාල සූත්‍රය- ම.නි. 2)
- බුදු රජාණන් වහන්සේ චතුරාර්ය සත්‍යය දේශනාවේ දී පළමු ආර්ය සත්‍යයෙන් පඤ්ච උපාදානස්කන්ධය ම දුකක් යැයි අවබෝධ කරදුන් බව (ධම්මචක්කප්පවත්තන සූත්‍රය-ස.නි.5)
- සදාතනව පවත්නා කිසිවක් ලෝකයේ නොමැති අතර අන්‍යෝන්‍ය සම්බන්ධය ඇති ව සාපේක්ෂව සකලවිධ පදාර්ථයන්ගේ පැවැත්ම සිදු වන බැවින් නිත්‍ය ආත්මයක පැවැත්මක් නොපිළිගන්නා බුදු දහම එය පටිච්චසමුප්පාද න්‍යායය මඟින් අනාවරණය කර ඇති බව
- අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්ෂණ එකිනෙකට ප්‍රතිබද්ධ ව පවතින අතර යමක් අනිත්‍ය ද එය දුක් සහිත ය යමක් දුක් සහිත ද එය ආත්ම සාර වශයෙන් ගත නොහැකි යැ යි බුදු දහම පෙන්වා දෙන බව. (අජ්ඣත්තානිච්ච සූත්‍රය- ස.නි. 4, )
- බුදු රජාණන් වහන්සේ රූප, වේදනා දි, ස්කන්ධ ආත්ම වශයෙන් පිළිගත් සච්චකට ත්‍රිලක්ෂණය පදනම් කරගෙන ස්කන්ධවල ආත්මී ය බවක් නොපවතින්නේ යැයි අවබෝධ කර දුන් බව. (චූලසච්චක සූත්‍රය- ම.නි. 1)
- රූපාදි ස්කන්ධ ඒකාන්ත දුක් වශයෙන් නොපිළිගන්නා බුදු දහම ඒවා අවසාන වශයෙන් දුක හා බැඳී පවතින බව හා එසේ පවතින්නේ අනිත්‍යතාවට යටත් වන නිසා බව දේශනා කර ඇති බව (මහාලි සූත්‍රය-ස.නි. 3)
- ත්‍රිලක්ෂණ ධර්මයෙහි සාර්ව භෞමිකත්වය කාම, රූප හා අරූප යන භවත්‍රයයෙහිම ව්‍යාප්තව පවතින බව. (ආනෙඤ්ජ සප්පාය සූත්‍රය-ම.නි.3 )
- ත්‍රිලක්ෂණය පිළිබඳ අවබෝධය ලෞකික ජීවිතය සහනයෙන් හා සතුටින් ගත කිරීමට මෙන් ම නිවන් අවබෝධයට ද හේතු වන බව

ඛන්ධ විභාගය

- පුද්ගලයා සම්බන්ධ පවත්නා වෙනස් නොවන විනාශයට පත් නොවන පරමාර්ථමය ආත්මයක් නොපිළිගන්නා බුදු දහම මම, පුද්ගලයා, සත්ත්වයා ආදි වශයෙන් ව්‍යවහාර කරනු ලබන දෙය තුළ එබඳු පරමාර්ථමය පැවැත්මක් ඇත යන්න ප්‍රතික්ෂේප කරන බව.
- සත්ත්වයා, පුද්ගලයා මම ආදි ව්‍යවහාර තුළ පරමාර්ථ වශයෙන් පවතින්නේ ස්කන්ධ, ධාතු, ආයතන යන මූල සාධකයන්ගේ සමවායක් පමණක් වන අතර ඒවා ලෝකයේ හා සත්ත්වයාගේ ජීවනයට හා පැවැත්මට තුඩු දෙන ශක්තීන් ලෙස බුදු දහම පෙන්වා දෙන බව.
- ස්කන්ධ, ධාතු, ආයතන විභාගය සත්ත්වයා පිළිබඳ සිදු කෙරෙන යථාර්ථමය විග්‍රහයක් බව
- ඛන්ධ යන වචනයෙහි ගොඩ, රාශිය යන අර්ථ ප්‍රකට වන බව
- බුදු දහම සත්ත්වයා රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යනුවෙන් ඛන්ධ නමින් හැඳින්වෙන රාශි හෙවත් ගොඩවල් පහකට විභේදනය කර ඇති බව
- පඤ්චස්කන්ධය නාම- රූප වශයෙන් කොටස් දෙකකට බෙදෙන අතර වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නාම කොටසටත් රූපය රූප කොටසටත් අයත් වන බව
- විඳීම් ස්වභාවය ලක්ෂණය කොට ඇති මානසික අවස්ථා සියල්ල වේදනාස්කන්ධයට ඇතුළත් වන බව
- ඇස, කන, නාසය ආදි ඉන්ද්‍රිය සයට ගෝචරවන රූප, ශබ්ද ආදී අරමුණු හඳුනා ගැනීම සඤ්ඤාස්කන්ධය වන බව.
- බුද්ධ දේශිත පටිච්ච සමුප්පාදයේ හා ඛන්ධ විභාගයේ සංඛාර යන ව්‍යවහාරය කුසල් අකුසල් හෙවත් කර්ම ශක්තිය අර්ථවත් කරන බව.
- අනිච්චාවත සංඛාරා යන දේශනාවේ ''සංඛාර'' යන්නෙන් හේතුප්‍රත්‍යය ඇති කල ඇති වන නැති කළ නැති වන සියල්ල අර්ථවත් කරන බව.
- විජානනය හෙවත් රූප, ශබ්ද, ගන්ධ ආදි වශයෙන් අරමුණක් ඇති බව දැන ගැනීම විඤ්ඤාණය වන බව
- පාලි සූත්‍ර දේශනාවලට අනුව විඤ්ඤාණය 6 වැදෑරුම් බව
- ස්කන්ධවල පවත්නා අස්ථිර බව ප්‍රකට කිරීමට පෙළෙහි රූපස්කන්ධය පෙණ පිඬුවකට ද වේදනාස්කන්ධය දිය බුබුළකට ද සඤ්ඤාස්කන්ධය මිරිඟුවකට ද සංස්කාරස්කන්ධය කෙසෙල් කඳකට ද විඤ්ඤාණස්කන්ධය මායාවකට ද උපමා කර ඇති බව.

(ඵේණුපිණ්ඩූපම සූත්‍රය - ස.නි. 3)

ආයතන විභාගය

- බුදුසමය තව දුරටත් පුද්ගලයා විග්‍රහ කිරීමේ දී ආයතන වශයෙන් 12කට විභාග කොට දක්වා ඇති බව.
- පුද්ගලයා යනුවෙන් හැඳින්වෙන (චක්ඛු, සෝත ආදී ) ඉන්ද්‍රිය හා ආධ්‍යාත්මික ආයතන එම ඉන්ද්‍රියයට විෂය වන රූප ශබ්දා දි අරමුණු (බාහිර ආයතන) නමින් හැඳින්වෙන බව
- නිවාසස්ථානය, උප්පත්ති ස්ථානය, කාරණය, හේතුව, සභාව රැස්වන තැන සසර දික් කිරීමට ඉවහල් වීම යන අර්ථ ''ආයතන'' ශබ්දයෙන් ප්‍රකට වන බව. (සුමංගල ශබ්ද කෝෂය)

- ආධ්‍යාත්මික ආයතන බාහිර ආයතන සමග ගැටීමෙන් පහළ වන චිත්ත, චෛතසික, සත්ත්වයා සංසාරගත කිරීම නිසා හා දිගින් දිගට ම ගමන් කරවන නිසා චක්ඛු, සෝත ආදියට ආයතන නම යොදා ඇති බව
- ආධ්‍යාත්මික හා බාහිර ආයතන පිළිබඳ ව සිහිය උපදවා ගැනීමට හා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලෙස ත්‍රිලක්ෂණානුකූල ව වැඩීමට ධර්මයෙහි ඉගැන්වෙන බව

ධාතු විභාගය

- බුදු දහම පුද්ගලයා ''ධාතු'' නමින් කොටස් හයකට ද සාධක දහඅටකට ද විභාග කොට ඇති බව
- පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස, විඤ්ඤාණ යන මූල සාධක හය ධාතු නමින් හඳුන්වා ඇති බව. (ධාතු විභංග- ම.නි.3 )
- ආයතන ලෙස ද හඳුන්වන ලද ඉන්ද්‍රියවලට හා අරමුණුවලට සවැදෑරුම් ඉන්ද්‍රිය විඤ්ඤාණය ද ඇතුළත් කොට සත්ත්වයා යන්න ධාතු 18කට පහත දැක්වෙන අයුරින් විශ්ලේෂණය කොට ඇති බව.

| ඉන්ද්‍රිය | අරමුණු | ඉන්ද්‍රිය විඤ්ඤාණය |
|---|---|---|
| චක්ඛු ධාතු | රූප ධාතු | චක්ඛු විඤ්ඤාණ ධාතු |
| සෝත ධාතු | සද්ද ධාතු | සෝත විඤ්ඤාණ ධාතු |
| ඝාණ ධාතු | ගන්ධ ධාතු | ඝාණ විඤ්ඤාණ ධාතු |
| ජිව්හා ධාතු | රස ධාතු | ජිව්හා විඤ්ඤාණ ධාතු |
| කාය ධාතු | පොට්ඨබ්බ ධාතු | කාය විඤ්ඤාණ ධාතු |
| මනෝ ධාතු | ධම්ම ධාතු | මනෝ විඤ්ඤාණ ධාතු |

- ධාතු විග්‍රහයේ දී විඤ්ඤාණය තවදුරටත් විග්‍රහ කර ඇත්තේ විඤ්ඤාණය ආත්මය ලෙස ගැනීම නිසා බව

## අටලෝ දහම

- ලාභ - අලාභ, යස- අයස, නින්දා -ප්‍රසංසා, සැප-දුක් යන ධර්මතා අටලෝ දහම වන බව.
- අටලෝ දහම ලෝක ධර්ම යැයි හඳුන්වන්නේ ලෝකයට ආවේණික වූ ධර්මතා යන අර්ථයෙන් බව
- ලාභ අලාභාදී තත්ත්වයන් හමුවේ දැඩිලෙස කම්පනයට පත් නොවන, මං මුළාවට පත් නොවන, නොසැලෙන තත්ත්වයට මනස දියුණු කළ තැනැත්තා අටලෝ දහමෙන් කම්පා නොවන බව
- අටලෝ දහමින් කම්පා නොවීම තාදි ගුණය ලෙස හැඳින්වෙන අතර එය උතුම් මංගල කාරණයක් බව (මංගල සූත්‍රය- සු.නි. )

- බුදු රජාණන් වහන්සේ මෙන් ම ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා ද අටලෝ දහම හමුවේ කම්පනයට පත් නොවුණ අවස්ථා රාශියක් ඇති බව
- නගර ද්වාරයක ඉතා ගැඹුරට පිහිටුවා ඇති ස්තම්භයක් හෙවත් සිවු දිසාවලින් හමන වාත වේගයෙන් පවා නොසැලෙන ඉන්ද්‍රකීලයක් මෙන් රහතුන් වහන්සේ අටලෝ දහමින් කම්පා නොවන බව (රතන සූත්‍රය)
- නුවණැති පුද්ගලයා සුළඟින් නොසෙල්වන ගල් පර්වතයක් සේ නින්දාවලින් හා ප්‍රශංසාවලින් නොසැලෙන බව (ධම්මපදය, පණ්ඩිත වර්ගය - ඛු.නි. 1)
- භවය හා බැඳි කිසිම දෙයක නොඇලෙන ආශාවෙන් කතා නොකරන නොකරවන රහතන් වහන්සේ දුකෙහිදී මෙන් ම සැපතෙහිදීත් කම්පනයට පත්නොවන බව.

(ධම්මපදය, පණ්ඩිත වර්ගය - ඛු.නි.1)

**ත්‍රිලක්ෂණය පිළිබඳ අවබෝධයෙන් හා අෂ්ටලෝක ධර්මයෙහි අකම්පිත වීමෙන් ගොඩනැගෙන ජීවන දර්ශනය**

- හේතු ප්‍රත්‍යය සමවායෙන් හටගත් ආනුභවික ලෝකයේ සියලු දෑ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දකින පුද්ගලයා අටලෝ දහමෙන් නොසැලෙන බව
- ත්‍රිලක්ෂණ දර්ශනයෙන් පෝෂණය වන පුද්ගලයා තුළ ලෝක ධර්මයන්ට මුහුණදීමේ ශක්තිය පිබිදී පවතින බව
- ලාභ අලාභාදි කරුණු අනිත්‍යතාව ස්වභාව කොට පවතින බව හා එම කරුණු ජීවිතයට බලපාන බව තේරුම් ගැනීම පෞද්ගලික මෙන් ම සාමූහික වශයෙන් ඇතිවන ගැටලු සමනය කර ගැනීමට උපකාර වන බව
- ජීවිත හා ලෝකය පිළිබඳ ව යථාර්ථවාදී ව දැකීම හේතුවෙන් තණ්හා, මාන, දිට්ඨි ආදියෙන් තොර නිරවුල් මනසකින් යුක්ත පුද්ගලයකු බිහි වන බව
- කෙලෙස් ප්‍රහීණ කිරීමේ අරමුණින් ආර්ය පිළිවෙතට පැමිණි පුද්ගලයා අනිත්‍ය දර්ශනය මඟින් සාමකාමී තැනැත්තකු බවට පත්වන බව.
- යථාවබෝධයෙන් ඇති කරගත් මානසික නිරෝගී බව නිසා නිදහස් හා ප්‍රබෝධවත් පුද්ගලයෙකු ලෙස නිවැරදි චරණය ප්‍රගුණ කළ හැකි බව.
- ත්‍රිලක්ෂණ මනසිකාරය නිසා පුද්ගලයා අසීමිත ආශාවෙන් තොරව, ගිජුකමින් තොරව, අවම පරිභෝජනයෙන් තෘප්තිමත්ව උපරිමය අතිරේකයක් කොට සැලකීමේ ආදර්ශය ප්‍රකට කරන බව
- ත්‍රිලක්ෂණවබෝධය ඇති පුද්ගලයා අටලෝදහම නිත්‍ය නොවන බව, සදාතන නොවන බව, විපරිණාමී බව දැන එයින් අකම්පිත ව නොසැලෙන කලබල නොවන සිත් ඇති ව වාසය කරන බව
- මැදිහත් සිත, උපේක්ෂාව, අන්තවාදී නොවීම ආදි ගුණාංග තිලකුණු දන්නා තිලකුණු මෙනෙහි කරන්නා තුළ ගොඩනැඟෙන විශිෂ්ට චරිත ලක්ෂණ බව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය ස්වභාවය පැහැදිලි කෙරෙන සූත්‍රයක සාරාංශයක් පිළියෙල කරන්න.
2. පන්ති කාමරයේ මතුවිය හැකි ගැටලුවක් ත්‍රිලක්ෂණ දර්ශනයට අනුව නිරාකරණය කර ගන්නා ආකාරය දැක්වෙන වර්තාවක් සකස් කරගන්න.
3. ඛන්ධ, ආයතන, ධාතු විභාගය දැක්වෙන ප්‍රදර්ශන පුවරුවක් නිර්මාණය කරන්න.
4. ''අටලෝ දහමින් අකම්පිත වීම ජීවිතයකට හුරු කර ගන්නේ කෙසේ ද?'' යන මැයෙන් සාකච්ඡාවක් සංවිධානය කරන්න.
5. අටලෝ දහම පිළිබඳ පැහැදිලි කෙරෙන පුවත්පත් වාර්තාවක් පිළියෙළ කරන්න.
6. ඛන්ධ, ආයතන, ධාතු විභාගය පැහැදිලි කෙරෙන පොත් පිංචක් නිර්මාණය කරන්න.

**නිපුණතාව 6.0 :** සත්ත්වයා හා ලෝකය පිළිබඳ බෞද්ධ විග්‍රහය අධ්‍යයනය කර යථාර්ථාවබෝධයෙන් යුත් සමාජ හිතකාමී දිවිපෙවෙතක් ගත කරයි.

**නිපුණතා මට්ටම 6.2 :** ජීව අජීව පරිසරයට හිතකාමීව ජීවත් වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 20 යි.

**ඉගෙනුම් පල :**

- ජීව අජීව පරිසරය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම හඳුනා ගනියි.
- පරිසරය විෂයයෙහි හිතකාමී වෙයි.
- පාසල් පරිසර සංගමයේ ක්‍රියාකාරීව කටයුතු කරයි.
- සමාජය විෂයයෙහි ඉටුකළ යුතු යුතුකම් නොපිරිහෙළා ඉටුකරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ජීව අජීව පරිසරය පිළිබඳ බෞද්ධ ආකල්පය හැඳින පරිසරයට හිතකාමීව භෞතික සම්පත් සංරක්ෂණයට සක්‍රිය ව දායක වෙමින් සමාජය තුළ සුහදතාවෙන් ජීවත්වීමට මඟපෙන්වීම මෙයින් අපේක්ෂා කෙරේ.

**විෂය අන්තර්ගතය :**

**ජීව අජීව පරිසරය කෙරෙහි දැක්විය යුතු ආකල්පය**

**ජීව පරිසරය කෙරෙහි දැක්විය යුතු ආකල්පය**

- මිනිසා සහිත මුළු සත්ත්ව ප්‍රජාව ම ''ජීව'' ශබ්දයෙන් අර්ථවත් වන බව
- ඇසට නොපෙනෙන ජීවීන්ගේ පටන් සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රිය දැක්වීම, හිතානුකම්පී වීම, ඔවුන්ගේ සුවසෙත කැමති වීම, බෞද්ධ පිළිවෙත බව.
(මෙත්ත සූත්‍රය- සු.නි.)
- සියලු ම ජීව කොට්ඨාසයන් මවක තම එකම පුතු රැක ගන්නාක් මෙන් ආරක්ෂා කළ යුතු යැයි බුදු දහමේ ඉගැන්වෙන බව. (මෙත්ත සූත්‍රය - සු.නි.)
- ප්‍රාණඝාතය හැර, ඉන් වෙන්ව, දඬු මුගුරු, අවි ආයුධ භාවිතයෙන් වැළකී, පවෙහි ලජ්ජා ඇති ව සියලු සතුන් කෙරෙහි දයාවෙන්, හිතවත් බවින් හා අනුකම්පාවෙන් වාසය කිරීම ශීල ශික්ෂණයේ පළමු පියවර බව. (සාමඤ්ඤඵල සූත්‍රය-දී.නි. 1.)
- සියලු සතුන්ට දයාවෙන් යුක්ත ව දඬුවමෙන් වියුක්ත ව ජීවත් වන ශ්‍රමණයා නියම භික්ෂුවකයැයි ධර්මයේ සඳහන් වන බව. (ධම්මපදය, දණ්ඩ වර්ගය- ඛු.නි.1)
- තමා උපමා කොට කිසිවකුට හිංසා, පීඩා නොකළ යුතුය යන්න බුදු දහමේ වැදගත් ඉගැන්වීමක් වන අතර අත්තූපනායික ධම්මපරියායෙන් කෙරෙන්නේ ද එබඳු මඟපෙන්වීමක් බව.
- වෛදික බ්‍රාහ්මණ සම්ප්‍රදායානුගත යාගය ශාක මෙන් ම සත්ත්ව ජීවිතවලට ද ඉමහත් හානියක් කළ බැවින් බුදු රජාණන් වහන්සේ එම ආගමික පිළිවෙත ඉතා අදැහැමි විනාශකාරී වූවාක් සේ සලකා ප්‍රතික්ෂේප කළ බව

- ශාක හා සත්ත්ව ජීවිත ආරක්ෂා කිරීම, ආරක්ෂා වන පරිදි ක්‍රියා කිරීම පාලකයකු සතු වගකීමක් ලෙස බුදුසමය පෙන්වා දෙන බව. (චක්කවත්තිසීහනාද සූත්‍රය- දී.නි. 3 )
- පාලකයකු ප්‍රදේශ, රාජ්‍ය දිනන්නේ යුද්ධමය හා ආර්ථිකමය ආක්‍රමණය කිරීමක් වශයෙන් නොව ජීව හිතකාමී පංචසීල සදාචාරය පිළිගැනීමක් වශයෙන් විය යුතු බව (චක්කවත්තිසීහනාද සූත්‍රය- දී.නි. 3)
- පඤ්චසීලය ආරක්ෂා කිරීමෙන් එකිනෙකාගේ ජීවිත සුරක්ෂිත කරන, සෑමදෙනාගේ දේපළ හා පවුල් ජීවිතවල ශිෂ්ට බව ආරක්ෂා කරන, ප්‍රිය ජනක සත්‍ය වචන කථා කරන ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන් තොර ජීවහිතකාමී සාමකාමී සමාජ පරිසරයක් නිර්මාණය වන බව
- සියලු ප්‍රජාව විෂයයෙහි සතර බ්‍රහ්ම විහාර වැඩීම පුද්ගලයාගේ මෙන් ම සමාජයේ ද යහපතට හේතුවන බව

**අජීව පරිසරය කෙරෙහි දැක්විය යුතු ආකල්පය**

- අජීව පරිසරය යන්නෙන් අහස, ජලය, වාතය, මහපොළොව ආදි ස්වභාවික භෞතික සම්පත් හා ශක්ති අදහස් වන බව
- භෞතික පරිසරය මිනිස් ජීවිතය කෙරෙහි බලපාන වැදගත් සාධකයක් බව
- නූතන මිනිසා විද්‍යාත්මක ඥානයෙන් පෝෂණය වීම හා නව තාක්ෂණ භාවිතය නිසා ජීව මෙන්ම අජීව පරිසරයේ පැවැත්ම පිළිබඳ අභියෝග රාශියකට මුහුණ දී ඇති බව
- වෛදික ජනයා හිරු, සඳු වැස්ස, මාරුතය, ගින්න, වායුව, විදුලිය, හිම්දිරිය ආදි ස්වාභාවික ශක්තිවලට හා සම්පත්වලට දේවත්වය ආරෝපණය කර පුද පූජා පැවැත්වූ අතර ඔවුන් ස්වභාව ධර්මයත් සමග සමීපතම දිවි පෙවෙතක් ගෙවූ බව
- මිනිසා හා පරිසරය අතර පැවතිය යුතු අන්‍යෝන්‍ය උපකාරිත්වය පිළිබඳ ප්‍රමාණවත් අවදිකමක් බුද්ධ දේශනාවන්ගෙන් ප්‍රකට වන බව
- බුදු දහමේ ස්වභාව නීතිය අදහස් කිරීම සඳහා ''ධම්මතා'', ''ධම්ම විභවතා'' යන යෙදුම් භාවිත වන බව
- මිනිසාගේ හැසිරීම් රටාවන් පරිසරය කෙරෙහි ද පාරිසරික ක්‍රියාකාරිත්වයන් මිනිස් ජීවිතය කෙරෙහි ද අන්‍යෝන්‍ය ව බලපාන ආකාරය සූත්‍ර දේශනාවල දැක්වෙන බව. (අග්ගඤ්ඤ සූත්‍රය-දී.නි. 3, අධම්මික සූත්‍රය-අ.නි.2 )
- පඤ්චනියාම ධර්ම වෙතින් මිනිස් ජීවිතය හා ලෝකය විෂයයෙහි ක්‍රියාත්මක වන විවිධ ස්වභාවික පාරිසරික නියමයන් පිළිබඳ විද්‍යාත්මක ඉගැන්වීමක් ප්‍රකට කරන බව
- වන විනාශය, ජල දූෂණය, වායු දූෂණය, වැළැක්වීමට හා තුරුලතා රක්ෂණයට හා පෝෂණය කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග රාශියක් සූත්‍ර දේශනාවල දැක්වෙන අතර එවැනි අනුශාසනා කිහිපයක් පහත දැක්වෙන බව
- ගස සියලු ජීවීන්ට අයිති පොදු සම්පතක් වන අතර එය විනාශ කර දැමීම මහත් ආත්මාර්ථකාමී ක්‍රියාවක් බව (මහාවග්ගපාළිය IV )
- ගසකින් කඩාගත් ඉදුණු පලතුරක් අනුභව කර එහි ඇතුළේ ඇති බීජය විනාශ නොකොට පරිසරයට එකතු කළ යුතු බව

- ශාක ලෝකයෙහි මුලින්, කදෙන්, පුරුක්වලින්, දල්ලෙන් හා ඇටවලින්, පැළවෙන බීජ වර්ග විනාශ කිරීමෙන් වැළකී සිටීම සම්‍යක් දෘෂ්ටික පුද්ගලයාගේ ශීලයට අයත් වන බව (සාමඤ්ඤඵල සූත්‍රය - දී.නි.1)
- නිල් තණ මතට රොඩු, කුණු, ඉඳුල්, හප, ඇට ආදිය දැමීම ද ජලයෙහි මලමූත්‍රා පහ කිරීම, කෙළ ගැසීම භික්ෂුවක විසින් නොකළ යුත්තක් හෙවත් ඇවැතක් බව. (පාචිත්තිය පාලිය හා භික්ඛු විභංගය)
- පානීය හා පාරිභෝජනීය ජලය සමීපයෙහි සෙනසුන් ඉදි නොකළ යුතු යැයි පණවා ඇති බව. (චුල්ලවග්ග පාලිය - වත්තක්ඛන්ධකය)

- බුදු රජාණන් වහන්සේ පරිසරයේ පවිත්‍රත්වය, ආරක්ෂාව මෙන් ම එහි සෞඛ්‍ය සම්පන්න බව ද අලංකාරය ද අගය කර ඇති බව. (චුල්ලවග්ග පාලිය - වත්තක්ඛන්ධකය)

- බුදු රජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට භාවනා කිරීමට සුදුසු ම ස්ථානයක් වශයෙන් ස්වාභාවික පරිසරය අනුමත කොට උන් වහන්සේ ද පරිසරයෙන් ලැබෙන උතුම් විරාගික ආස්වාදය අගය කළ බව. (අරියපරියේසන සූත්‍රය - ම.නි. 1)
- භෞතික පරිසරය කෙරෙහි සුහද මිත්‍රශීලි හා සංවේදී ආකල්පයක් ඇතිකර ගැනීම පුද්ගලයාගේ චරිත සංවර්ධනයට ඉවහල් වන බව.
- අපිස් පැවැත්මක් ඇති පුද්ගලයා බඹරකු වර්ණය ද සුගන්ධය ද නොපෙළා මලෙහි රොන් රසය පමණක් උරා ගන්නාක් මෙන් පාරිසරික සම්පත් භාවිත කරන බව (ධම්මපදය - පුප්ඵ වග්ගය - ඛු.නි. 1)
- පරිසරය දූෂණය කිරීමෙන් හා විනාශ කිරීමෙන් වැළකී ආරක්ෂා කිරීම සත්ත්වයාගේ යහපත් දිවිපැවැත්මට අත්‍යවශ්‍ය සාධකයක් බව

**අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම්**

- විවිධ මානව සබඳතා ඔස්සේ සාමකාමී, සාමූහික යහපත් සමාජ පරිසරයක් පවත්වාගෙන යාමට අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් වැදගත් වන බව.
- පඤ්චසීල ප්‍රතිපදාව, සිවුබඹ විහරණ, සිවු සඟරාවත් ආදී බෞද්ධ ඉගැන්වීම්වලින් අන්‍යෝන්‍ය යුතුකම්වල හා වගකීම්වල ආධ්‍යාත්මික හා චර්යාමය ස්වරූපය ප්‍රකට කරන බව.
- ඒ ඒ සමාජ මෙන් ම කොටස් එකිනෙකාට යුතුකම් හා වගකීම් ඉටු කිරීමෙන් යහපත් සහසම්බන්ධතාවෙන් යුතු ධාර්මික සමාජයක් ගොඩනැගෙන බව
- පුද්ගලයන් අතර සම්බන්ධය සුරක්ෂිත ව හා ඵලදායක ව පැවැත්වීමට උපකාරී වන යුතුකම් හා වගකීම් සිගාලෝවාද සූත්‍රයේ සදිසානමස්කාරයෙන් පැහැදිලි කෙරෙන බව
- යුතුකම් හා වගකීම් අවබෝධයෙන් යුතු ව ක්‍රියාවට නැඟීමෙන් අන්‍යෝන්‍ය ආදරය, ගෞරවය, විශ්වාසය ආදී බොහෝ දෑ සාධනය වන බව
- එකිනෙකාගේ වගවීම හා වගකීම අවබෝධයෙන් යුතු ව ක්‍රියාවට නැඟීමෙන් එකිනෙකට හිතවාදී සමාජයක් බිහි කර ගත හැකි බව.
- අන්‍යෝන්‍ය ප්‍රියභාවය, ගෞරවය, සංග්‍රහශීලීත්වය, විවාද විරහිතභාවය, සමගිය හා සහජීවනය යනාදි ගුණධර්ම සංවර්ධනයට උපයුක්ත වන සාමීචි ධර්ම භික්ෂු ජීවිතයේ සංවර්ධනයට උපකාරී වී යැයි පෙන්වා දී ඇති බව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. ජීව පරිසරය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරන්න.
2. අජීව පරිසරය පිළිබඳ පැහැදිලි කෙරෙන බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න.
3. ජීව අජීව පරිසරය පිළිබඳ ඉගැන්වීම් ඇතුළත් ත්‍රිපිටක සූත්‍රාගත කරුණු ඇසුරෙන් ප්‍රදර්ශන පුවරුවක් නිර්මාණය කරන්න.
4. අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් පැහැදිලි කෙරෙන සාකච්ඡා වටයක් සංවිධානය කරන්න.
5. ඔබ පාසල් පරිසර සංගමයේ සභාපති යැයි සිතා ක්‍රියාකාරකම් පිළිබඳ සැලැස්මක් පිළියෙළ කරන්න.
6. අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් යන මැයෙන් බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.

**පරිශීලනයට :**

- සාමඤ්ඤඵල සූත්‍රය - දීඝ නිකාය
- කූටදන්ත සූත්‍රය - දීඝ නිකාය
- සිගාලෝවාද සූත්‍රය - දීඝ නිකාය
- චක්කවත්තිසීහනාද සූත්‍රය - දීඝ නිකාය
- චූලසච්චක සූත්‍රය - මජ්ඣිම නිකාය
- අරියපරියේසන සූත්‍රය - මජ්ඣිම නිකාය
- කෝසම්බිය සූත්‍රය - මජ්ඣිම නිකාය
- රට්ඨපාල සූත්‍රය - මජ්ඣිම නිකාය
- ආනෙඤ්ජසප්පාය සූත්‍රය - මජ්ඣිම නිකාය
- ලෝක සූත්‍රය - සංයුත්ත නිකාය
- සේල සූත්‍රය - සංයුත්ත නිකාය
- අනත්ත ලක්ඛණ සූත්‍රය - සංයුත්ත නිකාය
- මහාලි සූත්‍රය - සංයුත්ත නිකාය
- අජ්ඣත්තානිච්ඡ සූත්‍රය - සංයුත්ත නිකාය
- ධම්මචක්කප්පවත්තන සූත්‍රය - සංයුත්ත නිකාය
- තිකනිපාතය, චූල්ලවග්ගය - අංගුත්තර නිකාය

- මහාවග්ගය - අංගුත්තර නිකාය
- ධම්මපදය, මග්ග, අරහත්ත, පණ්ඩිත දණ්ඩ වග්ග - ඛුද්දක නිකාය
- මෙත්ත සූත්‍රය - සුත්ත නිපාතය
- මහාමංගල සූත්‍රය - සුත්ත නිපාතය
- බෞද්ධ දර්ශනය හා චරණය - ඩබ්.එස්. කරුණාරත්න
- ආදි බෞද්ධ දර්ශනය මූලධර්ම විග්‍රහයක් - සුමනපාල ගල්මංගොඩ
- බුදුදහම හා පරිසරය - දේවාලේගම මේධානන්ද හිමි
- බෞද්ධ අධ්‍යයන මීමංසා - දේවාලේගම මේධානන්ද හිමි

**නිපුණතාව 7.0** : සත්‍යය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් තම ජීවන දර්ශනය ගොඩනගා ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 7.1** : ජීවන ගැටලු විසඳීමෙහිලා චතුරාර්ය සත්‍යයේ උපයෝගීතාව වටහාගෙන අන්තගාමීත්වයෙන් තොරව කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 25 යි.

**ඉගෙනුම් පල** :

- චතුරාර්ය සත්‍යය විවරණය කරයි.
- අන්තගාමීත්වය බැහැර කළ යුතු බව පිළිගනියි.
- මැදුම් පිළිවෙත සිය ජීවන දර්ශනය කර ගනියි.
- ජීවිතයේ යාථාර්ථය පිළිබඳ අවදිකමින් ජීවත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**
අන්තගාමී නොවී චතුරාර්ය සත්‍යය ඇසුරින් ජීවන ගැටළු විසඳා ගැනීමටත්, ජීවිතයේ යථාර්ථය පිළිබඳ අවදිකමින් කටයුතු කිරීමටත් ශිෂ්‍යයන් යොමු කිරීම මෙමඟින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**චතුරාර්ය සත්‍යය**

- චතුරාර්ය සත්‍යය යනු,
  - දුක්ඛ ආර්ය සත්‍යය
  - දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
  - දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය
  - දුක්ඛ නිරෝධ ගාමිණීපටිපදා ආර්ය සත්‍යය බව

(ධම්මචක්කප්පවත්තන සූත්‍රය. ස.නි.5.2)

- ආර්ය සත්‍යය ලෙස හඳුන්වන්නේ බුදු, පසේබුදු, මහරහත් යන ආර්යයන් වහන්සේලා අවබෝධ කරගත් නිසා බව.
- එබැවින් මෙහිදී ''ආර්ය'' යන පදය අත්හැර ව්‍යවහාර කිරීම නුසුදුසු බව
- චතුරාර්ය සත්‍ය දේශ, කාල, ජාති වශයෙන් වෙනස් නොවන සදාතන යථාර්ථය වන බව.
- සත්‍යය අවබෝධ කිරීමෙන් සෝවාන් ආදි ආර්ය භාවයට පත්වන බව
- දුක්ඛාර්ය සත්‍යය, එනම් සසර දුක අවබෝධ කරගත යුතු ය. (පරිඤ්ඤෙය)
- දුක්ඛසමුදයාර්ය සත්‍යය එනම් දුකෙහි හටගැන්ම හෙවත් තණ්හාව දුරු කළ යුතු ය.(පහාතබ්බ)
- දුක්ඛ නිරෝධාර්ය සත්‍යය එනම් නිර්වාණය අත්දැකීමෙන් ම පසක් කළ යුතු ය. (සච්චිකාතබ්බ)

| | | |
|---|---|---|
| පරිඤ්ඤෙය්‍ය | - | ලෝකයේ ඇත්ත ඇති සැටියෙන් දැකීම |
| පහාතබ්බ | - | දුරු කළ යුතු දේ දුරු කිරීම |
| භාවේතබ්බ | - | වැඩි යුතු දේ වැඩීම |
| සච්චිකාතබ්බ | - | නිවන සාක්ෂාත් කිරීම බව |

(ධම්මචක්කප්පවත්තන සූත්‍රය ස.නි.5.2)

- දුක්ඛ නිරෝධගාමිනී පටිපදා සත්‍ය එනම් දුකින් මිදීමේ මග හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩිය යුතු ය. (භාවේතබ්බ)
- බුදු දහමේ ප්‍රධාන ම ඉගැන්වීම චතුරාර්ය සත්‍ය වන බව
- බුදු රජාණන් වහන්සේ වදාළ සමස්ත ධර්මය ම චතුරාර්ය සත්‍යයේ ඇතුළත් බව

(මහාහත්ථි පදෝපම සූත්‍රය- ම.නි.1)

- බුදු රජාණන් වහන්සේගේ පළමු ධර්මදේශනයෙන් ම චතුරාර්ය සත්‍යය ප්‍රකට කළ බව
- කාමසුඛල්ලිකානු යෝගය හා අත්තකිලමථානුයෝගය යනු සේවනය නොකළ යුතු අන්ත දෙකක් වන බව
- බුදු රජාණන් වහන්සේ එම අන්ත දෙකෙහි නිසරු බව දැක ඉන් මිදී මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළ බව
- මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීමෙන් චතුරාර්ය සත්‍යය අවබෝධ කළ හැකි බව
- චතුරාර්ය සත්‍යය අවබෝධයෙන් දුකින් මිදි නිවන පසක් කළ හැකි බව

(ධම්මචක්කප්පවත්තන සූත්‍රය ස.නි.5.2)

**දුක්ඛ ආර්ය සත්‍යය**

- චතුරාර්ය සත්‍යයේ පළමුවැන්න දුක්ඛ ආර්ය සත්‍යය බව
- පාලි ''දුක්ඛ'' යන්නෙන් දුක පිළිබඳ මතුපිට අර්ථයක් හා ගැඹුරු අර්ථයක් ප්‍රකාශ වන බව
- නොසතුට, හැඬීම, වැලැපීම, කණගාටුව, වේදනාව ආදිය දුක්ඛ යන්නෙහි මතුපිට අර්ථය බව
- වෙනස්වීම, අනිත්‍යතාව නිසා උපදින අසාරත්වය, අතෘප්තිකරත්වය, තුච්ඡතාව, අපරිපූරණත්වය දුකෙහි ගැඹුරු අර්ථය වන බව
- ඉපදීම, මහලුවීම, ලෙඩවීම, මරණය, අප්‍රියයන් හා එක්වීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම, කැමති දේ නොලැබීම, සැකෙවින් කියතොත් පඤ්චඋපාදානස්කන්ධය මෙන් ම ශෝක කිරීම, වැලපීම, දුක දොම්නස, උපායාසය ආදි මිනිස් ජීවිතයට උරුම වී ඇති අප්‍රසන්න අත්දැකීම් දුක් යන්නෙන් ප්‍රකාශ වන බව
- ''දුක්ඛ දුක්ඛතා (ව්‍යාවහාරික දුක හෙවත් ජාති ජරා ව්‍යාධි මරණාදිය) සංඛාර දුක්ඛතා (හේතු ප්‍රත්‍යාකාරයෙන් ඇති වන දුක) විපරිණාම දුක්ඛතා, (වෙනස්වීම නිසා ඇති වන දුක) '' යනුවෙන් දුක ප්‍රභේද තුනකින් යුක්ත බව (දුක්ඛතා සූත්‍රය ස.නි5.1.)
- පීළනට්ඨ - (පීඩනට්ඨ) - පීඩාගෙනදෙන අර්ථයන්

  සංඛතට්ඨ - හේතු ප්‍රත්‍යයයන්ගෙන් හටගන්නා අර්ථයන්

  සංතාපට්ඨ - විවිධ වූ තැවීම් ඇති කරන අර්ථයන්

  විපරිණාමට්ඨ - නිරන්තර වෙනස්වීම් ඇත යනුවෙන් දුක්ඛ සත්‍යයේ අර්ථ සතරක් ඇති බව

**දුක්ඛ සමුදය ආර්ය සත්‍යය**

- සං + උ + අය > සමුදය - ''සං'' යනු එකතු වීමයි. '' උ'' යනු ඉපදීමයි. '' අය'' යනු හේතුවයි. එනම් ස්කන්ධයන් එකට එකතුවීම හෙවත් ඉපදීමට හේතුව සමුදය නම් වන බව
- දෙවන ආර්ය සත්‍යය වන දුක්ඛ සමුදය ආර්ය සත්‍යයෙන් දුක හට ගැනීම, දුකට හේතුව ඉගැන්වෙන බව

- පුනර්භවය ඇති කරවන, ඒ ඒ භවයන් කෙරෙහි සිත අලවා තැබීම නම් වූ නන්දිරාගයෙන් යුක්ත කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යන ත්‍රිවිධ තෘෂ්ණාව දුකට හේතු වන බව
- පසිඳුරන් පිනවීම හෙවත් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පඤ්චකාමයෙහි ඇති කැමැත්ත කාම තණ්හා නම් වන බව
- නිත්‍ය ආත්මයක් හෙවත් ස්ථිර පැවැත්මක් තුළ කම්සැප විඳීමට ඇති කැමැත්ත හෙවත් ශාස්වත දෘෂ්ටියෙන් උපදනා තෘෂ්ණාව භව තණ්හාව නම් වන බව
- පඤ්චස්කන්ධ හා ඒ හා බැඳුණු කාමයන් මෙතනින් අවසන් ය මරණින් මතු උපතක් නැතැයි යන උච්ඡේද දෘෂ්ටි වශයෙන් ඇති වන්නේ විභව තණ්හාව බව
- සියල්ල මරණයෙන් කෙළවර වී යැයි පිළිගෙන උච්ඡේදවාදී ව නැවත නොඉපදීමට ඇති කැමැත්ත විභව තණ්හාව නම් වන බව

**දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය**

- නි + රෝධ (නිරෝධ) - රෝධ යනු සිරගෙය යි. සසර නැමැති සිරගෙයින් මිදීම නිරෝධ නම් වන බව
- නිරෝධය හෙවත් නිවන තමා ම දුන දැක පසක් කළ යුක්තක් බව (සච්චිකාතබ්බ)
- එකී විමුක්තිය ප්‍රත්‍යෙක වශයෙන් හෙවත් වෙන් වෙන් ව හිඳ උදාකර ගත යුත්තක් බව (පච්චත්තං වේදිතබ්බ)
- දුක්ඛ සමුදය නම් වූ තෘෂ්ණාව සහමුලින් ම උපුටා දැමීම, ඉන් මිදීම, නො ඇලීම දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය වන බව. (ධම්මචක්කප්පවත්තන සූත්‍රය- ස.නි.5.2)
- සියලු ආශ්‍රව ධර්ම ඉතිරි නොකොට ක්ෂය කිරීමෙන් හෙවත් අසේස විරාග නිරෝධය ම නිවන වන බව
- අජාත, අභූත, අකත,අසංකත ආදී නිෂේධාර්ථවත් පදවලින් දහමෙහි නිවන හඳුන්වා ඇති බව (මහා සතිපට්ඨාන සූත්‍රය - දී.නි.2)

**දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය**

- දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය යනු දුකින් මිදීමේ මාර්ගය බව
- කාමසුඛල්ලිකානු යෝගයට සහ අත්තකිලමථානුයෝගයට නොවැටෙන බැවින් එය ම මධ්‍යම ප්‍රතිපදාව වන බව
- ආර්ය අෂ්ටාංගික මාර්ගය ඉන් අදහස් වන බව
- එය ප්‍රායෝගිකව අනුගමනය කළ යුතු වැඩිදියුණු කළ යුතු පිළිවෙතක් වන බව
- සම්මා දිට්ඨි යන්නෙන් මූලික වශයෙන් චතුරාර්ය සත්‍ය ඥානය අදහස් වන බව
- සම්මා සංකප්ප යන්නෙන් අදහස් වන්නේ නිවැරදි කල්පනාව හෙවත් කාම, ව්‍යාපද, විහිංසා සංකල්පනාවන්ගෙන් මිදීම නම් වූ,

  නෙක්ඛම්ම සංකප්ප - කාම සංකල්පනයන්ගෙන් වෙන්වී නිස්කාමී සංකල්පනාවෙන් යුක්ත බව

  අව්‍යාපාද සංකප්ප - ව්‍යාපාද කල්පනාවන්ගෙන් වෙන්වීම

  අවිහිංසා සංකප්ප - හිංසාකාරී කල්පනාවන්ගෙන් වෙන්වී මෛත්‍රිය සහගත කල්පනා වැඩිදියුණු කිරීම බව

* සම්මා වාචා යනු මුසාවාදා, පිසුනාවාචා, ඵරුසාවාචා, සම්ඵප්පලාප යන වාග් දුශ්චරිතයන්ගෙන් වෙන් ව වාග් සුචරිතය වැඩීම වන බව
* සම්මා කම්මන්ත යනු ප්‍රාණඝාත, අදත්තාදාන කාම මිථ්‍යාචාර යන ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන් වැළකී කාය සුචරිතය වැඩීම වන බව
* සම්මා වායාම යනු

    නූපන් අකුසල් නො ඉපදවීමට වෑයම් කිරීම

    උපන් අකුසල් දුරු කිරීමට වෑයම් කිරීම

    නූපන් කුසල් ඉපදවීමට වෑයම් කිරිම

    උපන් කුසල් වැඩිදියුණු කිරීමට වෑයම් කිරීම යන සතර සම්‍යක් ප්‍රධන් වීර්ය වන බව

* සම්මා සති යනු

| | | |
|---|---|---|
| කායානුපස්සනා | - | කය පිළිබඳ සිහිය පිහිටුවා ගැනීම. |
| වේදනානුපස්සනා | - | සුඛ, දුක්ඛ, උපෙක්ඛාදී වේදනාව පිළිබඳ සිහිය පිහිටුවා ගැනීම. |
| චිත්තානුපස්සනා | - | සිතේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සිහිය පිහිටුවා ගැනීම |
| ධම්මානුපස්සනා | - | සත්තිස්බෝධිපාක්ෂික ධර්ම පිළිබඳ සිහිය පිහිටුවා ගැනීම |

යන සතර සතිපට්ඨාන වැඩීම බව. (මහාසතිපට්ඨාන සූත්‍රය - දී.නි.2)

* සම්මා සමාධි යනු රූපධ්‍යාන වඩා පංච නීවරණ යටපත් කොට සිත සමාධිගත කර ගැනීම බව
* විතක්ක, විචාර, පීති, සුඛ ඒකග්ගතා සහිත පඨමධ්‍යාන සිත, පීති, සුඛ, ඒකග්ගතා සහිත ද්විතීයධ්‍යාන සිත, සුඛ, ඒකග්ගතා සහිත තෘතීය ධ්‍යාන සිත, උපේක්ඛා ඒකග්ගතා සහිත චතුර්ථධ්‍යාන සිත යනු රූපධ්‍යාන සතර බව
* කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්චකුක්කුච්ඡ, පංචනීවරණ වන බව
* නිවන්මඟට පිවිසීමට අවශ්‍ය චිත්තඒකග්‍රතාව හා චිත්ත පාරිශුද්ධය සමාධියෙන් ගොඩනැගෙන බව
* ත්‍රිශික්ෂාව ආර්ය අෂ්ටාංගය අර්ථවත් කරන බව
* ඒ අනුව

    සම්මා වාචා

    සම්මා කම්මන්ත

    සම්මා ආජීව යන මාර්ගාංග ශීල ශික්ෂාවට ද,

    සම්මා වායාම

    සම්මා සති

    සම්මා සමාධි යන මාර්ගාංග සමාධි ශික්ෂාවට ද,

    සම්මා දිට්ඨි

    සම්මා සංකල්ප යන මාර්ගාංග ප්‍රඥා ශික්ෂාවට ද අයත් වන බව

(මහාචත්තාරීසක සූත්‍රය- ම.නි.3)

- ආර්ය අෂ්ටාංග මාර්ගයෙන් සේඛ පටිපදාව ප්‍රකට වන බව
- මෙය සම්මා ඤාණ, සම්මා විමුක්ති අංග සම්පූර්ණවීමෙන් අර්හත්වය ප්‍රකට වන බව (දසංග සමන්නාගතො අරහතොහොති)

(මහා චත්තාරීසක සූත්‍රය .ම.නි.)

**කාමසුඛල්ලිකානු යෝගය, අත්තකිලමථානුයෝගය හා මධ්‍යම ප්‍රතිපදාව**

- පස්කම් සැපතෙහිම ගිජුව කාමභෝගී ජීවිතය ම උතුම් කොට සැලකීම කාමසුඛල්ලිකානුයෝගය නම් වන බව
- ලෞකික සැප විඳීමෙන් ම ලෝකෝත්තර සැපයට ළඟාවිය හැකිය යන පිළිගැනීම මීට පාදක වී ඇති බව (දේවදහ සූත්‍රය-ම.නි.3)
- සියල්ල මරණයෙන් කෙළවර වේය යන උච්ඡේද දෘෂ්ටිය නිසා කාමසුඛල්ලිකානු යෝගය මතුවන බව
- නිත්‍ය වූ ආත්මයක් ඇත යන ශාස්වත දෘෂ්ටිය අත්තකිලමථානුයෝගයට පදනම වූ බව
- බුදු රජාණන් වහන්සේ විසින් මෙය පහත් ය, නොදියුණු ය, පුහුදුන් ස්වභාව ඇත්තේ ය, අනාර්යය, අවැඩදායක යයි බැහැර කරන ලද බව
- ශරීරය අධික ලෙස පීඩාවට පත් කිරීම අත්තකිලමථානු යෝගය බව
- දුක් විඳීමෙන් ම උතුම් සැපය ලැබිය හැකි ය යන්න මීට පාදක වී ඇති බව
- ආහාර සහ ඉරියවු මුල්කොට ගත් කටුක ව්‍රත මෙන් ම තිරිසන් සතුන් අනුකරණය කළ ව්‍රත ද අත්තකිලමථානු යෝගයේ ප්‍රායෝගිකත්ව අංශ වූ බව
- තථාගතයන් වහන්සේ මෙය දුක් සහිතය, අනාර්යය, අවැඩදායක යැයි බැහැර කළ බව
- මධ්‍යම ප්‍රතිපදාව මෙම අන්ත දෙකට ම නොවැටෙන බව
- එය ම ආර්යඅෂ්ටාංගික මාර්ගය වන බව
- එයින් දුක්ඛ නිරෝධගාමිනී පටිපදාව හෙවත් නිවන් මඟ කියවෙන බව

(ධම්මචක්කප්පවත්තන සූත්‍රය - ස.නි.5.2)

**චතුරාර්ය සත්‍යය ඇසුරෙන් ගොඩනැඟෙන ජීවන දර්ශනය**

- ඕනෑ ම ජීවන ගැටලුවක් හෝ සමාජ ගැටලුවක් හැඳෑරීමට ඊට තුඩුදෙන හේතු සෙවීමට විසඳුමක් දැකීමට මෙන්ම විසඳුම වෙත යන මාර්ගය අනුගමනය කිරීමට ද අදාළ ආදර්ශය චතුරාර්ය සත්‍ය දේශනාවෙන් ලැබෙන බව
- සසර දුක හෙවත් මිනිස් ජීවිතයේ යථාර්ථය දුකින් මිදීම හෙවත් මිනිසාගේ විමුක්තියත් චතුරාර්ය සත්‍යයේ ඇතුළත් බව
- ඒ අනුව ජීවිතයේ යථාර්ථය දැන දැක පසක් කොට එයට මුහුණ දි ගැටලු විසඳා ගැනීමට මෙයින් මඟපෙන්වන බව
- තෘෂ්ණාව පාලනය කර ගනිමින් අල්පේච්ඡා ව ප්‍රීතිමත් ව ජීවත් වීමට මෙයින් මඟපෙන්වන බව
- අන්තගාමීත්වයෙන් තොර මධ්‍යස්ථ ජීවන දර්ශනයකට මෙය මඟ පෙන්වන බව
- ආර්යඅෂ්ටාංගික මාර්ගය ප්‍රායෝගික ජීවන ප්‍රතිපදාවක් වන බව

(ධම්මචක්කප්පවත්තන සූත්‍රය . ස. නි.5.2)

## ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ලෞකික හා ලෝකෝත්තර උපයෝගීතාව

### ලෞකික උපයෝගීතාව

| | |
|---|---|
| සම්මා දිට්ඨි<br>සම්මා සංකප්ප | ප්‍රඥා |
| සම්මා වාචා<br>සම්මා කම්මන්ත<br>සම්මා ආජීව | සීල |
| සම්මා වායාම<br>සම්මා සති<br>සම්මා සමාධි | සමාධි |

යනු ආර්ය අෂ්ටාංගික මාර්ගය වන බව

- මෙම ආර්ය අෂ්ටාංගික මාර්ගය විමුක්තිය සඳහා ඒකායන මාර්ගය වුව ද ලෞකික ප්‍රතිඥා වඩන ගිහියන්ගේ ද මාර්ගය වන බව.
- මෙම මාර්ගයේ මුල් අංග පහ සම්මා ආජීවය තෙක් ලෞකික ප්‍රතිපදාව සමඟ සෘජුව ම සම්බන්ධ බව. (මහාචත්තාරීසක සූත්‍රය - ම.නි. 3)
- ලෞකිකත්වයෙහිලා සම්මා දිට්ඨිය යන්නෙන් දසවැදෑරුම් සම්මා දිට්ඨිය අර්ථවත් වන බව. (දුන් දෙයෙහි විපාක ඇත, පරිත්‍යාගයෙහි විපාක ඇත, පූජාවෙහි විපාක ඇත, හොඳ නරක ක්‍රියාවන්ගේ විපාක ඇත. මෙලොව ඇත, පරාලොව ඇත, මව ඇත, පියා ඇත, ඕපපාතික සත්ත්වයෝ ඇත, මෙලොව පරලොව දත් නිවැරදි මඟෙහි පිළිපන් මහණ බමුණෝ ඇත.)
- කාම, ව්‍යාපාද, විහිංසා සංකල්ප අවම කර ගැනීමත් කාය, වචී, දුශ්චරිතයෙන් තොරවීමත් මුසාවාදා, පිසුනාවාචා, පරුෂාවාචා, සම්පප්ඵලාපා යන වචී දුෂ්චරිතයෙන් තොරවීමත් ප්‍රාණඝාත අදත්තාදාන කාමමිච්ඡාචාර යන කාය දුශ්චරිතයෙන් ඈත්වීමත් සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත යන අංගයන්ගෙන් උගන්වන බව (මහා චත්තාරීසක සූත්‍රය -ම.නි.3)
- සම්මා ආජීව යන්න ලෞකික ප්‍රතිපදාවට අනුව විග්‍රහ කිරීමේ දී අධාර්මික ජීවනෝපායෙන් වැළකී කෘෂිකර්මාන්තය ආදී ධාර්මික ජීවන වෘත්තියක යෙදිය යුතු බව.
- වීර්ය අධිෂ්ඨානය මෙන්ම සතිසම්පජඤ්ඤය ද ගෘහස්ථ ප්‍රතිපදාවෙන් සාර්ථකත්වය අත්වන බැවින් ආර්ය මාර්ගයේ ඉතිරි අංග තුන ද ඉන් බැහැර නොවන බව
- පස්පව් දස අකුසල්වලින් වැළකුණු ගෘහස්ථ කාමභෝගී ශ්‍රාවක පිරිස උපාසක උපාසිකා නම් වන බව
- අඬදබර, ගැටුම්, කෝලාහල, සමාජ ගැටුම්, සමාජ විරෝධි ක්‍රියා ආදියෙන් තොර සදාචාර සම්පන්න සමාජයක් සම්මා ආජීවයෙන් නිර්මාණය වන බව

- ආර්ය මාර්ගය අනුගමනය කිරීමෙන් තෘප්තිමත් ජීවිතයකට මඟපෙන්වන බව

(පත්තකම්ම සූත්‍රය -අ.නි.2)

- යහපත් ජීවනෝපායක නියැළීමටත් වංචනික නොවී සාධාරණ ලාභ ඉපයීමටත් ආර්ථික සමෘද්ධියෙන් යුක්තව නොමුළාව පස්කම් සුව අනුභව කරමින් තෘප්තිමත් ලෞකික ජීවිතයක් පවත්වාගෙන යාමට ආර්ය මාර්ගය ගිහියාට මඟ පෙන්වන බව (අරියවංස සූත්‍රය-අ.නි.2)

**ලෝකොත්තර උපයෝගීතාව**

- කෙලෙසුන් නසා නිවන් අවබෝධ කිරීම ආර්යඅෂ්ටාංගික මාර්ගයේ ලෝකෝත්තර උපයෝගිතාව බව
- ජාති, ජරා, ව්‍යාධි, මරණ, සෝක, පරිදේව, දුක්ඛදෝමනස්සයන්ගෙන් මිදීමේ ඒකායන මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය වන බව (සමුද්දනින්න සූත්‍රය- ස.නි.5.1)
- ආර්යඅෂ්ටාංගික මාර්ගයේ එක් එක් මාර්ගාංග වෙන වෙන ම කාමයෙන් අකුසලයෙන් වෙන්වීම පිණිස බව

එය 1. විවේකය පිණිස (විවේක විස්සිතං)
2. විරාගය පිණිස (විරාග නිස්සිතං)
3. නිරෝධය පිණිස (නිරෝධ නිස්සිතං)
4. අතහැරීමට යොමු කරවන (වොස්සග්ග පරිනාමීං )
5. රාගය හික්මවීම කෙළවර කොට ඇත්තේ (රාග විනය පරියෝසානං)
6. ද්වේශය හික්මවීම කෙළවර කොට ඇත්තේ (දෝස විනය පරියෝසානං)
7. මෝහය හික්මවීම කෙළවර කොට ඇත්තේ (මෝහ විනය පරියෝසානං )

යැයි උගන්වන බව

(සීල සූත්‍රය, දුතියයෝනිසෝ සූත්‍රය-ස.නි.5.1)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. චතුරාර්ය සත්‍යය ඇතුළත් ප්‍රදර්ශන පුවරුවක් නිර්මාණය කරන්න.
2. චතුරාර්ය සත්‍යය ඇසුරෙන් ගොඩනැගෙන ජීවන දර්ශනය මැයෙන් සාකච්ඡාවක් පවත්වන්න.
3. කාමසුඛල්ලිකානුයෝගයෙහි හා අත්තකිලමථානුයෝගයෙහි නිසරු බව පෙන්වාදෙමින් පුවත්පතට ලිපියක් රචනා කරන්න.
4. බුදු රජාණන් වහන්සේ දේශනා කළ ''මධ්‍යම ප්‍රතිපදාව'' යන මැයෙන් ධර්ම දේශනයක් සංවිධානය කරන්න.
5. ආර්යඅෂ්ටාංගික මාර්ගයේ ලෞකික උපයෝගීතාව පැහැදිලි කෙරෙන පොත් පිංචක් නිර්මාණය කරන්න.
6. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ලෝකෝත්තර උපයෝගීතාව පිළිබඳ පැහැදිලි කෙරෙන පොත් පිංචක් නිර්මාණය කරන්න.

**නිපුණතාව 7.0** : සත්‍යය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් තම ජීවන දර්ශනය ගොඩනගා ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 7.2** : සන්තානගත හා සමාජගත දුකෙහි හේතුඵල සම්බන්ධය දන යථාර්ථවාදී ව ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 20 යි.

**ඉගෙනුම් පල** :

- පටිච්චසමුප්පාදය විවරණය කරයි.
- ශාස්වත උච්ඡේද දෘෂ්ටි බැහැර කළ යුතු බව පිළිගනියි.
- දෛනික ජීවිතයේ දී සන්තානගත දුක අවම කර ගැනීමට කටයුතු කරයි.
- දෘෂ්ටි බැහැර කර නිදහස් මනසකින් දිවි ගෙවයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ප්‍රායෝගික ජීවන ගැටලු සහේතුක ව හඳුනාගෙන දෘෂ්ටිගත නොවී උපේක්ෂාවෙන් බලා ක්‍රියා කිරීමට පෙලඹවීම හා සැහැල්ලු ස්වාධීන චින්තනයක අගය වටහා දී ඒ අනුව දිවිගෙවීමට මඟපෙන්වීම මෙමඟින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**පටිච්ච සමුප්පාදය**

- ධර්මාවබෝධය ම පටිච්ච සමුප්පාද අවබෝධය වන බවත් පටිච්ච සමුප්පාද අවබෝධය ම ධර්මාවබෝධය වන බවත් දේශනාවෙහි සඳහන් වන බව.
- අස්සජී මහ රහතන් වහන්සේ උපතිස්ස පිරිවැජියාට පෙන්වා දුන් පරිදි බුදු රජාණන් වහන්සේ හේතුඵලවාදී දහමක් දේශනා කරන බව.
- ආත්මවාදයත් එය පාදක කොටගත් ශාස්වත දෘෂ්ටිය හා අශාස්වත දෘෂ්ටියත් එම දෘෂ්ටිවාදයනට අනුගත වූ සියලු දෘෂ්ටිවාදයනුත් පටිච්ච සමුප්පාදය මඟින් බැහැර කෙරෙන බව.
- අනුලෝම පටිච්ච සමුප්පාදය අවිජ්ජාපච්චයා සංඛාරා ආදි වශයෙන් සසර දුක හට ගන්නා අයුරු හේතු ප්‍රත්‍යයාකාරයෙන් උගන්වන බව.
- පටිලෝම පටිච්ච සමුප්පාදය අවිජ්ජා නිරෝධා සංඛාර නිරෝධො ආදී වශයෙන් හේතු-ප්‍රත්‍යය නිරෝධයෙන් දුක නිරුද්ධ වන අයුරු උගන්වන බව.
- බුදුවරුන් ලොව උපන්න ද නූපන්න ද මෙම හේතුඵල ධර්මය ලොව පවත්නා අතර උන් වහන්සේලා සිදු කරවන්නේ එය හෙළිදරවු කිරීම බව.
- දේශ, කාල භේදයෙන් තොර ව සියල්ල පටිච්ච සමුප්පන්න වන බව.
- පටිච්ච සමුප්පාදය කර්මය පුනර්භවය ආදි සියලු බෞද්ධ පිළිගැනීම්වල පදනම වන බව.
- පටිච්ච සමුප්පාදය මධ්‍යම දේශනාවක් වන බව.
- සත්ත්වයා ය, පුද්ගලයා ය, ආත්මය යැයි සම්මුති වශයෙන් හඳුන්වනු ලබන ස්කන්ධ පහ ම හේතු ප්‍රත්‍යය ඇති කල ඇති වන බව හා නැති කල නැති වන බව.

- පටිච්ච සමුප්පාදයේ කෙටි සූත්‍රය ඉමස්මිං සති ඉදං හොති යනාදි පාඨ සතරකින් පෙළ දහමෙහි දක්වෙන බව හා එහි පුළුල් භාවිතයක් ඇති බව

- අවිජ්ජා - මෝහය, මුළාව, නොදැනීම, චතුරාර්ය සත්‍යය පිළිබඳ අනවබෝධය අවිද්‍යාව යි. එම අවිද්‍යාව හෙවත් ඇති තතු ඇති සැටියෙන් නොදැනීම, සංස්කාරයන්ට ප්‍රත්‍යය වන බව.
- සංඛාර - පුද්ගලයාගේ තිදොරින් ප්‍රකට වන ක්‍රියාවන්, පින්, පව්, සචේතනික ක්‍රියා, කර්ම ශක්තිය සංඛාර නම් වේ. එය විඤ්ඤාණයට ප්‍රත්‍යය වන බව.
- විඤ්ඤාණ - විජානනය, අරමුණු දැන ගැනීම, ඇස ආදි ඉන්ද්‍රිය සය, රූපාදි අරමුණු සමඟ එක් වීමෙන් උපදනා දැනුම, ප්‍රතිසන්ධියට මුල් වන ආධ්‍යාත්මික ශක්තිය විඤ්ඤාණ නම් වේ. එය නාමරූපයන්ට ප්‍රත්‍යය වන බව.
- නාමරූප - චිත්ත චෛතසික ධර්ම සහ පුද්ගලයාගේ කය, රූපය හෙවත් ශරීරය නාමරූප නම් වේ. වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධයන් නාම ලෙස ද රූපස්කන්ධය රූප ලෙස ද සැලකෙයි. නාමරූපයන් සළායතනයන්ට ප්‍රත්‍යය වන බව
- සළායතන - ඇස, කන, දිව, නාසය, ශරීරය හා මනස සළායතන නම් වේ. සළායතන ස්පර්ශයට ප්‍රත්‍යය වන බව.
- ඵස්ස - ස්පර්ශය හෙවත් පහස, එය චක්ඛු- සම්පස්සාදි වශයෙන් සවැදෑරුම් වේ. ස්පර්ශය වේදනාවට ප්‍රත්‍යය වන බව.
- වේදනා - සංවේදනය, විඳීම, සැප, දුක්, උපේක්ෂාදි වින්දන, වේදනා නම් වේ. ස්පර්ශයට අනුව චක්ඛු සම්පස්සජා, වේදනාදි වශයෙන් සවැදෑරුම් වන වේදනාව තණ්හාවට ප්‍රත්‍යය වන බව.
- තණ්හා - ආසාව, ඇල්ම, ගිජු බව තණ්හා නම් වේ. එහි විවිධ ප්‍රභේද ඇති අතර රූප තණ්හා ශබ්ද තණ්හාදි වශයෙන් සවැදෑරුම් වන එය උපාදානයට ප්‍රත්‍යය වන බව
- උපාදාන - දැඩි ව සිතින් අල්ලා ගැනීම, අත්නොහැර සිටීම උපාදාන නම් වේ. එහි විවිධ ප්‍රභේද ඇති අතර එය භවයට ප්‍රත්‍යය වන බව.
- භව - වීම, එක්වීම, පැවැත්ම භව නම් වේ. මෙහි කර්ම භව, උත්පත්ති භව ආදී විවිධ ප්‍රභේද ඇති අතර එය ජාතියට ප්‍රත්‍යය වන බව.
- ජාති - ඉපදීම, පහළ වීම, ස්කන්ධ ධාතු ආයතනාදීන්ගේ ප්‍රතිලාභය ජාති නම් වේ. ජරා, මරණාදීන්ට එය ප්‍රත්‍යය වන බව.
- ජරාමරණ - දිරායාම හා මිය යාම, මහලු වීම හා මරණය ජරා මරණ නම් වේ. ඒ හා බැඳීගත් ශෝක පරිදේවාදි දුක්, දොම්නස්,සසර උපන් සත්ත්වයාට විඳීමට සිදු වන බව.

**ශාස්වත සහ උච්ඡේද දෘෂ්ටි විචාරය**

- දෘෂ්ටියක් යනු අන්තගාමිත්වයෙන් දැඩි ව අල්ලාගත් ආගමික දාර්ශනික මතවාදයක් බව.
- එම දෘෂ්ටිවාදයන්ට එළඹ සිටි බුද්ධකාලීන මහණ බමුණන් තම මතය ම සත්‍ය යයි ද අන්‍ය මත සියල්ල ම අසත්‍ය යයි ද තර්ක කළ බව.

- බුද්ධකාලීන ව එබඳු දෘෂ්ටිවාද දෙසැටක් භාරතයේ පැවති බව.
- එම දෘෂ්ටිවාද සියල්ලට ම පාදක වූ ශාස්වත හා උච්ඡේද යනුවෙන් ප්‍රධාන දෘෂ්ටි දෙකක් පැවති බව.
- ශාස්වත දෘෂ්ටිය අනුව නිත්‍ය ආත්මයක් ඇතැයි ද එය භවගාමී යයි ද එක හෙළා ම පිළිගත් බව.
- උච්ඡේද දෘෂ්ටිය අනුව එබඳු ආත්මයක් නැතැයි ද සියල්ල මරණයෙන් කෙළවර වන්නේ යැයි ද පිළිගත් බව.
- මෙම දෘෂ්ටි දෙකෙන් ම නිවන් මඟ ආවරණය වන බව.
- ශාස්වත, උච්ඡේද දෙකට ම නොවැටෙන මධ්‍යම දේශනාවක් බුදු දහම උගන්වන බව.
- පටිච්ච සමුප්පාදය අනුව ලෝකය දකින්නා මෙම දෘෂ්ටීන්ගෙන් මිදෙන බව.

**සන්තානගත දුක හා සංස්ථාගත දුක ගොඩ නැඟෙන අයුරු**

**සන්තානගත දුක**

- සන්තානයෙහි හෙවත් සිතේ ඇති දොම්නස, අසහනය අතෘප්තිකර බව, සන්තානගත දුක නම් වන බව.
- තණ්හාව නිසා සන්තානගත දුක උපදනා අතර තවත් බොහෝ ක්ලේශ ධර්මයන් එහිලා මුල් වන බව
- සාංසාරික පුහුදුන් සත්ත්වයා නිරතුරු ව ම මෙකී සන්තානගත දුකින් පීඩා විඳින බව
- පටිච්ච සමුප්පාද දේශනාව සන්තානගත දුකෙහි හේතු ප්‍රත්‍යයාකාරය උගන්වන බව
- ත්‍රිවිධ ශික්ෂාව වැඩීමෙන් තෘෂ්ණාව ද එය මුල් කොට ගත් සියලු කෙලෙස් ද නැති කොට සන්තානගත දුකින් මිදිය හැකි බව

**සංස්ථාගත දුක**

- සංස්ථාගත දුක යනු සමාජ සංස්ථාවක පොදුවේ බලපාන විරැකියාව, ධනෝපායන මාර්ග නැතිවීම, දිළිඳුකම, තරඟකාරීත්වය, නොයෙකුත් විෂමතා සහ සමාජ ගැටලු ද හේතු කොටගෙන උපදින දුක් පීඩාවන් බව.
- පරිණාමයත් සමඟ භෞතික සම්පත් පිළිබඳ පොදු පරිභෝග ක්‍රමය පෞද්ගලික පරිභෝග ක්‍රමයට යොමු වීම, පාරිසරික සම්පත් අනිසි ලෙස භුක්ති විඳීම, සොරකම ඇතුළු සමාජ විරෝධි ක්‍රියා පැතිරයාම ආදි හේතු සාධක මත සමාජය සංකීර්ණ වූ ගැටලු සහිත ව විෂමතා බහුල ආයතනයක් වූ සැටි බුදු දහමෙහි පෙන්වා දී තිබෙන අතර එයින් විවිධ දුක් ගැහැට පැතිර ගිය බව.
- අකාර්යක්ෂම රාජ්‍ය පාලනය නිසා උපන් දුප්පත්කම, සොරකම, මනුෂ්‍ය ඝාතනය, බොරු කීම ආදි විවිධ අපරාධ බුදු දහම අනුව දක්වා එකිනෙක බලපෑමෙන් පැතිර යන විට මතු වන දුක් සමාජගත දුක් බව.
- තණ්හාව, සෙවීම, ලැබීම, ඇගයීම, බැඳීම, මමායනය, රැකීම හා එය මුල් කොටගත් අවි ආයුධ භාවිතය ද ඔස්සේ සමාජය තුළ කලකෝලාහල වර්ධනය වී ආයු වර්ණාදිය පිරිහීමෙන් මතුවන දුක් බුද්ධ දේශනාවෙහි පෙන්වා දී තිබෙන බව.

- සමාජ ආර්ථික සංවර්ධනයට උපකාරී වන දසවිධ පිළිවෙත් (සක්විති වත් 1) රාජධර්ම හා සමාජගත පිරිහීම වළක්වන අපරිහාණීය ධර්මාදි පිළිවෙත් අනුගමනය කිරීමෙන් රජයට සමාජ ගත දුක් නැති කළ හැකි යැයි බුදු දහමෙහි උගන්වන බව.
- නිෂ්පාදනය, වෙළෙඳාම රාජ්‍ය සේවය යන ත්‍රිවිධ කාර්යයන් රාජ්‍ය මැදිහත්වීම ද අනුග්‍රහය ද ඇති ව සංවර්ධනය කිරීමෙන් සමාජගත දුක් පැරදවිය හැකි යැයි දේශනාවල සඳහන් වන බව
- සමානාත්මතාව ය පාදක කොටගෙන ක්‍රියා කිරීමෙන් ද සදාචාර ගුණ ධර්මවලට මුල් තැන දීමෙන් ද සමාජ ගැටලු විසඳා ගැනීමෙන් සංස්ථාගත දුක් මග හැරවිය හැකි යැයි බුදු දහම පිළිගන්නා බව.
- සමාජයක ප්‍රජාව වීර්යවන්ත ව අනලස් ව ශ්‍රමය ඵලදායී ව භාවිතයට ගනිමින්, සම්පත් මනා ව රැක ගනිමින් යහපත් සබඳතා ඇති ව අයවැය සම ව පවත්වා ගැනීම ආදි කළමනාකරණ ක්‍රියාවන් ද අනුගමනය කරන්නේ නම් සමාජගත දුක නැති කළ හැකි යැයි බුදු රදුන් දේශනා කර ඇති බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. පටිච්ච සමුප්පාදය පැහැදිලි කරන ධර්ම දේශනයක් සංවිධානය කරන්න.
2. සංස්ථාගත දුක විස්තර කරමින් පුවත්පතකට ලිපියක් සකස් කරන්න.
3. ''සමාජ විෂමතා දුරු කිරීම '' මැයෙන් කවි පන්තියක් රචනා කරන්න.
4. සන්තානගත දුක දුරු කිරීම පිළිබඳ පැහැදිලි කෙරෙන ධර්ම සාකච්ඡාවක් කරන්න.
5. පටිච්ච සමුප්පාදය චක්‍රාකාර ව දැක්වෙන ප්‍රදර්ශන පුවරුවක් නිර්මාණය කරන්න.
6. නූතන සමාජ අරගලවලට බලපාන හේතුප්‍රත්‍යය පැහැදිලි කෙරෙන පොත් පිංචක් නිර්මාණය කරන්න.

**පරිශීලනයට :**

- පොට්ඨපාද සූත්‍රය - දීඝ නිකාය
- මහානිදාන සූත්‍රය - දීඝ නිකාය
- චක්කවත්තිසීහනාද සූත්‍රය - දීඝ නිකාය
- බ්‍රහ්මජාල සූත්‍රය - දීඝ නිකාය
- අග්ගඤ්ඤ සූත්‍රය - දීඝ නිකාය
- මහාවේදල්ල සූත්‍රය - මජ්ඣිම නිකාය
- බහුවේදනීය සූත්‍රය - මජ්ඣිම නිකාය
- මහාවච්ඡගොත්ත සූත්‍රය - මජ්ඣිම නිකාය
- චූළදුක්ඛඛන්ධ සූත්‍රය - මජ්ඣිම නිකාය

- මහාතණ්හාසංඛය සූත්‍රය - මජ්ඣිම නිකාය
- නිදානවග්ග සූත්‍රය - සංයුත්ත නිකාය
- බුදුන් වදාළ ධර්මය - වල්පොල රාහුල හිමි
- බුද්ධ ධර්මය - කොස්වත්තේ අරියවිමල හිමි
- පටිච්ච සමුප්පාද විවරණය - රේරුකානේ චන්දවිමල හිමි
- බෞද්ධ අධ්‍යයන ප්‍රවේශය - දේවාලේගම මේධානන්ද හිමි
- සම්බුද්ධ දේශනාව - තලල්ලේ ධම්මානන්ද හිමි
- ථෙරවාදී බුදුදහමෙහි මූලික ඉගැන්වීම් - ධර්මසේන හෙට්ටිආරච්චි

**නිපුණතාව 8.0** : බුදු දහමෙහි මානව කේන්ද්‍රීය බව තේරුම් ගෙන බෞද්ධ ආචාරධර්මවලට අනුගත සාර්ථක ජීවිතයක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 8.1** : මානව ස්වාමීත්වය හා ශක්‍යතා පසක් කර සිය විභව්‍යතා වර්ධනය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 30 යි.

**ඉගෙනුම් පල** :

- පුද්ගල ස්වාමීත්වය, ශක්‍යතාව හා වගකීම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පැහැදිලි කරයි.
- පෞරුෂ සංවර්ධනයට පෙලඹෙයි.
- අභියෝග ජය ගනියි.
- ආත්ම විශ්වාසයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

පුද්ගල ස්වාමීත්වය, ශක්‍යතාව හා වගකීම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම හැඳින ජීවිත අභියෝග ජය ගැනීමට පුද්ගලයාගේ ආත්ම විශ්වාසය හා පෞරුෂත්වය සංවර්ධනයට මඟපෙන්වීම මෙමඟින් අපේක්ෂා කෙරේ.

**විෂය අන්තර්ගතය :**

**මිනිසාගේ ස්වාමිත්වය සහ ශ්‍රේෂ්ඨත්වය**

- ස්වාමිත්වය යනු තමාට තමා හැර වෙනත් ස්වාමියකු හෝ තමා පාලනය කරන අදෘශ්‍යමාන බලයක් හෝ නැති බව.
- බුද්ධකාලීන භාරතයේ නිර්මාණවාදී ආගමික චින්තාවන්හි මිනිසාගේ ස්වාමිත්වය මහා බ්‍රහ්ම, මහා පුරුෂ, ඊශ්වර වැනි අධිභෞතික බලයකට යටත් කොට තිබූ බව.
- ඊශ්වර නිර්මාණවාදී ඉගැන්වීම් අනුව සර්ව බලධාරී දෙවියකු විසින් සත්ත්වයා හා ලෝකය පාලනය කරනු ලැබේ යැයි පිළිගන්නා බව.
- පුබ්බේකත හේතුවාදය, ඊශ්වර නිර්මාණවාදය, අහේතු අප්පච්චයවාදය හා නියතිවාදය පිළිගත් ශාස්තෘවරුන් බුද්ධකාලීන ව සිටි බව හා එම ඉගැන්වීම් මඟින් පුද්ගලයාට ස්වතන්ත්‍ර ව ක්‍රියාත්මක වීමට ඇති අවකාශය ප්‍රතික්ෂේප කෙරෙන බව (මහාවග්ගය -අ.නි. 1)
- දෙවිවරු ඇතැයි බුදු දහම පිළිගන්නා නමුදු මානව ස්වාමිත්වය දරන සර්වබලධාරී දෙවියකු ඇතැයි නොපිළිගන්නා බව
- බෞද්ධ හේතුඵල ධර්මයෙන් ඊශ්වර නිර්මාණවාදය, පුබ්බේකත හේතුවාදය හා නියතිවාදය බැහැර වන බව
- බුදු දහමෙහි මිනිසාගේ ස්වාමීත්වය මිනිසාට පවරා ඇති බව හා බාහිර ගැලවුම්කරුවකු මත රඳවා නොමැති බව
- සියලු ජීවීන් අතර මිනිසා ශ්‍රේෂ්ඨ යැයි බුදු දහම උගන්වන බව
- මිනිසත් බව ඉතා දුර්ලභ යැයි බුදු දහමෙහි උගන්වා ඇති බව

- බුද්ධත්වය, පච්චේක බුද්ධත්වය, රහත් බව ලැබිය හැක්කේ මිනිසකුට පමණක් යැයි බුදු දහමෙහි උගන්වා ඇති බව
- බෝධිසත්ත්වවරයකු ලෙස අභිනීහාරය (බෝධි චිත්තය) උපදවා ගැනීමට මිනිසත් බවක් ලැබීමට අවශ්‍ය යැයි උගන්වා ඇති බව
- ''අත්තාහි අත්තනො නාථො .....'' ''තුම්හෙහි කිච්චං ආතප්පං ....' යන ආදි දේශනාවන් අනුව තමාගේ ගැලවුම්කරුවා තමා ම ය යන්න පිළිගෙන කටයුතු කරන්නට අවස්ථාව සැලසී ඇති බව
- මනස උපරිම තලයකට දියුණු කිරීමේ හැකියාව මිනිසා හට පමණක් ඇති බව පිළිගන්නා බුදු දහම තම තමන් විසින් ම වෙන් වෙන් ව හිඳ ධර්මය නුවණින් දැකිය යුතු යැයි දේශනා කර ඇති බව

(පංචභයවේර සූත්‍රය-ස.නි. 2)

- තමාගේ ස්වාමියාත් විමුක්තිදායකයාත් තමා ම යැයි උගන්වන බුදු දහම කාර්ය සාධනයේ වගකීම හා අයිතිය පුද්ගලයාට පවරා ඇති බව.
- ආරම්භ ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු, පුරිසථාම, පුරිස බල, පුරිස වීරිය ආදි ඉගැන්වීම් මඟින් මානව ශක්‍යතාව ස්වාධීනත්වය හා ස්වාමීත්වය අවධාරණය කරන බව
- බුදු දහම වනාහි ඓතිහාසික වශයෙන් ශ්‍රේෂ්ඨ මිනිසකු විසින් සත්ත්වයාගේ හා ලෝකයේ යථාර්ථය මත පදනම් ව හඳුන්වා දෙන ලද දර්ශනයක් හා ප්‍රතිපදාවක් වන අතර, එමගින් මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය අවධාරණය වන බව
- පරමාරදර්ශී භික්ෂු ප්‍රතිපදාවට අයත් මනුස්ස විග්ගහ පාරාජිකාවෙන් ද මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය පිළිගෙන ඇති බව

**ස්වච්ඡන්දතාව, වගකීම හා මිනිසාගේ කායික මානසික ශක්‍යතාව**

- ස්වච්ඡන්දතාව යනු නිදහසේ සිතාමතා තීරණ ගැනීමට හා කටයුතු කිරීමට ඇති හැකියාව හෙවත් කිසි දු බාහිර බලවේගයක බලපෑමට යටත් නොවී ස්වාධීන ව තීරණයන්ට එළඹීමට ඇති නිදහස බව
- ස්වච්ඡන්දතාව පිළිබඳ බෞද්ධ නිර්වචනය අනුව මිනිසාට තමාගේ අභිමතය පරිදි ඕනෑම ක්‍රියාවක් කිරීමට නිදහසක් ඇතැයි යන්න අදහස් නොවන බව
- අන් අයගේ අයිතීන් සුරැකෙන පරිදි සදාචාරමය සීමාව තුළ තීරණ ගෙන කටයුතු කළ යුතු යැයි මින් අදහස් වන බව
- වගකීම යනු සචේතන ක්‍රියාවේ වගකීම කර්තෘ වෙත පැවරේ ය යන්න බව
- තමා විසින් සිතාමතා කරනු ලබන හොඳ හෝ නරකක්‍රියාවේ වගකීම මෙන් ම එහි විපාකය ද තමාට ම පැවරෙන බව ( ධම්මපදය- යමකවග්ගය 1 ගාථාව-ඛු.නි.1)
- සචේතන මානව චර්යාවන් හොඳ නරක වශයෙන් බුදුසමය මඟින් ගුණ විනිශ්වයකට භාජනය කොට ඇති බව
- පුඤ්ඤපාප, කුසලඅකුසල, කරණීය, අකරණීය, සාධු, අසාධු, සම්මා මිච්ඡා ආදි ඇගයුම්ශීලී ප්‍රකාශන මඟින් එය සනාථ වන බව

- ඊශ්වර නිර්මාණවාදය, පුබ්බේකත හේතුවාදය හා නියතිවාදය ආදී ඉගැන්වීම් මගින් පුද්ගල ස්වච්ඡන්දතාවට, වගකීමට හා ශක්‍යතාවට හානි සිදුවන බව
- බුදු දහමෙහි ඉගැන්වෙන ක්‍රියාව පිළිබඳ නිදහස, එකී ක්‍රියාවේ වගකීම කරණ කොටගෙන පාලනය වන බව
- මිනිසාගේ කාය ශක්තිය අවශ්‍ය බව පිළිගන්නා බුදු දහම එමඟින් ලද හැකි ධාර්මික භෞතික දියුණුව අගය කරන බව
- මනස සියල්ලට ම ප්‍රධාන වන අතර ඕනෑ ම අභියෝගයක් ජය ගැනීමට අවශ්‍ය අධිෂ්ඨානය හා ශක්තිය මනස සතු බවත් බුදුසමය අවධාරණය කරන බව
- අත්තකාර, පරකාර, ආරම්භක ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු, ථාම ධාතු, ඨිති ධාතු, උපක්කම ධාතු යනාදී ඉගැන්වීම් මඟින් පුද්ගල ශක්තිය අර්ථවත් කෙරෙන බව
- ආර්ය ප්‍රතිපදාවේ සම්මා වායාම, බොජ්ඣංග ධර්ම අතර විරිය බොජ්ඣංග, ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය අතර වීර්ය ඉන්ද්‍රිය ආදී ඉගැන්වීම්වලින් ද පුද්ගල ස්වච්ඡන්දතාව අර්ථවත් වන බව
- පුද්ගල ස්වච්ඡන්දතාවට බාධා වන කරුණු 10ක් කාලාම සූත්‍රයේ දේශනා කර ඇති බව
- නිර්වාණාධිගමයට ඇති හැකියාව මිනිසා හැර වෙනත් කිසිදු සත්ත්වයකු සතු නොවේ යැයි බුදු දහම පිළිගන්නා බව
- මිනිසාට තමාගේ ශක්තිය පිහිට කොටගෙන සියලු යහපත සලසා ගැනීමට හැකියාව පවතින බව (කරණීයමෙත්ත සූත්‍රය-ඛු.නි.1)
- ස්වශක්තිය මත විශ්වාස තබා ප්‍රගුණ කළ යුතු යහපත් මිනිස් චර්යා 38ක් මහා මංගල සූත්‍රයේ දේශනා කර ඇති බව
- අධිෂ්ඨානය, ආත්ම ශක්තිය, වීර්යය, සිහිය ආදී මානව ගුණධර්මයන් ස්වශක්තියෙන් ම දියුණු කිරීමෙන් උභයාර්ථ සංවර්ධනය ළඟා කර ගත හැකි බව.
- බුද්ධාදී උතුමන් විසින් මානසික ශක්තිය ඵලදායක ලෙස සංවර්ධනය කිරීමෙන් දුඩි ආයාසයෙන් ජය ගත යුතු සසර පවා ජය ගත් බව

**කුසලාකුසල විනිශ්චය කිරීමේ බෞද්ධ නිර්ණායක**

- බුදු සමය පුද්ගල චර්යාවන් ඇගයුම්කරණයට ලක් කරන බෞද්ධ ව්‍යවහාර හොඳ - නරක, පුඤ්ඤ - පාප, කුසල - අකුසල, සාධු- අසාධු, සම්මා - මිච්ඡා, කරණීය - අකරණීය ආදියෙන් පිළිබිඹු වන බව
- කුසලාකුසල කර්ම විනිශ්චය කිරීමේ මිනුම්දඬු අතර චේතනාව, එහි අරමුණ හා ප්‍රතිඵලය ප්‍රධාන බව (නිබ්බේදික සූත්‍රය-අ.නි. 1)
- කුසලාකුසල කර්ම විනිශ්චය කිරීම සඳහා ඒ ඒ චේතනා සමග අභිජ්ඣා, ව්‍යාපාද, මිච්ඡාදිට්ඨි අනභිජ්ඣා, අව්‍යාපාද, සම්මා දිට්ඨි යන චෛතසික යෙදෙන බව
- විරාගය පිණිස, නිරෝධය පිණිස, ක්ලේශයන්ගේ සංසිදීම පිණිස, සම්බෝධිය පිණිස හා නිර්වාණාධිගමය පිණිස යම් ක්‍රියාවක් අදාළ වේ නම් එය කුසල ක්‍රියාවක් ලෙස ද එම මූලික පරමාර්ථයන්ට නොගැළපෙන යම් ක්‍රියාවක් වේ නම් එය අකුසල ක්‍රියාවක් ලෙස ද සැලකෙන බව. (මඛාදේව සූත්‍රය-ම.නි. 1)

- සිත, කය , වචනය යන තිදොරින් සිදු කරන යම් ක්‍රියාවක් තමන්ගේ අනුන්ගේ හා දෙපක්ෂයේම යහපත පිණිස පවතී නම්, එය කුසල ක්‍රියාවක් ලෙස ද තමාටත් අනුන්ටත් දෙපක්ෂයටමත් අහිත පිණිස, අනර්ථය හේතුවන සෑම ක්‍රියාවක් ම අකුසල ක්‍රියාවක් ලෙස ද සැලකෙන බව. (අම්බලට්ඨිකරාහුලෝවාද සූත්‍රය-ම.නි. 1)
- කැඩපතකින් තමා විසින් තමා ම නිරීක්ෂණය කරන්නා සේ තම කායික, වාචසික හා මානසික ක්‍රියා ප්‍රත්‍යවේක්ෂා කළ යුතු බව
- ක්‍රියාව නිශ්චය කිරීමේ දී සැලකිය යුතු කරුණු තුනක් ''ආධිපත්‍යය'' යනුවෙන් දක්වා ඇති බව. (දේවදූතවග්ගය 10 සූත්‍රය-අ.නි.1)
- යම් ධර්මයක් අකුසල් ද සාවද්‍ය ද පණ්ඩිතයන් විසින් ගර්හිත ද වඩනු ලබන්නාට අහිත පිණිස, දුක් පිණිස පවතින්නේ ද එය අකුසල් ලෙසත්, යම් ධර්මයක් කුසල් ද නිරවද්‍ය ද, පණ්ඩිතයන් විසින් ප්‍රශංසා කරන ලද්දේ ද වඩනු ලබන්නාට හිත පිණිස, සැප පිණිස පවතින්නේ ද ඒවා කුසල් ලෙස සැලකෙන අතර එය ස්වකීය ව්‍යවහාරික ප්‍රඥාවෙන් ම අවබෝධ කරගත යුතු යැයි දක්වා ඇති බව. (මහාවග්ගය, 5 සූත්‍රය-අ.නි. 1)
- තමා උපමාවට ගෙන කළ යුතු දේ නොකළ යුතු දේ තීරණය කිරීම මිනුමක් ලෙස බුදුදහමේ ඉදිරිපත් වෙන බව. (වෙළුද්වාරෙය්‍ය සූත්‍රය-අ.නි. 1)
- හොඳ නරක ක්‍රියාව නිශ්චය කිරීමේ නිදහස බුදු දහමින් තහවුරු කර තිබෙන බව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. පුද්ගල ශ්‍රේෂ්ඨත්වය තහවුරු කරනු සඳහා කායික මානසික ශක්තීන්හි වැදගත්කම පිළිබඳ බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න.
2. නිර්මාණවාදී ආගම්වල පුද්ගල ස්වච්ඡන්දතාව හා වගකීම, අහුරා ඇති ආකාරය පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න.
3. කුසලාකුසල විනිශ්චය කිරීමේ බෞද්ධ මිනුම් දඬු ඉදිරිපත් කෙරෙන මූලාශ්‍රය ලැයිස්තුවක් සකස් කරන්න.
4. සියලු බාහිර අධිකාරයන්ගෙන් නිදහස් ව මිනිසා වෙත ස්වාමිත්වයක් පිරිනැමීමෙන් පුද්ගල පෞරුෂත්වය සංවර්ධනය වන ආකාරය පිළිබඳ ව බෞද්ධ සංගමයේ කතාවක් ඉදිරිපත් කරන්න.
5. මිනිසාගේ ස්වාමීත්වය පැහැදිලි කෙරෙන පොත් පිංචක් නිර්මාණය කරන්න.
6. ස්වච්ඡන්දතාව හා වගකීම පිළිබඳ සවිස්තර වාර්තාවක් පිළියෙළ කරන්න.

**නිපුණතාව 8.0** : බුදුදහමෙහි මානව කේන්ද්‍රීය බව තේරුම් ගෙන බෞද්ධ ආචාරධර්මවලට අනුගත සාර්ථක ජීවිතයක් ගොඩනගාගනියි.

**නිපුණතා මට්ටම 8.2** : කර්මය, පුනර්භවය හා කුසල් අකුසල් පිළිබඳ විශ්වාසයෙන් සදාචාරාත්මක ජීවිතයකට හුරු වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 40 යි.

**ඉගෙනුම් පල** :

- කුශලාකුශල කර්ම හා පුනර්භවය පිළිබඳ බෞද්ධ විවරණය ඉදිරිපත් කරයි.
- කර්මඵල සිද්ධාන්තය පිළිගනියි.
- සදාචාරාත්මක ජීවිතයක් ගත කරයි.
- සමාජ සාරධර්ම සංරක්ෂණයට දායක වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

කුශලාකුශල කර්ම හා ශ්‍රද්ධාව පිළිබඳ බෞද්ධ සිද්ධාන්තය පිළිගෙන සදාචාරාත්මක ජීවිතයක් ගත කිරීමට හා සමාජ සාරධර්ම සංරක්ෂණයට යොමු කිරීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**දසකුසල් හා දශ පුණ්‍යක්‍රියා**

- කුසල - පුඤ්ඤ යන ව්‍යවහාරයන්හි අර්ථය හා භාවිතය පිළිවෙළින් නිවන හා සසර ගමන සමඟ සම්බන්ධ කරුණු පැහැදිලි කිරීමට යොදාගත හැකි බව
- පින යන්නෙන් සැපය අර්ථවත් කරන අතර එම සැපය භවයෙහි පැවැත්ම යහපත් කරන බව.
- පුද්ගලයාගේ සිත කාම භවයෙන් ඉවත් කොට භවානුසාරී සත්ත්ව තත්ත්වය නැතිකර නිර්වාණගාමී මාර්ගය කෙරෙහි යොමු කිරීම කුසලයෙන් සිදු කෙරෙන බව
- ලෝභ, දෝස, මෝහ සහගත කායික, වාචසික හා මානසික ක්‍රියා අකුසල් යනුවෙනුත් අලෝභ, අදෝස, අමෝහ සහගත කායික, වාචසික හා මානසික ක්‍රියා කුසල් යනුවෙනුත් හැඳින්වෙන බව
- ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, බොරු කීම, කේළාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම (සම්පප්‍රලාප) දැඩි ලෝභය, ව්‍යාපාද හා මිච්ඡා දිට්ඨිය යන දහය අකුසල් වන බව
- මෙම කරුණු දහයෙන් වැළකීම ම දස කුසල් වන බව
- දසකුසල්වල ආචාරාත්මක හා ආධ්‍යාත්මික ශික්ෂණයක් අන්තර්ගත වන බව
- දස අකුසලයෙහි යෙදෙන පුද්ගලයා මරණින් මතු නිරයෙහි උපදින්නේ යැයි දේශනාවේ සඳහන් වන බව (වේරඤ්ජක සූත්‍රය-ම.නි. 1)

**දශපුණ්‍ය ක්‍රියා**

- දානං සීලංච භාවනා - පත්තිපත්තානුමෝදනා
  වෙයයාවච්චපචායංච - දේසනා සුති දිට්ඨිජු
  යනුවෙන් දශපුණ්‍යක්‍රියා වස්තුවක් බුදුසමයෙහි ඉගැන්වෙන බව.

- දාන, සීල හා භාවනා යනුවෙන් පුඤ්ඤකිරියවත්ථු තුනක් සූත්‍ර ධර්මවල සඳහන් වන අතර දාන, සීල, භාවනා, පත්තිදාන, පත්තානුමෝදනා, වෙයයාවච්ච, අපචායන, දේශනා, සුති හා දිට්ඨිජුකම්ම යනුවෙන් පුණ්‍යක්‍රියා දහයක් අටුවාවේ සඳහන් වන බව (අත්ථසාලිනී අටුවාව)
- දශපුණ්‍ය ක්‍රියාවන්ට අදාළ ව යහපත් වූ කාය, වාක්, මනෝ කර්මවල නිරතවීමෙන් ලබෙන්නා වූ ඵලය මෙලොව ජීවිතය මෙන් ම සාංසාරික ජීවිතයේ සැපවත් පැවැත්මට ද උපකාරී වන බව
- රහතන් වහන්සේ පින සහ පව බැහැර කොට ඇති නමුදු කුසලයෙහි ප්‍රතිමූර්තියක් වන බව
- කුසල හා පුණ්‍ය ක්‍රියාවල නිරත වීමෙන් ගුණගරුක සමාජයක් ගොඩනැගෙන බව
- ඉහත දක්වන ලද ඇතැම් පුණ්‍ය කර්මයන්හි කුශල කර්ම ලක්ෂණ ද ඇති බව

**පංචසීලය, ආජීව අෂ්ටමක සීලය, අෂ්ටාංග සීලය හා දසසීලය**

**පංචසීලය**

- සීලය යන්නෙහි සංවරය, ශික්ෂණය, විනය, හික්මීම යන අරුත් නිරූපණය වන බව
- ''කාය වාචානං සමෝධානං සීලං'' යන පාඨයට අනුව කය, වචන දෙකෙහි හික්මීම සීලය බව
- පඤ්චසීලය ගෘහස්ථ ප්‍රතිපදාව වන බව
- පන්සිල් සමාදන්වීම යනු අත්හළ යුතු අපගාමී චර්යාවන් පහක් අත්හරින බවට කරනු ලබන ස්වයං ප්‍රකාශනයක් බව
- පඤ්චසීල ප්‍රතිපදාවෙන් ජීවත්වීමේ අයිතිය දේපළ අයිතිය තම අයිතිය මෙන් ම අනුන්ගේ අයිතීන් ද සුරක්ෂිත වන බව
- පන්සිල් රැකීමෙන් යුක්තිය, සාමය, ආරක්ෂාව, සෞඛ්‍යසම්පන්න වීම, අන්‍යෝන්‍ය විශ්වාසය ඇති සමාජයක් බිහි වන බව

**ආජීව අෂ්ටමක සීලය**

- ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන අංගත්‍රයට ඇතුළත් ශික්ෂා පද අට ආජීව අෂ්ටමක සීලය ලෙස ගැනෙන බව
- ''ආජීවය අටවැනි කොට ගොඩනැගුණු ප්‍රතිපදාව'' යන අරුතින් එම නම භාවිත වන බව
- ලෞකික ජීවිතයේ සාර්ථකත්වය මෙන් ම ආජීව අෂ්ටමක සීලය ද පෘථග්ජන පුද්ගලයා විමුක්තිය වෙත ද යොමුකරන ඵලදායී ප්‍රතිපදාවක් බව

- දීඝ නිකායේ මුල් සූත්‍රවල චූල  සීල යන්නෙන් දක්වා ඇත්තේ ආජීව අෂ්ටමක සීලය  වන බව
- විශේෂයෙන් ම අකුසල ධර්මයන්ගෙන් වැළකී කුසල ධර්මයන් සම්පූර්ණ කිරීමට මෙම සීලය උපකාරී වන බව

**අෂ්ටාංග ශීලය**

- ගෘහස්ථයකු විසින් සතර පොහොය දිනවල ආරක්ෂා කළ යුතු සීලය අෂ්ටාංග ශීලය නමින් හැඳින්වෙන බව
- එම සීලය පවින් වැළකීම මෙන්ම අපිස් ජීවිතයකට පුද්ගලයා යොමු කිරීමට ද ඉවහල් වන බව
- උපෝසථ සීලය විමුක්තිය වෙත දිවෙන ප්‍රගති වේගය දියුණු කර ගැනීමට ද උපකාරී වන බව
- එම සීලය සමාදන් ව ආරක්ෂා කිරීමෙන් පුණ්‍ය ක්‍රියා මෙන් ම කුශල ක්‍රියා ද වැඩිදියුණු කර ගැනීමට අවස්ථාව ලැබෙන බව

**දස සීලය**

- දස සීලය සාමණේර සීලය ලෙස ද විනයෙහි දක්වා ඇති බව
- ගෘහස්ථ පුද්ගලයාට ද එම සීලය ආරක්ෂා කිරීමට හැකියාව ඇති බව
- චරිත සංවර්ධනය අරමුණු කොට පවත්නා සියලු ශීල ශික්ෂාවන් නිවන් මඟෙහි ප්‍රතිෂ්ඨාව වශයෙන් දක්වා ඇති බව
- සීලය ධනයක්, බලයක්, සුගන්ධයක් හා සැපයක් වශයෙන් ද හඳුන්වා ඇති බව
- සීල ශික්ෂණයට නොකළ යුතු දේ නොකිරීම (වාරිත්‍ර) මෙන් ම කළ යුතු දේ කිරීම  (චාරිත්‍ර) ඇතුළත් වන බව
- දශරාජ ධර්ම, දශ පුණ්‍යක්‍රියා, දස පාරමිතා ආදියෙහි ද සීලය ඇතුළත් වන බව

**සතර බ්‍රහ්ම විහරණ**

- මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සිවුබඹ විහරණ අප විසින් වැඩිය යුතු කේන්ද්‍රීය සාරධර්ම වන බව
- බ්‍රහ්මයනට අදාළ වූ උතුම්, ශ්‍රේෂ්ඨ විහරණය යන අර්ථයෙන් බ්‍රහ්ම විහාර නම් වන බව
- ''සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා යි'' යනාදී වශයෙන් සිතමින් සැනසුම හා අභිවෘද්ධිය අන්අයට පිරිනැමීමට බලවත් කැමැත්තකින් පසුවීම මෙත්තාව බව.

  (පරමත්ථජෝතිකා අටුවාව)
- අනුන්ගේ දුකෙහි දී සත්පුරුෂයන් තුළ ඇති වන හද කම්පනය කරුණාව නම් වන බව
- අන් අයගේ සැපතට, දියුණුවට ඊර්ෂ්‍යා නොකිරීම හා  එම සැපත දියුණුව පිළිබඳ බලවත් කැමැත්තකින් පසුවීම මුදිතාව බව (පරමත්ථජෝතිකා අටුවාව)
- උපේක්ෂාව යන්නෙන් අදහස් කරන්නේ නිබඳව ම මධ්‍යස්ථව අන්‍යෝන්‍ය සුහදතාවෙන් කටයුතු කිරීම බව

- සතර බ්‍රහ්ම විහරණ පුද්ගලයාට මෙන් ම සමාජයට ද අදාළ වන අතර ඒවා වඩාත් පුද්ගල චින්තනය වෙත යොමු වී ඇති බව
- බ්‍රහ්ම විහාර අන්‍යෝන්‍ය ගෞරවය, සුහදත්වය, සහජීවනය පිණිස ඉවහල් වන බව
- මෙලොව හා පරලොව ප්‍රගතිය සඳහා බ්‍රහ්ම විහාර උපකාර වන බව
- දරුවන් කේන්ද්‍ර කරගෙන දෙමාපියන්ගේ සිත් තුළ සතර බඹ විහරණ ක්‍රියාත්මක වන බැවින් බුදු රජාණන් වහන්සේ මවුපියන් ''බ්‍රහ්ම'' නාමයෙන් හඳුන්වා ඇති බව.

(සබ්‍රහ්ම සූත්‍රය-අ.නි. 2.)

- බ්‍රහ්ම විහාර ප්‍රගුණ කිරීමෙන් පුද්ගලයා පිළිවෙළින් බ්‍රහ්මකායික, ආභස්සර, සුභකිණ්හ, වෙහප්ඵල දෙවියන් අතර උපදින්නේ යයි දේශනාවේ සඳහන් වන බව. (තතිය පුද්ගල සූත්‍රය - අ.නි.2.)

**ශ්‍රද්ධාව හා භක්තිය අතර වෙනස**

- ''ශ්‍රද්ධාව'' යන්නෙන් අවබෝධයෙන් යුතුව පැහැදීම අර්ථවත් වන බව
- තථාගතයන් වහන්සේ සම්මා සම්බුද්ධ යැයි ද උන් වහන්සේ නව අරහාදි බුදුගුණයෙන් යුක්ත යැයි ද අවබෝධයෙන් යුතු ව පිළිගැනීම ශ්‍රද්ධාව වන බව. (සේඛ සූත්‍රය -ම.නි. 2 )
- ත්‍රිවිධ රත්නය පිළිබඳ ප්‍රබුද්ධ සංවේදීතාව බෞද්ධ ශ්‍රද්ධාව බව

(චුල්ලහත්ථිපදෝපම සූත්‍රය-ම.නි. 1)

- බුදු දහමේ දී ශ්‍රද්ධාව ආචාර විද්‍යාත්මකවූත්, මනෝවිද්‍යාත්මකවූත්, මීමාංසාත්මකවූත් පුළුල් අර්ථයකින් භාවිත වන බව.
- නිර්මාණවාදී ආගම්වල පාරභෞතික බලවේග කෙරෙහි භක්තිය හා විශ්වාසය වැඩීමට උගන්වන අතර බුදුසමය එවැන්නක් අගය නොකරන බව
- එම ආගම්වල භක්තිය හා විශ්වාස මූලික වන බව
- බෞද්ධ ශ්‍රද්ධාව විමුක්තිගාමී ප්‍රතිපදාවේ ප්‍රවේශය වන අතර එය භාවමය දියුණුවට උපකාරී වන බව
- තථාගත බෝධියෙහි නිසැක බව නම් වූ ශ්‍රද්ධාව උපදවා ගත යුත්තේ වීමංසනය මුල් කොට ගෙන මිස අන්ධ භක්ති මාත්‍රයකින් හෝ විශ්වාස මාත්‍රයකින් හෝ නොවන බව

(වීමංසක සූත්‍රය-ම.නි. 1 )

- විධිමත් ව විචාරපූර්වක ව හා ඉවසිලිමත් ව කරුණු සලකා බැලීමෙන් උපදවා ගන්නා ලද ශ්‍රද්ධා ගුණයෙන් යුතු ශ්‍රාවකයා තෙරුවන් පිළිබඳ භක්තියෙන් තොරව අවබෝධයෙන් ක්‍රියා කරන බව. (ධම්මචේතිය සූත්‍රය-ම.නි. 2 )
- බෞද්ධ ශ්‍රද්ධාව ප්‍රඥාවත් සමඟ සමාන්තර වන බව
- ශ්‍රද්ධාව බෞද්ධ ප්‍රතිපදාව අනුගමනය කිරීම මඟින් ඇතිවන හා ඥාන ප්‍රතිලාභය පිණිස පුද්ගලයා පොලඹවන මනෝභාවයක් වන බව
- ශ්‍රද්ධාව බලයක්, ඉන්ද්‍රියයක්, ධනයක් වශයෙන් හඳුන්වා දී ඇති අතර එහි විවිධ ප්‍රභේද පෙළෙහි දක්වෙන බව
- සද්ධානුසාරී හා ධම්මානුසාරී යනුවෙන් ආර්ය මාර්ගයට එළඹෙන මාර්ග දෙකක් ඇති බව
- ප්‍රඥාවෙන් කරුණු අවබෝධ කළ පසු ශ්‍රද්ධාව අවශ්‍ය නොවන නිසා රහතන් වහන්සේ ''අශ්‍රද්ධ'' යනුවෙන් හැඳින්වෙන බව

**අමූලිකා ශ්‍රද්ධාව**

- අමූලිකා ශ්‍රද්ධාව හා ආකාරවතී ශ්‍රද්ධාව යනුවෙන් බුදු දහමෙහි ශ්‍රද්ධාව දෙයාකාරයකින් පැහැදිලි කෙරෙන බව
- විධිමත් ව, විචාර පූර්වක ව කරුණු සලකා බැලීමෙන් තොර ව, අමූලික ව, අහේතුක ව, උපදවාගත් හුදු භක්ති මාත්‍ර හැඟීම අමූලිකා ශ්‍රද්ධාව නම් වන බව
- හේතු යුක්ති සහගත නොවන ඥාන විභාගීය පදනමකින් තොර ශ්‍රද්ධාව අමූලිකා ශ්‍රද්ධාව යනුවෙන් හැඳින්වෙන අතර එය පෙළෙහි අන්ධ වේණුපමාවෙන් දැක්වෙන බව

(චංකී සූත්‍රය-ම.නි. 1 )

- අමූලිකා ශ්‍රද්ධාව බුදුසමය අගය නොකරන බව

**ආකාරවතී ශ්‍රද්ධාව**

- බුද්ධාදි රත්නත්‍රයේ ගුණ දැන දැක නුවණින් කරුණු සලකා උපදවාගත් බුද්ධිමය පදනමක් ඇති පැහැදීම හා නිසැක බව ආකාරවතී ශ්‍රද්ධාව නම් වන බව.
- එම ශ්‍රද්ධාව තෙරුවන් පිළිබඳ විමසා බැසගත් තම අවබෝධය මත පිහිටි සැබෑ ශ්‍රද්ධාව වන අතර එය අවෙච්චප්පසාදය යනුවෙන් හැඳින්වෙන බව. (වීමංසක සූත්‍රය-ම.නි. 1 )
- සද්ධානුසාරී හා ධම්මානුසාරී ශ්‍රාවකයාට ආර්යභාවයට පත් වූ පසු ඇති වන්නේ එම අවෙච්චප්පසාදය බව
- බුද්ධෙ අවෙච්චප්පසාද, ධම්මෙ අවෙච්චප්පසාද, සංඝෙ අවෙච්චප්පසාද යනුවෙන් සෝතාපත්ති අංග අතර සඳහන් වන්නේ ආකාරවතී ශ්‍රද්ධාව බව

**කර්මය හා පුනර්භවය**

**කර්මය**

- චේතනා පූර්ව ක්‍රියාව කර්මය ලෙස බුදු දහම උගන්වන බව

(නිබ්බේධික පරියාය සූත්‍රය-අ.නි. 4)

- බෞද්ධ කර්ම සංකල්පය මනෝවිද්‍යාත්මක හා ආචාර විද්‍යාත්මක පදනමක් සහිත වන බව
- ලෝභය, ද්වේශය හා මෝහ මුල්කොට ගෙන සිදු කරන අකුශල ක්‍රියා මෙන් ම අලෝභය, අදෝසය, අමෝහය මුල්කොට ගෙන සිදු කරන කුසල ක්‍රියා කර්ම නමින් හැඳින්වෙන බව
- අනුරූප විපාකය අනුව ද කුශලාකුශල කර්ම තීරණය කෙරෙන බව
- ඒ අනුව දුක් විපාක අකුශල කර්ම මඟින් ඇති වන බව හා සැප විපාක කුශල කර්ම මඟින් ඇති වන බව (ධම්ම පදය - යමක වග්ගය-ඛු.නි.1)
- කර්මය විපාක දීම දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරිය, අහෝසි වශයෙන් ද කෘත්‍ය ලෙස ජනක, උපත්ථම්භක, උපපීඩක, උපඝාතක වශයෙන් හා විපාක දෙන ආකාරය අනුව ගරුක, ආසන්න. ආචින්න, කටත්තා වශයෙන් ද ප්‍රභේද කොට දක්වා ඇති බව
- සාංසාරික සත්ත්වයාගේ හීන ප්‍රණීතභාවය කර්මානුරූපව සිදුවන බව

(චූල්ලකම්ම විභංග සූත්‍රය-ම.නි.3.)

- බුදු දහමට අනුව කර්මය ඉක්ම විය හැකි ය. එය ''කම්මක්ඛය'' නමින් හැඳින්වෙන අතර ඒ සඳහා නිර්දේශිත ප්‍රතිපදාව ආර්ය අෂ්ටාංගික මාර්ගය බව

- කර්ම පථය ප්‍රතිසන්ධි හා ප්‍රවෘත්ති යන විපාක ලබාදෙන අතර කර්මය ප්‍රවෘත්ති විපාක පමණක් ලබා දෙන බව
- කුශලාකුශල කර්මවලට අනුරූපව විපාක ලැබීම පිළිගන්නා බුදුදහම සියල්ල කර්මයට අනුව සිදු නොවන්නේ යැයි පෙන්වා දෙන බව (නියාම ධර්ම -අ.නි. 6, පංචම නිපාතය-අ.නි)
  (ගිරිමානන්ද සූත්‍රය- අ.නි.6 දසම නිපාතය)
- මෙලොව ආයුෂ ප්‍රමාණය, සෞඛ්‍යය, ශාරීරික පෙනුම, සාමාජික පිළිගැනීම, ආර්ථික තත්ත්වය කෙරෙහි බලපාන සාධක අතර කර්මය එකක් පමණක් බව.

පුනර්භවය

- කුශලාකුශල කර්මානුරූප ව සත්ත්වයා නැවත නැවතත් සසර තුළ හට ගැනීම පුනර්භවය වන බව
- කුශලාකුශල කර්ම ද අනුරූප විපාක ද ඇති බැවින් හා එම විපාක කර්මානුරූපව හට ගන්නා බැවින් පුනර්භවයක් ඇතැයි පුරාණාචාර්යවරුන් දක්වා ඇති බව

''කම්ම විපාකා වත්තන්ති - විපාකො කම්ම සම්භවො
තස්මා පුනබ්භවො හෝති - ඒවං ලොකො පවත්තතී''
(විසුද්ධි මග්ගය)

- අතීත හා වර්තමාන කුශලාකුශල කර්ම ක්ෂය කළ විමුක්ත පුද්ගලයා සසර සැරිසරන්නේ නැතැයි බුදුදහමේ ඉගැන්වෙන බව
  (රතන සූත්‍රය-ඛු.නි. ''ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං .....'')
- ප්‍රතීත්‍ය සමුප්පන්න ව සැකසෙන විඤ්ඤාණ ප්‍රවාහය පුනර්භව බීජය වන බව
  (ආනන්ද වග්ගය-අ.නි. ''විඤ්ඤාණ බීජං ........'')
- ඵස්ස, වේදනා, සංඥා, චේතනා මනසිකාර යන නාම ධර්ම පහ මඟින් විඤ්ඤාණය බිහිවන අතර චේතනා නම් නාම ධර්මයෙහි කර්ම ශක්තිය ගැබ් වී පවතින බව
- පුද්ගල සන්තානයෙහි පවතින සංඛාර (චේතනා, කර්ම) ශක්තියට අනුරූපව ව උපදින විඤ්ඤාණය වෙනත් සුදුසු තැනක ගැටී තවත් නාම රූප පරම්පරාවක පැවැත්ම සිදු කරන අතර එය පුනර්භවය ලෙස හඳුන්වන බව
- පටිච්චසමුප්පාදයේ ''සංඛාර පච්චයා විඤ්ඤාණං විඤ්ඤාණ පච්චයා නාම රූපං'' යනුවෙන් දැක්වෙනුයේ එම අවස්ථාව බව
- පුද්ගලයාගේ සචේතන චර්යාව කුසලාකුසල වශයෙන් දෙයාකාර වන අතර සචේතනික ක්‍රියා පුනර්භවයට කරන බලපෑම සුගති දුගතීන්හි ඉපදීමට හේතුවන බව
- දස අකුසල් කිරීමෙන් මරණින් මතු දුගති සංඛ්‍යාත අපාය ආදියෙහි උපදින බව
- දස අකුසලයන්ගෙන් වැළකීමෙන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගයෙහි උපදින බව
- කර්මානුරූප ව සසර උපදින සත්ත්වයාගේ පැවැත්ම කාම, රූප අරූප වශයෙන් තෙවැදෑරුම් වන අතර එහි විචිත්‍රත්වය අනුව ප්‍රතිසන්ධි තල 31ක් බව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. වෙසක් පුරපසළොස්වක හෝ පොසොන්පුර පසළොස්වක පොහෝ දිනය නිමිති කරගෙන ඔබේ පාසලේ සීල භාවනා වැඩසටහනක් සංවිධානය කරන්න.
2. දශ පුණ්‍ය ක්‍රියා දැක්වෙන පාලි පාඨය පුවරුවක ලියා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
3. ඔබේ ප්‍රදේශයේ ඇති රෝහලක් හෝ වැඩිහිටි නිවාසයක් හෝ ළමා නිවාසයක් තෝරාගෙන සත්කාරක සේවා වැඩසටහනක් සංවිධානය කරන්න.
4. විමුක්තිය සාධනයේ දී ශ්‍රද්ධාවේ ප්‍රායෝගික වැදගත්කම පිළිබඳ ව ''බුදුසරණ' පුවත්පතට ලිපියක් ලියන්න.
5. බුද්ධකාලීන භාරතීය අකිරියවාදය සහ බෞද්ධ කර්ම සංකල්පය තුලනාත්මක ව අධ්‍යයනය කරන්න.
6. පුනර්භවය ධර්මානුකූල ව පැහැදිලි කෙරෙන පොත් පිංචක් නිර්මාණය කරන්න.

**පරිශීලනයට**

- මඛාදේව සූත්‍රය - මජ්ඣිම නිකාය
- අම්බලට්ඨිකරාහුලෝවාද සූත්‍රය - මජ්ඣිම නිකාය
- වේරඤ්ජක සූත්‍රය - මජ්ඣිම නිකාය
- සේඛ සූත්‍රය - මජ්ඣිම නිකාය
- චූල්ලහත්ථිපදෝපම සූත්‍රය - මජ්ඣිම නිකාය
- ධම්මචේතිය සූත්‍රය - මජ්ඣිම නිකාය
- චංකී සූත්‍රය - මජ්ඣිම නිකාය
- වීමංසක සූත්‍රය - මජ්ඣිම නිකාය
- චූල්ලකම්ම විභංග සූත්‍රය - මජ්ඣිම නිකාය
- පංචභයවේර සූත්‍රය - සංයුක්ත නිකාය
- මහාවග්ගය 1 සූත්‍රය - අංගුත්තර නිකාය
- දේවදූත වග්ගය - අංගුත්තර නිකාය
- මහා වග්ගය - අංගුත්තර නිකාය
- තතිය පුද්ගල වග්ගය - අංගුත්තර නිකාය
- ආනන්ද වග්ගය - අංගුත්තර නිකාය
- වේළුද්වාරෙය්‍ය සූත්‍රය - අංගුත්තර නිකාය
- නිබ්බේධ පරියාය සූත්‍රය - අංගුත්තර නිකාය
- ධම්මපදය (යමක වග්ගය) - ඛුද්දක නිකාය
- මෙත්ත සූත්‍රය - සුත්ත නිපාතය
- රතන සූත්‍රය - සුත්ත නිපාතය

| | | |
|---|---|---|
| බෞද්ධ සංස්කෘතිය | - | දේවාලේගම මේධානන්ද හිමි<br>තැරැලේ ධම්මරතන හිමි<br>ඩබ්.ඒ. ගාමිණී විජයසිංහ |
| ආදී බෞද්ධ දර්ශනයේ මූලධර්ම | - | දෙල්දූවේ ඤාණසුමන හිමි |
| බෞද්ධ අධ්‍යයන මීමංසා | - | දේවාලේගම මේධානන්ද හිමි |
| බෞද්ධ විශ්වාසය සහ ප්‍රතිපදාව | - | කිරින්දේ ධම්මානන්ද හිමි |
| බෞද්ධ සදාචාරයේ මූලධර්ම | - | ගුණපාල ධර්මසිරි |
| කර්මය හා පුනර්භවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම | - | කේ.කේ.කුලතුංග |
| නිවන් මඟ ශාස්ත්‍රීය සංග්‍රහය | - | (28 හා 46 කලාපය) |

**නිපුණතාව 9.0** : බෞද්ධ ආර්ථික හා දේශපාලන චින්තනය තේරුම් ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 9.1** : ධනෝපායනය හා කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පදනම් කරගත් දැහැමි දිවිපෙවතක් ගත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 30 යි.

**ඉගෙනුම් පල** :

- ධනෝපායනය හා කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විශ්ලේෂණය කරයි.
- ගෘහස්ථ ජීවිතයට ආර්ථික සමෘද්ධිය අත්‍යවශ්‍ය සාධකයක් ලෙස පිළිගනියි.
- ධාර්මිකව ධනය උපයයි.
- බෞද්ධ ආර්ථික දර්ශනයට අනුකූලව ජීවත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ධනය පිළිබඳ බෞද්ධ අර්ථකථනය අවබෝධ කරගෙන ධාර්මික ව ධනය උපයා, අරපිරිමැසුම්දායක මෙන් ම යුතුකම් හා වගකීම් ඉටුකරන පරිභෝජන රටාවක් සකසා ගැනීමට ශිෂ්‍යයා පොළඹවීම මෙමඟින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :

**ධනය පිළිබඳ බෞද්ධ ආකල්පය**

- භෞතික සම්පත් මෙන් ම ආධ්‍යාත්මික ගුණවත්කම ද ධනය වශයෙන් අර්ථකථනය කෙරෙන බව.
  (අං.නි. 4 සත්තක නිපාතයේ ධන වග්ගයේ එන සංඛිත්ත ධන, විත්ථතධන, උග්ගමහා මත්ත සූත්‍රය ආදි දේශනා)
- ගෘහස්ථයාට දිළිඳුකම දුකක් යැයි දේශනා කොට ඇති නිසා ජීවත්වීමට ප්‍රමාණවත් ධනය උපයාගත යුතු යැයි බුදුසමය පිළිගන්නා බව. (ඉණ සූත්‍රය -අං.නි.4 )
- ලෞකික දියුණුව, ලෝකෝත්තර දියුණුව යන ධන දෙක ම නැති අන්ධයාත් ඉන් එකක් ඇති එකැස් අන්ධයාත් ඇසුරු නොකොට ඒ දෙක ම දකින ද්වි චක්ඛු පුද්ගලයා ඇසුරු කරන්නැයි දේශිත බැවින් භෞතික හා ආධ්‍යාත්මික ධන දෙක ම බුදුසමය අවධාරණය කරන බව
  (අන්ධේක චක්ඛු සූත්‍රය-අ.නි.1)
- සද්ධා, සීල, හිරි ඔත්තප්ප, සුත, චාග, පඤ්ඤා යන ධන ආධ්‍යාත්මික දියුණුව සඳහා බුදුදහම උගන්වා ඇති බව. (සංඛිත්ත ධන සූත්‍රය /විත්ථත ධන සූත්‍රය-අං.නි.4)
- දිළිඳුකම →ණය ගැනීම → පොළීවීම→ චෝදනාවට ලක්වීම→ලුහුබැඳීම→සිරගත කිරීම එකිනෙකට හේතුප්‍රත්‍යව දිළින්දාට සිදුවන විපත් ලෙස බුදුසමය උගන්වා ඇති බව.
  (ඉණ සූත්‍රය-අං.නි. 4)

- ශ්‍රද්ධාව, ලජ්ජාව, භය, වීර්යය, ප්‍රඥාව නැති තැනැත්තා දිළින්දාට ද, ඔහු කයින්, වචනයෙන් මනසින් වැරදි කිරීම ණය ගැනීමට ද, ඒවා මතක් වන වට විපාක වැඩිවීම පොළියට ද, තමාම තමාට චෝදනා කර ගැනීම චෝදනාවට ද, පාපය පසුපස පැමිණීම ලුහු බැඳීමට ද තිරිසන් යෝනියේ හෝ නරකයේ උපත ලැබීම බන්ධනය ද වශයෙන් ආධ්‍යාත්මික පිරිහීම දිළිඳුකම වශයෙන් උගන්වා ඇති බව
- ථාවර, ජංගම, අංගසම, අනුගාමික වශයෙන් ධන සම්පත් හතරක් පිළිබඳ ව අවධාරණය කොට ඇති බව. (වණිජ්ජා සූත්‍රය-අ.නි.2)
- සත්තබොජ්ඣංග ධර්ම නොවැඩූ තැනැත්තා දිළින්දෙක් යැයි දේශනා කොට ඇති බව. (දාළිද්ද සූත්‍රය-ස.නි. 5)
- අධාර්මිකව ධනය සොයන්නා, තම සැප නොවිඳින නොපිනවන, අනුන්ට බෙදා නොදෙන පින් නොකරන පුද්ගලයා ගැරහිය යුතු යැයි දේශනා කොට ඇති බව. (රාසිය සූත්‍රය-සං.නි. 4)


**ඉපයීම, ආයෝජනය හා පරිභෝජනය**

- ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා ආජීවයෙන් ධර්මික ධනෝපායනය උගන්වා ඇති බව
- බඹරකු මල් රොන් ගන්නා සේ සමාජයට පීඩාවක් නොවන පරිදි ධනය ඉපයිය යුතු යැයි උගන්වා ඇති බව (සිගාලෝවාද සූත්‍රය-දී.නි.3)
- තමා සතු ව ප්‍රමාණවත් ධනයක් ඇති සතුට අත්ථි සුඛය ලෙස උගන්වා ඇති බව (අනණ සූත්‍රය-අ.නි.2)
- ධනෝපායනය සඳහා නොකළ යුතු වෙළඳාම් පහක් ඇති බව
- කිරුම් මිනුම් භාවිතයේ දී ධාර්මික විය යුතු යැයි උගන්වා ඇති බව
- ගිහි ජීවිතයේ දී දිළිඳුකම දුකක් යැයි දේශනා කොට ඇති බව. (ඉණ සූත්‍රය-අං.නි. 4)
- උත්සාහයෙන් (උට්ඨාන සම්පදා) ධනෝපායනයෙහි නිරත විය යුතු යැයි දේශනා කොට ඇති බව. (ව්‍යග්ඝපජ්ජ සූත්‍රය-අං.නි.5)
- ධනෝපායනයේ දී අනලස් ව ක්‍රියා කළ යුතු යැයි උගන්වා ඇති බව (සිගාලෝවාද සූත්‍රය-දී.නි. 3)
- වීර්යයෙන් දුප්පත්කම නැති කළ හැකි බව. (ආලවක සූත්‍රය-ස.නි.1)
- ආධ්‍යාත්මික සංවර්ධනයට හානිකර නොවූ ධනෝපායනය බුදු දහම විසින් නිර්දේශිත බව (ධනිය සූත්‍රය-සු.නි.)
- මංගල සූත්‍ර දේශනාවේ දී ද භෞතික හා ආධ්‍යාත්මික සංවර්ධනය අගය කෙරෙන බව
- පරාභව කරුණු මගහැර ධන ඉපැයීමට යොමුවිය යුතු බව
- ධනෝපායනයේ දි අල්පෙච්ඡතාව අත්නොහැර ක්‍රියා කළ යුතු බව
- ධනෝපායනයේ දී මහිච්ඡතාව විවිධ ගැටලු උපදවන බව
- ලද පමණින් සතුටුවීම, පහසුවෙන් පෝෂණය කළ හැකිවීම, අල්ප කෘත්‍ය ඇති බව හා සැහැල්ලුව, අල්පේච්ඡතාව තුළින් උපදින බව (මෙත්ත සූත්‍රය -සු.නි.)
- ඡන්ද, දෝස, භය, මෝහ යන අගතීන්ගෙන් යුක්ත තැනැත්තාගේ ධනය අවපක්ෂයේ සඳමෙන් පිරිහෙන බවත් එම අගතීන්ගෙන් මිදුණු තැනැත්තාගේ ධනය පුර පක්ෂයෙහි සඳ මෙන් බබළන බවත් උගන්වා ඇති බව. (සිගාලෝවාද සූත්‍රය-දීනි. 3)

- සිල්වතා ශීලයෙහි ආනිසංස වශයෙන් මහත් භෝග සම්පත් ලබන බව
(මහාපරිනිබ්බාණ සූත්‍රය -දී. නි. 2 )
- ධනෝපායනය විෂයෙහි රාජ්‍යය දැක්විය යුතු අනුග්‍රහය කූටදන්ත, චක්කවත්තී සීහනාද ආදී සූත්‍ර දේශනාවල දී පැහැදිලි කොට ඇති බව.
- රජු අධාර්මික වූ කල්හි නිලධරයන් ද, ගම් නියම්ගම් වැසියන් ද අධාර්මික වන බවත් ඒ අනුව ස්වභාව ධර්මය පවා විකෘති වී ධාන්‍ය අනිසි ලෙස සැකසී ජනතාව දුර්වර්ණ දුර්වල අබාධ සහිත වන්නේ යැයි දේශනා කොට ඇති බව (අධම්මික සූත්‍රය-අ.නි. 2 )
- පුද්ගල සංවර්ධනය හෙවත් ධනෝපායනය බුදුසමයට අනුව සදාචාරාත්මක විය යුතු යැයි අවධාරණය කෙරෙන බව
- අය හා වැය පිළිබඳ අවබෝධයෙන් හෙවත් සමජීවිකතාව අනුව ධන පරිහරණය කළ යුතු බව
(ව්‍යග්ගපජ්ජ සූත්‍රය-අ. නි. 5, )
- තුලාධාරෝපමාව, උදුම්බරඛාදිකෝපමාව, තලාකෝපමාව වැනි උපමාවලින් සමජීවී කතාව අවධාරිත බව
- ධනයෙන් එක් කොටසක් පරිභෝජනයට ද කොටස් දෙකක් කර්මාන්තාදියේ දියුණුවට ද එක් කොටසක් ආපදා අවස්ථාවක දී පරිහරණයට ද වශයෙන් භාවිත කළ යුතු යැයි උගන්වා ඇති බව (සිගාලක සූත්‍රය-දී.නි.3)
- අං.නි.2 පත්ත කම්ම සූත්‍රය සහ අපුත්තක සූත්‍රවලට අනුව
  1. තමාගේ, මවුපියන්ගේ, අඹුදරුවන්ගේ, සේවක - සේවිකාවන්ගේ හිත මිතුරන්ගේ සුඛ විහරණය,
  2. ගින්නෙන්, ජලයෙන්, රජුගෙන්. සොරුන්ගෙන්, නොකැමැති අයට අයිති වීමෙන් සිදුවන විපතින් රැක ගනියි.
  3. ඥාතීන්ට, ආගන්තුකයන්ට, මළගියවුන්ට, රජුන්ට හා දෙවියන් ද අදාළ යුතුකම් ඉටුකිරීම (පඤ්චබලී)
  4. ආත්ම දමනයෙන් යුත්, කෙලෙස් සමනය කරන, කෙලෙස් නිවූ ආගමික උතුමන්ට පූජා පැවැත්වීම යන යුතුකම් ඉටු කළ යුතු බව
- රාසිය සූත්‍රයට අනුව
  1. සැහැසිකම් නොකොට දැහැමින් ධනය ඉපයීම
  2. උපයාගත් ධනයෙන් තමා සැපවත් කිරීම, පිනවීම.
  3. බෙදාදීම, පින් කිරීම.
  4. ඉපැයූ ධනයෙහි ම ගිජුකමින් නොඇලීම, මුසපත් නොවීම, එසේ වීමේ ආදීනව දකිමින් නිස්සරණ දැක්මෙන් පරිභෝග කිරීම.
- මංගල කරුණු ඉටු කරමින්, පරාභව කරුණු මග හරිමින් අල්පේච්ඡ ව ධනය පරිහරණය කළ යුතු බව
- මා උපයාගත් වස්තුව ධාර්මික යැයි ද, ඒවා පරිභෝග කරමියි යැයි ද, පින් දහම් කරමි යැයි ද, කිසි වෙකුට කුඩා හෝ ණයක් නැතැයි ද තිදොරින් ම නිවැරදි යැයි ද සිතා සතුටට පත්වීම ගිහියා විසින් කළ යුතු, කළ හැකි දෙයක් ලෙස බුදු දහම අවධාරිත බව. (අනණ සූත්‍රය-අං.නි. 2 )

**ආර්ථික සුරක්ෂිතතාව හා සම්පත් කළමනාකරණය**

- ආර්ථික සුරක්ෂිතතාව හා සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ආකල්පය, ඉපයීම, ආයෝජනය හා පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම මඟින් අර්ථවත් වන බව




- කළමනාකරණය යනුවෙන් චක්‍රීය ක්‍රියාවලියක් අර්ථවත් වන බව
- උත්සාහ සම්පත්තිය, ආරක්ෂා සම්පත්තිය, කල්‍යාණ මිත්‍ර සම්පත්තිය හා සමජීවිකතාව මඟින් ආර්ථික සුරක්ෂිතතාව සිදුවන බව
- සිගාලෝවාද සූත්‍රාගත ධන පරිහරණ උපදේශය අනුගමනය කිරීම මඟින් ආර්ථික සුරක්ෂිතතාව ඇති වන බව
- පත්තකම්ම සූත්‍රාගත පඤ්චබලි සංකල්පය අනුගමනයෙන් ධනයේ සුරක්ෂිතතාවත් සම්පත් කළමනාකරණයත් අවධාරණය කෙරෙන බව
- අංගුත්තර නිකායේ කුල සූත්‍රයෙහි එන
- නැසුණු සම්පත් ඉපයීම (නට්ඨං ගවෙසන්ති)
  දිරූ දේ ප්‍රතිසංස්කරණය කිරීම (ජිණ්ණං පටිසංකරොන්ති)
  පරිභෝජනයේ සීමා දැන සිටීම (පරිමිත පාන භෝජනා හොන්ති)
  සිල්වත් ස්ත්‍රියක හෝ පුරුෂයෙකු හෝ ආධිපත්‍යයෙහි තැබීම (සීලවන්තං ඉත්ථිං වා පුරිසං වා ආධිපච්චෙ ඨපෙන්ති)

  යන ඉගැන්වීම මඟින් ආර්ථික සුරක්ෂිතතාව ප්‍රකාශ කෙරෙන බව
- සංඝ සමාජයේ සිවුපසය පරිහරණය හා සාංඝික දේපළ පරිහරණය පිළිබඳ පැනවීම් මීට ආදර්ශයක් වන බව
- ආනන්ද හිමියන් කොසොල් රජුගේ අන්තඃපුරවාසීන්ට ධර්ම දේශනා කළ අවස්ථාවේ ලැබුණු සළු පන්සීය පිළිබඳ ව කොසොල් රජතුමා කළ ගවේෂණයෙන් හෙළිවූ කරුණු මඟින් මේ පිළිබඳ බෞද්ධ ආකල්පය සනාථ වන බව.
  අවශ්‍යතා දැන පරිභෝජනය කිරීම (අගථිත)
  අසීමිත ආශාවන්ගෙන් මුළා නොවීම (අමුච්ඡිත)
  අන්ධයකු මෙන් ආශාවන් පසුපස නොයෑම (අනජ්ඣාපන්න)
  සම්පත් භාවිතයෙන් වැරදි දේට නොයෑම (ආදීනව දස්සාවී)
  වෙන් වීම හෙවත් මිදීම (නිස්සරණ පඤ්ඤා)

  යන ඉගැන්වීම මඟින් මෙම කරුණු අවධාරිත බව

**ආර්ථිකය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පදනම් කරගත් ජීවන දර්ශනය**

- ධනය ඉපයීම, පරිභෝජනය, ආයෝජනය, කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මඟින් බෞද්ධ ජීවන දර්ශනය ප්‍රකට වන බව
- ත්‍රිලක්ෂණය, කර්මය, පුනර්භවය, මධ්‍යම ප්‍රතිපදාව පටිච්ච සමුප්පාදය වැනි මූලික ඉගැන්වීම් මඟින් පවා බෞද්ධ ආර්ථික දර්ශනයේ පදනම සකසන බව
- සාමකාමී, ස්වයංපෝෂිත, දැහැමි, විවේකී නිරෝගී සමාජයක් මෙලොව බිහිකිරීමට බෞද්ධ ආර්ථික දර්ශනයෙන් මනා පිටුබලයක් ලැබෙන බව
- සංඝ සමාජය ආදර්ශනය කිරීම මඟින් ගිහියාට ද සරල, සුභර, තෘප්තිමත් ආර්ථික දර්ශනයක් හා ජීවන දර්ශනයක් සකසා ගත හැකි බව (සිවුපස පරිභෝජනය)
- ධාර්මික ධනෝපායනයත් පරිභෝජනයත් පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මඟින් අසාහසිකවූත් සමාජ යුතුකම් ඉටු කරන්නාවූත් යහපත් ජීවන දර්ශනයකට අනුබල ලැබෙන බව

  (රාසිය සූත්‍රය- ස.නි.4, පත්තකම්ම සූත්‍රය-අ.නි.2)
- උට්ඨාන සම්පදාව හා බැඳුණු ආරම්භ ධාතු, පරක්කම ධාතු ආදී ඉගැන්වීම් ද අනලස් නොවීම පිළිබඳ ඉගැන්වීම ද ක්‍රියාශීලී ජීවන දර්ශනයකට මඟ පෙන්වන බව
- ෂු මාකර් වැනි විද්වතුන් පවා සරල බව හා අවිහිංසාව පදනම් කොටගත් බෞද්ධ ආර්ථික දර්ශනය අගය කොට ඇති බව
- ධනෝපාර්ජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි ලා රාජ්‍ය කාර්යභාරය මෙන් ම පුද්ගල කාර්යභාරය ද ධාර්මික විය යුතු යැයි අවධාරණය කරන අතර දේශපාලන සංස්ථාවත් සමාජ සංස්ථාවත් ධාර්මික ව කටයුතු කිරීම බෞද්ධ ජීවන දර්ශනයට අදාළ බව

  (කූටදන්ත සූත්‍රය-දී.නි. 1, චක්කවත්ති සීහනාද සූත්‍රය-දී.නි. 3, පත්තකම්ම සූත්‍රය-අ.නි.2)
- ධන විනාශ මුඛ, පරාභව කරුණු ආදියෙන් බැහැර වූ ආර්ථික කළමනාකරණය පිළිබඳ ඉගැන්වීම් මඟින් සදාචාරවත් ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට මඟ පෙන්වන බව

  (පරාභව සූත්‍රය-ස.නි. 4, සිගාල සූත්‍රය-දී.නි.3)

- තම අවශ්‍යතා ඉටු කර ගනිමින් සමාජ සම්බන්ධතා හා බැඳුණු යුතුකම් හා වගකීම් මැනවින් ඉටු කරන ප්‍රීතිමත් එමෙන් ම අල්පේච්ඡ දිවිපැවැත්මකට මඟ පෙන්වීම බෞද්ධ ආර්ථික දර්ශනයේ සුවිශේෂත්වය බව
- පරාභව, මංගල, කරණීය, වසල, සිගාලෝවාද, පත්තකම්ම, රාසිය, අන්ධ, වණිජ්ජා, දාළිද්ද, සංඛිත්ත ධන, අපුත්තක, ව්‍යග්ගපජ්ජ, ධනිය, චක්කවත්ති සිහනාද, මහාපරිනිබ්බාණ, ඉණ, අණන, කුල ආදී බොහෝ සූත්‍ර දේශනා අනුව ආර්ථිකය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මඟින් විශිෂ්ට ජීවන දර්ශනයක් ප්‍රකාශ වන බව
- ධනෝපායනය ජීවිතයක උතුම් අරමුණ නොවිය යුතු අතර සොයාගත් ධනය ද අගතිථ, අමුච්ඡිත, අනජ්ඣාපන්න, ආදීනව දස්සාවී, නිස්සරණ පඤ්ඤාවෙන් යුතු ව පරිභෝජනය කිරීමට මඟ පෙන්වීම බෞද්ධ ජීවන දර්ශනය බව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. ධනෝපායනය, ධන කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වලට අදාළ සූත්‍ර පාඨ රැස් කරන්න.
2. ස්වයංපෝෂිත නිරෝගී දැහැමි සමාජයක් නිර්මාණය කර ගැනීමෙහිලා බෞද්ධ සූත්‍රාගත ඉගැන්වීම අදාළ කර ගත හැකි අයුරු පිළිබඳ ව යෝජනා මාලාවක් සකසන්න.
3. ධනය පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කරමින් පුවත්පතකට ලිපියක් ලියන්න.
4. ධනය ඉපයීම පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කරමින් සාකච්ඡාවක් සංවිධානය කරන්න.
5. ආර්ථික සුරක්ෂිතතාව ඇති කර ගැනීමට උපදෙස් ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරන්න.
6. ''බෞද්ධ ආර්ථිකය නූතනයට ගැළපෙන අයුරු'' මැයෙන් ධර්ම පත්‍රිකාවක් නිර්මාණය කරන්න.

**පරිශීලනයට**

- කූටදන්ත සූත්‍රය - දීඝ නිකාය
- මහාපරිනිබ්බාන සූත්‍රය - දීඝ නිකාය
- සිගාලෝවාද සූත්‍රය - දීඝ නිකාය
- චක්කවත්ති සීහනාද සූත්‍රය - දීඝ නිකාය
- ආලවක සූත්‍රය - සංයුත්ත නිකාය
- රාසිය සූත්‍රය - සංයුත්ත නිකාය
- දාළිද්ද සූත්‍රය - සංයුත්ත නිකාය
- පරාභව සූත්‍රය - සංයුත්ත නිකාය
- අන්ධකචක්ඛු සූත්‍රය - අංගුත්තර නිකාය
- වණිජ්ජා සූත්‍රය - අංගුත්තර නිකාය
- අනණ සූත්‍රය - අංගුත්තර නිකාය
- අධම්මික සූත්‍රය - අංගුත්තර නිකාය
- පත්තකම්ම සූත්‍රය - අංගුත්තර නිකාය
- සංඛිත්ත ධන සූත්‍රය - අංගුත්තර නිකාය
- විත්ථත ධන සූත්‍රය - අංගුත්තර නිකාය
- ඉණ සූත්‍රය - අංගුත්තර නිකාය
- ව්‍යග්ඝපජ්ජ සූත්‍රය - අංගුත්තර නිකාය
- ධනිය සූත්‍රය - සුත්ත නිපාතය
- මෙත්ත සූත්‍රය - සුත්ත නිපාතය
- බෞද්ධ ආර්ථික දර්ශනය - ධර්මසේන හෙට්ටිආරච්චි

**නිපුණතාව 9.0** : බෞද්ධ ආර්ථික හා දේශපාලන චින්තනය තේරුම් ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 9.2** : බෞද්ධ දේශපාලන මූලධර්ම අධ්‍යයනය කර දැහැමි පාලනයකට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 40 යි.

**ඉගෙනුම් පල** :

- බෞද්ධ දේශපාලන මූලධර්ම අධ්‍යයනය කරයි.
- බෞද්ධ දේශපාලන මූලධර්ම යහපත් පාලන තන්ත්‍රයක් සඳහා පදනම බව පිළිගනියි.
- ප්‍රජා නායකයකු ලෙස සමාජ සුභසාධන කටයුතුවල නිරත වෙයි.
- දැහැමි පාලන තන්ත්‍රයක් උදෙසා දායක වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බෞද්ධ දේශපාලන මූලධර්ම පිළිබඳ අවබෝධයකින් යුතු ව සමාජ සුභසාධනයට හා යහපත් රාජ්‍ය පාලනයකට පරමාදර්ශ හඳුන්වාදීම හා ඒ සඳහා අවශ්‍ය ප්‍රමාණාත්මක අවබෝධයක් ශිෂ්‍යයා වෙත ලබාදීම මෙමගින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**බෞද්ධ දේශපාලන මූලධර්ම**

- දශරාජ ධර්ම - දස සක්විතිවත්, සතරසංග්‍රහ වස්තු, සතර අගති විරතිය, සප්ත අපරිහානීය ධර්ම, පංචසීලය භික්ෂු සමාජයට අදාළ පාලන සංවිධානයේ ආදර්ශ ආදිය බෞද්ධ දේශපාලන මූලධර්මවලට අයත් බව

**දසරාජ ධර්ම**

- දැහැමි රාජ්‍ය පාලකයෙකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙත් දශරාජ ධර්ම නම් වන බව
- දානං සීලංච පරිච්චාගං - අජ්ජවං මජ්ජවං තපං
  අක්කෝධො අවිහිංසාච - ඛන්තීච අවිරෝධතා
  දානය, සීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපස
  අක්‍රෝධය, අවිහිංසාව, ඉවසීම, අවිරෝධතාව යනු දශරාජ ධර්ම වන බව

1. දානය - රට වැසියාගේ සුභසාධන කටයුතු හා අනෙකුත් අවශ්‍යතා රජු විසින් සපුරා දිය යුතු බව
2. සීලය - රජු සිල්වත්ව, සදාචාරාත්මකව, ප්‍රතිපත්ති ගරුකව ක්‍රියා කළ යුතු බව
3. පරිත්‍යාගය - ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීම උදෙසා රජුගේ කාලය ශ්‍රමය, ධනය, කැප කළ යුතු බව
4. ඍජු බව - රජු අගතිගාමී නොවී අවංකව ක්‍රියා කළ යුතු බව
5. මෘදු බව - ප්‍රජාවගේ දුක් පීඩාවන් පිළිබඳව රජු සංවේදී විය යුතු බව

6. තපස - පවිත්‍ර චේතනාවලින් බැහැරවීම හා ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත බව
7. අක්‍රෝධය - ප්‍රජාව කෙරෙහි මෛත්‍රී සහගතව ක්‍රියා කළ යුතු බව
8. අවිහිංසාව - ජනයාට හිංසා නොකළ යුතු බව
9. ඉවසීම - විරුද්ධ අදහස් මතවාද හා ඉවසිය යුතු බව
10. අවිරෝධතාව - ප්‍රජාව හා විදේශ රජවරුන් සමඟ ගැටුම් ඇතිකර නොගත යුතු බව

- දශරාජ ධර්ම අනුගමනය කිරීම නිසා පිළිවෙත් ගරුක දියුණු සමාජයක් බිහිවන බව
- දශරාජ ධර්මයෙන් යුතුව ගෙන යන පාලනයක් පහසුවෙන් බිඳ නොවැටෙන බව
- මෙවැනි රාජ්‍යයක වැසියන් ද සුඛිත මුදිත ව සතුටෙන් සාමයෙන් කල් ගෙවන බව
- සාමකාමී රාජ්‍ය පාලනයකට මෙයින් මඟ පෙන්වන බව

**දස සක්විති වත්**

- සක්විති රජතුමා විසින් පළමුව තමා ධාර්මික වී දසවැදෑරුම් ප්‍රතිපත්තියක් මත පිහිටා සියලු දෙනා ම ආරක්ෂා කළ යුතු බව. ඒ අනුව,
  1. තම පවුලට අයත් පිරිසට දැහැමි රැකවරණය සැලසීම.
  2. බළසෙනඟට දැහැමි රැකවරණය සැලසීම.
  3. මැති ඇමතීන්ට දැහැමි රැකවරණය සැලසීම.
  4. බ්‍රාහ්මණ ගෘහපතියන්ට දැහැමි රැකවරණය සැලසීම
  5. ගම් නියම්ගම් ජනපදවාසීන්ට දැහැමි රැකවරණය සැලසීම
  6. මහණ බමුණන් සහිත පූජක උතුමන්ට දැහැමි රැකවරණය සැලසීම
  7. මෘග පක්ෂීන් සහිත සත්ත්ව ප්‍රජාවට දැහැමි රැකවරණය සැලසීම
  8. නිර්ධනයන්ට තමා අභිමත කර්මාන්ත ආදිය සඳහා ධනය ලබාදීම
  9. සියලු අපරාධ මර්දනය කර මැඩපැවැත්විය යුතු බව.
  10. මදයෙන් හා ප්‍රමාදයෙන් තොර බහුශ්‍රැත මහණ බමුණන් වෙත එළඹ අවවාද අනුශාසනා ලබා රට පාලනය කිරීම
- මෙම කරුණු අනුව දැහැමි රාජ්‍යය පාලනයක් ගෙන යා හැකි බව

(චක්කවත්ති සීහනාද සූත්‍රය- දී.නි.3)

- මෙම කරුණු අනුව දැහැමි රාජ්‍ය පාලකයකු සියලු ජනයා, සිවුපාවුන්, පක්ෂීන් ආදී සමස්ත සත්ත්ව ප්‍රජාවට ම දැහැමි ව රැකවරණ සැලසිය යුතු බව
- අපරාධ මර්දනය කළ යුතු බව
- ජනයාගේ ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කළ යුතු බව
- ශ්‍රමණ බ්‍රාහ්මණ, විශාරද උතුමන්ගෙන් උපදෙස් ලබා ගත යුතු බව

**සප්ත අපරිහානීය ධර්ම**

- සප්ත අපරිහානීය ධර්ම යනු
  1. නිතර රැස්වීම.
  2. සමඟිව රැස් ව, සමඟිව කටයුතු කොට, සමගිව විසිරයාම.
  3. පෙර නොපැනවූ නීති නොපැනවීම, පැනවූ නීති කඩ නොකිරීම, පැරණි වජ්ජි ධර්ම ආරක්ෂා කිරීම.
  4. මහලු වජ්ජීන්ට පුද සත්කාර කිරීම, ගරු බුහුමන් කිරීම හා ඔවුන්ගේ වචනවලට සවන්දීම හා අවවාද පිළිපැදීම.
  5. කුල ස්ත්‍රීන්ට හා කුල කුමරියන්ට කරදර නොකිරීම හා බලහත්කාරයෙන් තමන් හා වාසයට නොගැනීම.
  6. වජ්ජි රාජ්‍යයේ ඇතුළත හා පිටත පිහිටි පූජනීය ස්ථානවලට ගරු සත්කාර කිරිම හා ඒවාට දිය යුතු දෑ දීම හා කළ යුතු දෑ කිරීම.
  7. සිය රටට පැමිණි රහතුන් වහන්සේලාට සුවසේ විසීමට පහසුකම් සැලසීම හා නොපැමිණි රහතුන් වහන්සේලා පමුණුවා ගැනීම හා මනා රැකවල් සැලසීම බව

  (මහාපරිනිබ්බාන සූත්‍රය-දී.නි. 3 )
- රාජ්‍යයක අභිවෘද්ධියට හා නොපිරිහීමට, රජුගේ කීර්තිරාවය පැතිරීමට සප්ත අපරිහානීය ධර්ම හේතුවන බව
- නිබඳ ව ම ජනතා ප්‍රශ්න සාකච්ඡා කොට විසඳුම් සැපයිය හැකි බව
- සමඟි සම්පන්න නීතිගරුක රාජ්‍යයක් හා රාජ්‍ය පාලනයක් මින් ගොඩනැගෙන බව
- රාජ්‍ය පාලකයන් සමාජ සාම්ප්‍රදායිකත්වයට ගරු කළ යුතු බව
- ආගමික උතුමන් හා සිද්ධස්ථාන ආරක්ෂා කිරීමෙන් ආධ්‍යාත්මික සංවර්ධනයට අනුබල දිය යුතු බව
- විවාහක අවිවාහක කාන්තාවන්ට රැකවරණ සැලසිය යුතු බව
- පාලකයන් අත්තනෝමතික නොවී අත්දැකීම් ඇති වැඩිහිටියන්ට සවන්දීමට පොලඹවා ඇති බව සප්ත අපරිහානීය ධර්ම තුළින් යහපත් රාජ්‍ය පාලනයකට පාලකයන් පොලඹවා ඇති බව

**සතර අගති විරතිය**

**සතර අගතිය**

- **ඡන්ද අගතිය** - තමන්ගේ කැමැත්තට ම වහල් ව අගතිගාමී ව හිමියන් අහිමියන් කිරීම හා අහිමියන් හිමියන් කිරීම.
- **දෝස අගතිය** - ද්වේෂයෙන් අගතියට ගොස් ක්‍රියා කිරීම.
- **භය අගතිය** - වෙනත් අයකුට බලයට ඇති බිය නිසා අගතිගාමී ව ක්‍රියා කිරීම.
- **මෝහ අගතිය** - මුළාවීමෙන් අගතිගාමීව වැරදි ක්‍රියා කිරීම. (සිගාලක සූත්‍රය-දී.නි. 3)

**සතර අගති විරතිය**

- ඡන්ද, දෝස, භය, මෝහය යන කරුණුවලින් අගතියට නොයෑම, සතර අගති විරතිය බව
- සතර අගතියෙන් යුතු තැනැත්තා අව පස සඳමෙන් පිරිහීමට පත්වන බව
- සතර අගති විරතියෙහි යෙදුණු තැනැත්තා පුරපස සඳමෙන් දියුණුවෙන් බබළන බව
- පුරාණ බෞද්ධ රාජ්‍ය පාලකයන් අගතිගාමී නොවී ක්‍රියා කළ බව

**සතර සංග්‍රහ වස්තු**

- දානය, ප්‍රියවචනය, අර්ථ චරියාව , සමානාත්මතාව සතර සංග්‍රහ වස්තු බව

(සිගාලක සූත්‍රය-දී.නි. 3,)

- පාලකයකු විසින් සතර සංග්‍රහ වස්තුවලින් ප්‍රජාවට සංග්‍රහ කළ යුතු බව

1. දානය - එක් එක් පුද්ගලයාට අවශ්‍යතාව අනුව අවශ්‍ය දේ දීම දානය බව
2. ප්‍රිය වචනය - සුහදව ප්‍රිය වචනයෙන් ආමන්ත්‍රණය කිරීම ප්‍රිය වචනය බව
3. අර්ථචරියාව - අන්‍යයන්ගේ දියුණුවට හේතුවන ක්‍රියාමාර්ග ගැනීම අර්ථචරියාව බව
4. සමානාත්මතාව - ජාති, කුල, ගෝත්‍ර නොසලකා සැමට සම ව සැලකීම සමානාත්මතාව බව

- රිය සකට කඩ ඇණයක් සේ සතර සංග්‍රහ වස්තුවෙන් සමාජයක යහපැවැත්ම තහවුරු වන බව

(සිගාලක සූත්‍රය-දී.නි. 3

**පඤ්ච සීලය**

- පඤ්ච සීලය රජදරුවන් විසින් අනුගමනය කළ යුතු බව
- එය අනුගමනය කිරීම ප්‍රජාවගේ සුභසිද්ධියට හේතු වන බව
- ප්‍රාණඝාතයෙන් හෙවත් පරපණ නැසීමෙන් සත්ත්ව පුද්ගල ජීවිත විනාශ වන බවත් ඉන් වැළකීමෙන් ප්‍රජා හිංසනයෙන් තොර පාලකයකු බිහිවන බව
- රජු අදත්තාදානයෙන් වැළකීම නිසා ජනතාව හා රජය සතු දේපළ සුරැකෙන බව
- පාලකයා ශිෂ්ට, අවංක, සදාචාරසම්පන්න අයකු වීම නිසා යහපාලනයක් ගොඩනැගෙන බව
- චක්‍රවර්ති රජුගේ විශිෂ්ට ගුණාංග පහක් ලෙස,
  1. අත්ථඤ්ඤු - අර්ථය දැන ක්‍රියා කිරීම
  2. ධම්මඤ්ඤු - ධර්මය දැන ක්‍රියා කිරීම
  3. මත්තඤ්ඤු - මාත්‍රාව හෙවත් සීමාව දැන ක්‍රියා කිරීම
  4. කාලඤ්ඤු - කල් දැන කටයුතු කිරීම
  5. පරිසඤ්ඤු - පිරිස පිළිබඳ දැන කටයුතු කිරීම

  දැක්විය හැකි බව
- පාලකයා පස්පවින් වැළකී වැසියන් ද ඉන් වැළැක්විය යුතු බව
- පඤ්චශීල ප්‍රතිපදාව සක්විති රජකු විසින් ආරක්ෂා කරමින් විදේශ රජවරුන් ලවා ද ආරක්ෂා කරවිය යුතු බව
- රජු පස්පවින් වැළකීම නිසා රාජ්‍යයක අපරාධ වැළකී, ආර්ථික දේශපාලන, සමාජීය වශයෙන් ආරක්ෂාව දියුණුව සැලසෙන බව

**රාජ්‍ය පාලනයට අදාළ වෙනත් ඉගැන්වීම්**

- රාජ්‍ය පාලනයට අදාළ කරගත හැකි බෞද්ධ ඉගැන්වීම් හේතුඵල න්‍යායික පදනමකින් ඉදිරිපත් කර ඇති බව (අග්ගඤ්ඤ සූත්‍රය-දී.නි. 3)
- රාජ්‍යය බලයේ උල්පත මහජනතාව වේ යයි බුදු දහමින් උගන්වන බව
- සමාජ ගැටලු විසඳීමේ අරමුණින් රාජ්‍ය සංකල්පය බිහි වන බව
- එහිදී රජුගේ කාර්යභාරය ධර්මිෂ්ඨ පාලනයක් ගෙනයාම බව

- රජකමේ උරුමය පියපුතු පරපුරෙන් හිමිවන්නක් නොව ජන සම්මතයෙන් හිමිවන්නෙකැයි බුදු දහමෙන් ඉගැන්වෙන බව
- අදණ්ඩෙන් අශස්ත්‍රයෙන් කරන රාජ්‍ය පාලනය බුදු දහමෙන් අගය කෙරෙන බව

(රජ්ජ සූත්‍රය-ස.නි.1)

- රජු ධාර්මික නොවීමෙන් නිලධාරීන් හා  සමාජය ද අධාර්මික වී පරිසරය ද විකෘති වේයයි උගන්වා ඇති බව

(අධම්මික සූත්‍රය-අ.නි.2)

- ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රියා කිරීම රාජ්‍ය පාලකයා විසින් සැලසුම්ගත ව සිදුකළ යුතු යැයි පෙන්වා දී ඇති බව
- භික්ෂු සමාජයට අදාළ විනය මූලාශ්‍රය මඟින් පෙනෙන පාලන සංවිධානය රාජ්‍ය පාලකයන්ට ද ආදර්ශයක් වන බව
- ඒ  අනුව බහුතර කැමැත්තට එකඟවීම, සාමූහික ව තීරණ ගැනීම, ඡන්ද විමසීම් පැවැත්වීම, විරුද්ධ මතවලට ඉඩදීම, පනතක් තෙවරක් කියවා සම්මත කර ගැනීම, සාධාරණ අධිකරණ කටයුතු හා දඬුවම් පැනවීම ආදි ආදර්ශයන් භික්ෂු විනය මඟින් පාලකයන්ට ආදර්ශ වශයෙන් ලබාගත හැකි බව

**රාජ්‍ය දේශපාලන මූලධර්ම ඔස්සේ ගොඩනැඟෙන ධර්මිෂ්ඨ රාජ්‍යය**

- බෞද්ධ දේශපාලන මූලධර්ම ක්‍රියාත්මක කිරීමෙන් ධර්මිෂ්ඨ රාජ්‍යයක් ගොඩනැඟෙන බව
- ශීල ප්‍රතිපදාව අනුගමනය කිරීමෙන් රජු දැහැමි පාලකයකු  වන බව
- ධර්මිෂ්ඨ පාලකයකු අන්තගාමී නොවී මධ්‍යස්ථ විය යුතු බව
- පඤ්චසීලය, දශරාජ ධර්ම, දස සක්විතිවත්, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු , සතර බ්‍රහ්ම විහරණ, සතර අගති විරතිය ආදී ඉගැන්වීම් අනුව කටයුතු  කිරීමෙන් ධර්මිෂ්ඨ පාලන තන්ත්‍රයක්  ගොඩනැඟෙන බව
- පරමාදර්ශී සමාජ සංවිධානයක ආදර්ශයක් වශයෙන් භික්ෂු සමාජයට අදාළ පාලන සංවිධානය ආදර්ශයට ගැනීමෙන් දැහැමි පාලන තන්ත්‍රයකට නිසැකවම මඟ සැලසෙන බව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකිය.

1. බෞද්ධ දේශපාලන මූලධර්ම වර්තමාන සමාජයට ගැළපෙන අයුරු විස්තර කරමින් පුවත්පතකට ලිපියක් ලියන්න.
2. ධර්මිෂ්ඨ පාලකයකු සතු විය යුතු ගුණාංග විස්තර කෙරෙන ප්‍රදර්ශන පුවරුවක් නිර්මාණය කරන්න.
3. දැහැමි පාලනයක් සඳහා පාලකයන්ගේ වගකීම් පැහැදිලි කෙරෙන කවි පන්තියක් නිර්මාණය කරන්න.
4. පාලකයකු සතු යුතුකම් හා වගකීම් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
5. සංඝ සමාජයේ පාලන ක්‍රම රාජ්‍ය පාලකයකු හට වැදගත් වන අයුරු පැහැදිලි කරමින් පොත් පිංචක් නිර්මාණය කරන්න.
6. ධර්මිෂ්ඨ රාජ්‍යයක ලක්ෂණ පැහැදිලි කරමින් ශිෂ්‍ය සමිතියේ කතාවක් කරන්න.

**පරිශීලනයට :**

- කූටදන්ත සූත්‍රය - දීඝ නිකාය
- මහා පරිනිබ්බාන සූත්‍රය - දීඝ නිකාය
- අග්ගඤ්ඤ සූත්‍රය - දීඝ නිකාය
- චක්කවත්ති සීහනාද සූත්‍රය - දීඝ නිකාය
- රජ්ජ සූත්‍රය - සංයුත්ත නිකාය
- අධම්මික සූත්‍රය - අංගුත්තර නිකාය
- සංගහ වත්ථු සූත්‍රය - අංගුත්තර නිකාය
- චක්කානුවත්තන සූත්‍රය - අංගුත්තර නිකාය
- භික්ෂු සමාජය - දේවාලේගම මේධානන්ද හිමි
- බුද්ධ ධර්මය - කොස්වත්තේ අරියවිමල හිමි
- රාජ්‍ය පාලනයට බෞද්ධ උපදෙස් - ගුණසේන මහතන්ත්‍රි
- බෞද්ධ දේශපාලන චින්තනය - එස්. දයාප්‍රනාන්දු
- බෞද්ධ සංස්කෘතිය
  සමාජචින්තනය හා පුද සිරිත් - මහාචාර්ය දේවාලේගම මේධානන්ද හිමි

**නිපුණතාව** 10.0 : බෞද්ධ භාවනාවේ අගය වටහාගෙන එය ජීවන ගැටලු විසඳා ගැනීමෙහි ලා ප්‍රායෝගික ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 10.1 : බෞද්ධ භාවනාවේ සුවිශේෂතා හැඳින එහි උපයෝගීතාව පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 30 යි.

**ඉගෙනුම් පල** :

- භාවනාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විස්තර කරයි.
- බෞද්ධ භාවනාවේ උපයෝගීතාව පිළිගනියි.
- නිරන්තරයෙන් සිහි නුවණින් ජීවත් වෙයි.
- ගැටුම් නිරාකරණයෙහි ලා දායකත්වය සපයයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බෞද්ධ භාවනාවේ අගය වටහා දී භාවනාව ප්‍රායෝගික ව ජීවන ගැටලු විසඳා ගැනීමට හා ගැටලු නිරාකරණයට උපයෝගී කර ගැනීම උදෙසා ශිෂ්‍යයන් පොලඹවීම මෙමගින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**බෞද්ධ භාවනාවේ සුවිශේෂත්වය**

- කුසල් සිත් වැඩිදියුණු කිරීම භාවනා යනුවෙන් අර්ථවත් වන බව
- චිත්ත පාරිශුද්ධිය හා චිත්ත ඒකාග්‍රතාව මඟින් යථාර්ථය අවබෝධ කිරීම භාවනාවේ අරමුණ වන බව
- සමථ හා විදර්ශනා යනුවෙන් ප්‍රධාන බෞද්ධ භාවනා ක්‍රම දෙකක් ඇති බව
- චිත්ත භාවනාව සමථ භාවනාව යනුවෙන් ද ප්‍රඥා භාවනාව විපස්සනා භාවනාව යනුවෙන් ද හැඳින්වෙන බව
- සමථ භාවනා ක්‍රමය ප්‍රාග් බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායයේ ද භාවිත වූ බව
- ලාමක පව්ටු ධර්ම බැහැර කරමින් කටයුතු කළ අය බ්‍රාහ්මණ යනුවෙන් හැඳින්වූ බවත් ඔවුන් වනගත පෙදෙස්වල පන්සල් කරවා ධ්‍යානයෙහි යෙදුණු බැවින් ''ඣායක'' නම් වූ බවත් බුද්ධ දේශනාවලින් හෙළි වන බව
- එම ඣායක පිරිස් සමථ භාවනාවේ යෙදුණු බව
- ඇතැමුන් සමථ භාවනාව වැඩීම නිසා ධ්‍යාන අභිඥා ලබා සිටි බව
- සමථ ප්‍රතිඵල ඉක්මවා සාංසාරික සංයෝජනයන් ප්‍රහාණය පිළිබඳ අවධානය යොමු කිරීම බෞද්ධ භාවනාවේ සුවිශේෂත්වය බව
- සෝතාපත්ති, සකදාගාමී, අනාගාමී, අරහත් යන සතර මඟ සතර පල ලාභය බෞද්ධ භාවනාවේ අපේක්ෂාව වන බව

- අෂ්ට සමාපත්ති අතරට නවවැනි සඤ්ඤා වේදයිත නිරෝධ සමාපත්තිය එකතු කිරීම බෞද්ධ භාවනාවේ ඉදිරි පියවර වන බව
- පංච අභිඥා ඉක්මවා ආසවක්ඛය ඥානය ද ඇතුළත් ෂඩ් අභිඥා ඉගැන්වීම බුදුසමයේ සුවිශේෂත්වය වන බව
- ප්‍රඥා ශික්ෂාව අර්ථවත් වන සියලු සංස්කාර අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යැයි දැකීම විදර්ශනා භාවනාව යන්නෙන් ඉගැන්වෙන බව

**සමථ - විදර්ශනා භාවනා**

- ''භාවෙති කුසලෙ ධම්මෙ අසෙවති වඩ්ඪේති එතායාති භාවනා'' යනු නිර්වචන හෙයින් කුසල් දහම් වැඩීම භාවනාව නම් වන බව
- ''කාමච්ඡන්දාදි පච්චනික ධම්මෙ සමෙතීති සමථො'' යනුවෙන් කී පරිදි කුසලයට ප්‍රතිවිරුද්ධ වූ කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්චකුක්කුච්ඡ, විචිකිච්ඡා යන නීවරණ ධර්මයන් යටපත් කිරීම සමථය නම් වන බව
- ''අනිච්චාදිවසෙන විවිධෙහි ආකාරෙහි ධම්මෙ පස්සතීති විපස්සනා'' යැයි කී බැවින් සියලු සංස්කාර ධර්ම අනිත්‍යය, දුක්ඛය, අනාත්මය වශයෙන් බැලීම විදර්ශනා භාවනාව නම් වන බව
- සම සතළිස් කමටහන් සමථ හා විදර්ශනා වශයෙන් දියුණු කළ හැකි බව
- ශීලාදි ගුණ ධර්මයක පිහිටා භාවනාව ප්‍රගුණ කළ යුතු බව
- ඉන්ද්‍රිය සංවරයෙහි පිහිටා භාවනා වැඩිය යුතු බව
- සීලයෙන් තොර සමාධියක් හෝ සමාධියෙන් තොර ප්‍රඥාවක් හෝ බුදු දහමෙහි නැති බව
- සියලු ඉරියවු වල දී ම සිහිනුවණින් කටයුතු කළ යුතු බව
- භාවනාවේ නිරත යෝගාවචරයා විසින් අල්පේච්ඡතාව, සන්තුට්ඨිතාව,කායික නීරෝගිතාව, සුදුසු පරිසරයක් තෝරා ගැනීම, ක්‍රමානුකූල දින චරියාවක් පවත්වා ගැනීම සිදු කළ යුතු බව
- භාවනාව සාර්ථක වීමට නම් සීලය, කල්‍යාණ මිත්‍ර සම්පත්තිය, ධර්මඥානය, වීර්යය හා ප්‍රඥාව ද තිබිය යුතු බව (මේඝිය සූත්‍රය-ඛු.නි. 1)
- මෙලෙස දියුණු කරන ලද සමථ විදර්ශනා භාවනා ක්‍රම මගින් ධ්‍යාන, අභිඥා, සමාපත්ති මෙන් ම මාර්ගඵලාධිගමයන් ලබා ගත හැකි බව
- සමථය වැඩීම විදර්ශනාවට ක්ෂණික ව යොමුවීමට උපකාරී වන බව
- සමථයේ ප්‍රතිඵල සදාතන නොවූවත් විදර්ශනාවේ ප්‍රතිඵල සසර දුක නිවාලන නොවෙනස්ව පවතින්නක් බව

**සතර සතිපට්ඨාන**

- සැඩ පරුෂ කුළු ගොනකු මෙන් නානා අරමුණු කරා දුවන අකීකරු සිත තුළ සිහිය පිහිටුවීම සතිපට්ඨාන නම් වන බව
- කායානුපස්සනාව, වේදනානුපස්සනාව, චිත්තානුපස්සනාව හා ධම්මානුපස්සනාව යනු සතර සතිපට්ඨාන බව

- ඇවිදීම, සිටගෙන සිටීම, වාඩිවී සිටීම, නිදා ගැනීම යන සිවු ඉරියවුහි සිහිනුවණින් කටයුතු කිරීම කායානුපස්සනාව වන බව
- බිම තිබූ පාදය එසවීම (උද්ධරණ), පය තිබූ තැන ඉක්මවා ඉදිරියට ගෙන යෑම (අතිහරණ), පාදය කිසිවක නොගටා පසෙකින් ඉදිරියට යැවීම (වීතිහරණ), පය බිමට පාත් කිරීම (වොස්සජ්ජා), පය බිම තැබීම (සන්නික්ඛෙපන), පය බිම තබා තද කිරීම (සන්නිරුම්භන) යනාදි වශයෙන් ඇවිදීම ආදී ඉරියවුහි ඉතා සියුම්ව විදර්ශානුගතව බැලීම කායානුපස්සනාව බව
- සුඛ, දුක්ඛ , අදුක්ඛම සුඛ ආදී වේදනාවක් විඳිනු ලබන කල්හි එවැනි වේදනාවක් විඳිමි යි සිහිනුවණින් බැලීම වේදනානුපස්සනාව බව
- තව ද සුඛ, දුක්ඛ, උපෙක්ඛා, සාමිස සුඛ, නිරාමිස සුඛ, සාමිස දුක්ඛ, නිරාමිස දුක්ඛ, සාමිස උපෙක්ඛා, නිරාමිස උපෙක්ඛා යැයි වින්දනයන්හි සිහිය පිහිටුවීම ඉන් අපේක්ෂා කරන බව
- තමාගේ ද, අනුන්ගේ ද සිතෙහි සිත අනුව බලමින් වාසය කිරීම, සිත උපදවන ප්‍රත්‍යය හා ඉපදවීම අනුව බලමින් වාසය කිරීම, සිතේ වැයවීමේ ප්‍රත්‍යය හා වැයවීම අනුව බලමින් වාසය කිරීම චිත්තානුපස්සනාව නම් වන බව
- සරාග, විරාග, සදෝස, වීතදෝස, සමෝහ, වීතමෝහ, සංඛිත්ත, වික්ඛිත්ත, මහග්ගත, අමහග්ගත, සඋත්තර, අනුත්තර සමාහිත, අසමාහිත, විමුත්ත, අවිමුත්ත යනුවෙන් සොළොස් ආකාරයකින් සිත දෙස බැලීම චිත්තානුපස්සනාවේ දී සිදුවන බව
- පස් වැදෑරුම් නීවරණ ධර්මයන් පිළිබඳ ව ස්වභාව ධර්මය අනුව බලමින් වාසය කිරීම ධම්මානුපස්සනාව බව
- තමා තුළ කාමච්ඡන්දය ඇති වුවහොත් ඇතැයි ද, නැතිනම් නැතැයි ද, නූපන් කාමච්ඡන්දය උපදී නම් එය ද, උපන් කාමච්ඡන්දයාගේ පහවීම ද ආදී වශයෙන් පඤ්ච නීවරණයන් පිළිබඳ දැකීම් වශයෙන් ධම්මානුපස්සනාව විසි වැදෑරුම් වන බව
- සතර සතිපට්ඨානය වැඩීම නිවන් පසක් කිරීමේ එක ම මඟ යැයි උගන්වා ඇති බව
- සෝක, වැලපුම් ඉක්මවා යෑමට, දුක් දොම්නස් නැති කිරීමට, උසස් ඥානය ලබා ගැනීමට, නිවන් පසක් කිරීමට සතර සතිපට්ඨානය වැඩිය යුතු යැයි එම සූත්‍රයේ දැක්වෙන බව

(මහා සතිපට්ඨාන සූත්‍රය-දී.නි.2)

**සතර කමටහන්**

- බුද්ධානුස්සති මෙත්තාච - අසුභං මරණස්සති<br>ඉති ඉමා චතුරාරක්ඛා - භික්ඛු භාවෙය්‍ය සීලවා

  යන ගාථාවෙන් කියවෙන පරිදි බුද්ධානුස්සතිය, මෙත්තානුස්සතිය, අසුභානුස්සතිය, මරණානුස්සතිය සතර කමටහන් බව

- නව අරහාදි බුදුගුණ මෙනෙහි කිරීම බුද්ධානුස්සතිය බව
- සුප්පබුද්ධං පබුජ්ඣන්ති - සදා ගෝතම සාවකා<br>යෙසං දිවාච රත්තොච - නිච්චං බුද්ධ ගතා සති

  (ධම්ම පදය, මග්ග වග්ග 7 ගාථාව)

  යන ගාථාවෙන් කියවෙන පරිදි රෑ දවල් දෙකේහි බුදුගුණ සිහිකරන බුද්ධ ශ්‍රාවකයන් සුවසේ නිඳන බව සහ සුවසේ අවදිවන බව

- තමා මෙන්ම සමස්ත සත්ව, මානව ප්‍රජාවම නිදුක් වෙත්වා නීරෝග වෙත්වා, සුවපත් වෙත්වා, දුකින් මිදෙත්වා, නිවන් දකිත්වා ආදී වශයෙන් මෙනෙහි කිරීම මෛත්‍රී භාවනාව බව
- මෙත්තානිසංස සූත්‍රයේ කිවූ පරිදි සුවසේ නින්දයාම, සුවසේ අවදිවීම, නපුරු සිහින නොදකීම ආදී ආනිසංස එකොළහක් මෛත්‍රී භාවනාවෙන් ලැබිය හැකි බව
- කෙස්, ලොම්, නිය, දත් ආදී දෙතිස් කුණප කොට්ඨාසයකින් තම සිරුර සැකසී ඇතැයි සිහි කිරීම අසුභානුස්සතිය බව
- පැහැය, සටහන්, ගන්ධ, ඇසුරු කරන තැන්, පිහිටි ස්ථාන යන පස් ආකාරයකින් මේ දෙතිස් කුණප කොට්ඨාස පිළිකුල් සහගත යැයි භාවනා කළ හැකි බව
- කාමච්ඡන්දාදි නීවරණ යටපත් කොට ධ්‍යාන අභිඥා ආදිය ලබා ගැනීමට කර්මස්ථාන භාවනාව උපයෝගී වන බව
- උපන් සත්ත්වයාගේ මරණය නියතය, සත්ත්වයා උපත ලබා ඇත්තේ මරණය සමඟ ම ය. එය බලාපොරොත්තු රහිත කවර අවස්ථාවක වුව ද සිදුවිය හැකිය ආදි වශයෙන් මරණය පිළිබඳ ව සිහිකිරීම මරණානුස්සතිය බව
- මරණානුස්සතිය වැඩීමෙන් රාගාදි කෙලෙස් කම්පිත වී කුසලයට යොමු වී මරණයට බිය නොවී නෑ හිතමිතුරන්ගේ වියෝවේ දී කම්පා නොවී නොමුළාව ජීවත් ව කලුරිය කළ හැකි බව
- මේ සතර කමටහන ම විදර්ශනා වශයෙන් පුහුණු කිරීමෙන් නිවන පසක් කළ හැකි බව

**කර්මස්ථාන ආචාර්යවරයා සතු ගුණාංග**

- ''පියොච ගරු භාවනීයො - වත්තා ච වචනක්ඛමො
  ගම්භීරංච කථං කත්තා - නොචට්ඨානෙ නියෝජයෙ''

  යැයි කී පරිදි කර්මස්ථාන ලබාදෙන ගුරුවරයා ශීල සම්පත්තියෙන් සැමට ප්‍රිය වූත් ගල් පියස්සක් මෙන් බරසාර වූත්, සෙවණ දෙන්නාවූත්, ගුණයෙන් බුහුමනට සුදුසුවූත්, වරදට අවවාද කරන සුලුවූත්, ගැඹුරු ධර්ම කථා කියාදෙන, ඇසුරු කරන්නන් වරදින් වළක්වන අයකු විය යුතු බව.
- කර්මස්ථාන දායකයන් වහන්සේ මඟපල ලැබූවෙක් හෝ ධ්‍යාන ලැබූවෙක් හෝ නොවේනම් පෘථග්ජනයකු වුවත් ත්‍රිපිටකධාරී හෝ ඒක පිටකධාරී හෝ අටුවා සහිත ව එක් නිකායක් දරන ලජ්ජාශීලී කෙනෙකු හෝ විය යුතු බව
- කර්මස්ථාන දායකයන් වහන්සේ පෙළ අටුවා මතයට හා ආචාර්ය මතයට ගරු කරන කෙනෙකු විය යුතු අතර අත්තනෝමතික කෙනෙකු නොවිය යුතු යැයි විශුද්ධි මාර්ගයෙහි උගන්වා ඇති බව

**යෝගාවචරයාගේ චරිත ලක්ෂණ**

- විශුද්ධි මාර්ගයට අනුව රාගචරිත, දෝස චරිත, මෝහ චරිත, සද්ධා චරිත, බුද්ධි චරිත, විතක්ක චරිත වශයෙන් චරිත හයක් දක්වා ඇති බව

- ප්‍රසන්න ඉරියවු ඇති ක්‍රමානුකූල වූ , ප්‍රිය අරමුණුවල ඇලෙන මායා, සාඨෙය්‍ය, මාන මහිච්ඡතා, පාපිච්ඡතා- අසන්තුට්ඨිතා, අහිරික, අනොත්තප්ප ආදිය ලක්ෂණ කොට ඇති තැනැත්තා, රාගය බහුල පුද්ගලයා රාග චරිතයා බව දස අසුභ හා කායගතාසති භාවනා ඔහුට සුදුසු බව
- විෂම ඉරියවු ඇති, රළු කටුක ආහාර ප්‍රිය කරන, අප්‍රිය අරමුණෙහි වහා කිපෙන, ක්‍රෝධ, ඉස්සා, මච්ඡරිය, මක්ඛ, පලාස ගතිගුණ ඇති ද්වේෂය අධික පුද්ගලයා දෝස චරිත පුද්ගලයා වන අතර සතර බ්‍රහ්ම විහාර හා වර්ණ කසිණ භාවනාව ඔහුට සුදුසු බව
- අවුල් සහගත ඉරියවු ඇති තැතිගත්තකු සේ හැසිරෙන, අපිරිසිදු, හොඳ නරක වටහා ගැනීමේ අසමත්, ථීන මිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා බහුල මෝහය අධික පුද්ගලයා මෝහ චරිතයා වන අතර ආනාපාන සති භාවනාව ඔහුට සුදුසු බව
- රාග චරිතයාට බෙහෙවින් සමාන ඉරියවු ඇති, තෙරුවන් කෙරෙහි ඇලුම් කරන, වහා පැහැදෙන, දීමට කැමැති, වරද නොසඟවන ශ්‍රද්ධාව අධික පුද්ගලයා ශ්‍රද්ධා චරිතයා වන අතර දස අනුස්සති අතරින් පළමු හය වැඩීම ඔහුට සුදුසු බව
- ද්වේශ චරිතයාට සමාන ඉරියවු ඇති, එහෙත් කීකරු, කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන භෝජනයෙහි පමණ දන්නා, සිහි නුවණින් වෙසෙන, වීර්ය සම්පන්න වූ නුවණ අධික පුද්ගලයා බුද්ධි චරිතයා වන අතර මරණානුස්සති, උපසමානුස්සති, චතුධාතු වවත්ථාන, ආහාරෙ පටික්කූල සඤ්ඤා යන කර්මස්ථාන භාවනා ඔහුට සුදුසු බව
- මෝහ චරිතයාට බෙහෙවින් සමාන ඉරියවු ඇති, දොඩමලු වන, සමූහයට කැමති, ස්ථිර සිතක් නැති, එක දිගට යමක් කිරීමට අසමත්, අරමුණෙන් අරමුණට පැන පැන යන ස්වභාව ඇති කුසල ධර්මයෙහි නොඇලෙන විතර්කය අධික පුද්ගලයා විතක්ක චරිතයා වන අතර ඔහුට ආනාපානසති භාවනාව සුදුසු බව (විශුද්ධි මාර්ගය)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. බෞද්ධ භාවනා ක්‍රම පිළිබඳ විස්තර කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
2. බෞද්ධ භාවනාව හා ගැටුම් නිරාකරණය පිළිබඳ ව බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න.
3. කර්මස්ථාන දායකයා සතු ගුණාංග පිළිබඳ හැඳින්වෙන පොතක් නිර්මාණය කරන්න.
4. යෝගාවචරයාගේ චරිත ලක්ෂණ ඇතුළත් ප්‍රදර්ශන පුවරුවක් නිර්මාණය කරන්න.
5. සමථ විදර්ශනා භාවනා ක්‍රම හඳුන්වමින් ඒවා වඩන ආකාරය පැහැදිලි කරමින් පුවත්පතකට ලිපියක් ලියන්න.
6. බෞද්ධ භාවනාවේ සුවිශේෂත්වය පිළිබඳ පොත් පිංචක් නිර්මාණය කරන්න.

**නිපුණතාව 10.0 :** බෞද්ධ භාවනාවේ අගය වටහාගෙන එය ජීවන ගැටලු විසඳා ගැනීමෙහිලා ප්‍රායෝගිකව භාවිත කරයි.

**නිපුණතා මට්ටම 10.2 :** භාවනාව ප්‍රායෝගිකව ප්‍රගුණ කරමින් සාමකාමී දිවිපෙවෙතක් ගත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 30 යි.

**ඉගෙනුම් පල :**

- භාවනාවේ ප්‍රායෝගික වටිනාකම පැහැදිලි කරයි.
- භාවනාව කායික මානසික නීරෝගතාව සඳහා සෘජුව බලපාන බව පිළිගනියි.
- දෛනිකව භාවනාවක නියැළී ධාරණ ශක්තිය වැඩිදියුණු කරගනියි.
- කායික මානසික නීරෝගතාව ඇති කරගෙන යහපත් ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

භාවනාව ප්‍රගුණ කිරීම තුළින් කායික මානසික නීරෝගතාව හා ධාරණ ශක්තිය වැඩිදියුණු කර ගැනීමටත් සාමකාමී දිවිපෙවෙතකට ශිෂ්‍යයන් යොමු කිරීමත් මෙමගින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**බුද්ධානුස්සති භාවනාව**

- නව අරහාදී බුදුගුණ පිළිබඳ භාවනාව බුද්ධානුස්සති භාවනාව බව
- මෙම බුදුගුණ නවය එකින් එක ගෙන භාවනා කළ යුතු බව
- අරහං ගුණයට අයත් භාවනා වාක්‍යය මැනවින් ප්‍රගුණ කළ පසු එයට ම සම්බන්ධ කරගෙන සම්මා සම්බුද්ධ ගුණයට අයත් භාවනා වාක්‍යය ද වශයෙන් බුදුගුණ නවය ම නිරවුල් ව පැහැදිලි ව මෙනෙහි කිරීමට පුහුණු විය යුතු බව
- බුද්ධානුස්සතිය වැඩීම පහත සඳහන් පියවර ඔස්සේ සිදු කළ හැකි බව

**පළමුවැනි පියවර :** සුදුසු ස්ථානයක් තෝරා ගැනීම

**දෙවැනි පියවර :** කායිකව පිරිසිදු වීම

**තෙවැනි පියවර :** ශාන්ත ප්‍රිය උපදවන බුදු රුවක් ඉදිරියේ මල් පහන් ආදිය පූජා කිරීම

**හතරවැනි පියවර :** පුරුෂ පක්ෂයේ අය බුදු පිළිම වහන්සේ ඉදිරියෙහි බද්ධ පර්යංකයෙන් ද ස්ත්‍රී පක්ෂයේ අය අර්ධ පර්යංකයෙන් ද වාඩිවී ප්‍රතිමාවේ සිරස මුදුනේ සිට පාදාන්තය තෙක් සිත යොමු කිරීම

**පස්වැනි පියවර :** දෑස් පියාගෙන නැවත හැර බලමින් බුදුරුව සිතේ ස්ථිර ව පිහිටන තෙක් ඒ පිළිබඳ ව මෙනෙහි කිරීම

**හයවැනි පියවර :** බුදුගුණ පිළිබඳ වාක්‍ය අනුව භාවනාව ප්‍රගුණ කිරීම ආදි වශයෙනි

**මෛත්‍රී භාවනාව**

- තමාටත්, සතුරු, මිතුරු හැමදෙනාටමත් මිතුරු බව පැතිරවීම මෛත්‍රී භාවනාව බව
- ලෝකයේ සියලුදෙනාම මිතුරන් ලෙස සැලකීමෙන් අඬ, දබර, කල කෝලාහල, තාඩන, පීඩන, ඝාතන ආදී කිසිවක් සිදු නොවන බව
- බුද්ධානුස්සතිය වැඩීමේ මුල් පියවර තුනම මෙහිදීද එලෙසම අනුගමනය කළ යුතු බව
- ඉන්පසුව තමාට මෙත් වැඩීම
  තමාට වඩාත් සමීප අයට මෙත් වැඩීම
  තමාටත් තවත් අයටත් මාරුවෙන් මාරුවට මෙත් වැඩීම
  අනතුරුව තමාගෙන් දුරස්ථ අයට ද මෙත් වැඩීම කළ යුතු බව

**ආනාපානසති භාවනාව**

- ආශ්වාස ප්‍රශ්වාස වාතය පිළිබඳ සිහිනුවණින් මෙනෙහි කිරීම ආනාපානසතිය බව
- මහා සතිපට්ඨාන, සතිපට්ඨාන, ආනාපානසති සූත්‍රවල ආනාපානසතිය වඩන ආකාරය විස්තර කර ඇති බව
- පළමු අවස්ථාවේ ඇතුළුවන හුස්මත් පිටවන හුස්මත් වැදෙන තැන විමසා එහි සිහිය පිහිටුවිය යුතු බව
- දෙවැනි අවස්ථාවේ ගනු ලබන හෝ පිට කරනු ලබන හෝ හුස්ම ගණන් කිරීම කළ යුතු බව
- හුස්ම ගැනීමේදීත් පිට කිරීමේදීත් හුස්ම හැපෙන තැන සිත පිහිටුවා ඒ පිළිබඳ මෙනෙහි කළ යුතු බව
- මෙම අවස්ථාවේ දී උද්ග්‍රහ නිමිති හා ප්‍රතිභාග නිමිති පහළවන බව
- ගණනා අවස්ථාවේ සිට ආනාපානසතිය විදර්ශනාවක් වශයෙන් වැඩිය හැකි බව

**භාවනාවේ අනුසස්**

සතර අපායට පත් නොවීම
නිතර සොම්නස් සහගත සිතකින් දිවි ගෙවීම
සත්‍ය ගරුක පුද්ගලයකු බවට පත්වීම
අනතිමාන ගති පැවතුම් ඇතිවීම
ලෝකයාට ප්‍රියමනාපවීම
බොහෝ කොට සිවුපසය ලැබීම
දෙවියන්ගේ දැහැමි රැකවරණය ලැබීම
අන් අයගේ කරුණා මෛත්‍රියට භාජනයවීම
තම අදහස්, යෝජනා අන් අය එකහෙළා පිළිගැනීම
භූත, ප්‍රේත, පිසාච ආදි විපත් ළං නොවීම
පාපයට ලජ්ජා භය ඇතිවීම

අධිකුසලයට සිත නැඹුරු වීම

අපල උපද්‍රව දුරුවී කුසල විපාක මතු වීම

ගුණ නුවණින් පිරිපුන් වීම

පිට සක්වළ නූපදීම

අඳ ගොළු බිහිරි ආදී අභව්‍ය තත්ත්වයකට පත් නොවීම

උන්මන්තක නොවීම

මිසදිටු නොවීම

මරණයට නොබියව මුහුණ දීම

මුහුණේ වර්ණය පැහැපත් වීම

වසවිෂ, ගිනි, අවි ආයුධවලින් විපත් නොවීම

බුද්ධත්වයට පවා සිත යොමු කළ හැකි වීම

තම හදවත බුදු මැඳුරක් මෙන් ප්‍රසන්න වීම

යහපත් සිතුම් පැතුම් ඉටු වීම

ධාරණ ශක්තිය හා අවබෝධ කර ගැනීමේ හැකියාව ලැබීම

සම්මා දිට්ඨියෙහි පිහිටීම

සිත වහා සමාධිගත වීම

ඇස්වහ, කටවහ, කොඩිවින, බන්ධන හෝවහ ආදි විපත් නොවීම

ලෞකික ධ්‍යාන, අභිඥා, සමාපත්තීන් ලැබීම

මාර්ගඵල ලාභය ආදී ලෝකෝත්තර ආනිසංස භාවනාව මගින් ලැබිය හැකි වීම

**භාවනාව හා ධාරණ ශක්තිය**

- භාවනාව මඟින් මනස නිරවුල්ව එකඟතාවට පත්වන බැවින් ධාරණ ශක්තිය වැඩිවන බව
- සංගාරව සූත්‍රයේ දැක්වෙන පරිදි

| | | |
|---|---|---|
| කාමච්ඡන්දය | - | පාට කළ වතුරකට |
| ව්‍යාපාදය | - | බුබුළු දමා නටවා රත් කළ වතුර භාජනයකට |
| ථීන - මිද්ධ | - | දිය සෙවලින් වැසීගිය දිය බඳුනකට |
| උද්ධච්ච - කුක්කුච්ච | - | සුළඟින් සෙලවෙන රැලි නැඟෙන දිය බඳුනකට |
| විචිකිච්ඡා | - | මඩ සහිත බොරවූ වතුර භාජනයකට උපමා කර ඇති අතර එවැනි දිය බඳුනකින් මුහුණ බැලීමට උත්සාහ කළත් එය සාර්ථක වෑයමක් නොවන්නාක් මෙන්, පංච නීවරණයන්ගෙන් කැලඹුණු සිතේ කිසිවක් මැනවින් ධාරණය නොවන බව |

- ඒ නිසා භාවනාව මඟින් පංචනීවරණ ධර්මය සමනය කිරීම ධාරණ ශක්තිය වැඩි දියුණුවීමට උපකාරි වන බව.
- භාවනාව මඟින් සිතේ ඇතිවන එකඟතාව නිසා වහා යමක් අවබෝධ කර ගැනීමටත් මතක තබා ගැනීමටත් උපකාරි වන බව
- භාවනාව මඟින් හැඟීම් පාලනය වන බැවින් අනවශ්‍ය අරමුණුවලට යොමු නොවී ඉගෙනීමේ කටයුතුවලට ම සිත යොමු කළ හැකි බව

- සුතමය, චින්තනමය, භාවනාමය ත්‍රිවිධ ප්‍රඥාවක් බුදුසමය අවධාරණය කරන බැවින් භාවනාව ලෞකික මෙන්ම ලෝකෝත්තර ප්‍රඥාව සාධනයට උපකාරී වන බව
- සුතා, ධතා, වචසා පරිචිතා, මනසානුපෙක්ඛිතා, දිට්ඨියා සුප්පටිවිද්ධා යන ඉගැන්වීම ධාරණය ඉහළ නැංවීමට අදාළ කරගත හැකි භාවනාමය ක්‍රියාවලියක් බව

(දුතිය උරුවේල සූත්‍රය-අ.නි.2)

- භාවනා කිරීමේ දී දියුණු කළ යුතු ආවජ්ජන, සමාපජ්ජන, අධිට්ඨාන, වුට්ඨාන, පච්චවෙක්ඛන යන වසිතාවන් ලෞකික විෂයයන්හි ධාරණ ශක්තිය වර්ධනය කර ගැනීමට අදාළ කරගත හැකි බව
- නූතන මනෝ විද්‍යාඥයන් මතක තබා ගැනීම සඳහා සපයන උපදෙස්වල ඇතුළත් රුචිය, සංවිධානාත්මක බව, සැකයකින් තොරව තේරුම් ගැනීම, ප්‍රධාන කරුණු ගොනුකර ගැනීම, චිත්තරූප, සාකච්ඡා කිරීම, නිතර නිතර අභ්‍යාස කිරිම, පරිකල්පනය, පිළිවෙළ, විවේකය, පිරිසිදු ප්‍රසන්න පරිසරය, ඉලක්කය සිහිපත් කිරීම. මානසික සන්සුන් බව, අධිෂ්ඨානය ආදිය භාවනාව සමඟ මනා ව ගැළපෙන බව.

- අං.නි. පචලායන සූත්‍රයේ දී මුගලන් හිමියන්ට ලබාදුන් උපදෙස් වන යම් කරුණක් මෙනෙහි කිරීමේ දී නිදිමත එයි නම් මෙනෙහි කරන කරුණ මාරු කිරීම (විෂය මාරු කිරීම) නැවතත් නිදි මත දනේ නම් අනුවර්තනය ද එසේත් නිදි මත පහ නොවේ නම් සජ්ඣායනය ද එසේත් නිදි මත පහ නොවේනම් අත්දෙකින් කන්පෙති දෙක ඇදීම, ඇඟිල්ලෙන් කන්සිදුරු පිරිමැදීම, අත්ලෙන් අත්පා පිරිමැදීම යනු මතකය වර්ධනය කර ගැනීමට අදාළ කරගත හැකි උපදෙස් බව

**භාවනාව හා කායික මානසික සෞඛ්‍යය**

- ආරෝග්‍ය පරමා ලාභා - කායික සෞඛ්‍යය
  සන්තුට්ඨී පරමං ධනං - මානසික සෞඛ්‍යය
  විස්සාසා පරමා ඤාති - සමාජීය සෞඛ්‍යය
  නිබ්බාණං පරමං සුඛං - ආධ්‍යාත්මික සෞඛ්‍යය

යනුවෙන් බුදු දහම විවිධ පැතිවලින් සෞඛ්‍යය දෙස බලා ඇති බව

- නිවැරදි භාවනාව මඟින් සිත සහ කය පිළිබඳවත්, ලෝක ධර්මතාව පිළිබඳවත් ගැඹුරු වැටහීමක් ලබාගත හැකි අතර එමඟින් බොහෝ පීඩා, ගැටලු විසඳාගත හැකි බව
- මනස රෝගී වීම කායික රෝගවලට ද මූලික වන බව පර්යේෂණ මඟින් තහවුරු කරගෙන ඇති අතර, බොජ්ඣංග භාවනා ආදියෙන් කායික රෝග සුව කිරීමෙහි ලා මානසික නීරෝගතාව අවශ්‍ය බව බුදු දහම උගන්වා ඇති බව
- මානසික ආතතිය අවම කරන ප්‍රතිකාර ක්‍රමයක් ලෙස භාවනාව භාවිත කරන බව
- භාවනාවෙන් තොර මනසේ සමබරතාව අහිමි වන අතර එවිට විවිධ කායික මානසික රෝග ඇති වන බව
- භාවනාව පුරුදු කළ අයගේ කයට රෝගයක් ඇති වුවත් මනස පාලනය කරගත හැකි නිසා පීඩාව අවම කරගත හැකි බව.

- පර්යේෂණයන්ට අනුව භාවනා කරන විට අප ශරීරයෙන් එන්ඩෝෆින් නමැති හෝමෝනය වැඩි වශයෙන් ස්‍රාවය වන අතර එම හෝමෝනයෙන් වේදනා සමනය කොට ශරීරයේ විවිධ පද්ධතිවල යහ පැවැත්ම ඇති කරන බව
- භාවනා කරන විට ප්‍රතිශක්තිකරණ පද්ධතිය ශක්තිමත් වන අතර එමඟින් අපට රෝගවලින් ආරක්ෂා විය හැකි බව
- අධිරුධිර පීඩනය, හදවත් රෝග,මානසික ආතතිය නිසා ඇතිවන විවිධ රෝග, පිළිකා ඇතැම් ආසාත්මිකතා ආදිය භාවනාව මඟින් පාලනය කළ හැකි බව.
- සාමාන්‍ය ජීවිතයේ දී බලාපොරොත්තු ඉටු කර ගැනීමෙන් ලබන සතුට පවතින්නේ වෙනත් අවශ්‍යතාවක් ඇතිවන තෙක් පමණක් වන බැවින් භාවනාව මඟින් ආශාවන් කළමනාකරණය කරගෙන තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට හැකියාව ඇති නිසා එය අමිල ඖෂධයක් බව

**භාවනාව හා ගැටලු නිරාකරණය**

- කායික හා මානසික ගැටලු නිර්මාණය කිරීමට බෙහෙවින් හේතුවන ලෝභය, ද්වේශය, මෝහය භාවනාව මඟින් පාලනය කළ හැකි බව
- භාවනාව මඟින් සතිය දියුණු කළ හැකි අතර දෛනික ජීවිතයේ කටයුතු සාර්ථක ව සිදුකර ගැනීමට එය උපකාරී වන බව
- අනාගතය පිළිබඳ වෙහෙසකාරී හැඟීම්වලින් මිදී වර්තමානයේ සුඛිත ව ජීවත්වීමට අවශ්‍ය මානසික පසුබිම භාවනාව මඟින් සකසා ගත හැකි බව
- පුද්ගල සම්බන්ධතා කෙරෙහි ලෙස බලපාන අයහපත් මානසික තත්ත්වයන් (චිත්තවේග) භාවනාව මඟින් පාලනය කිරීමෙන් නිරාකරණය කර ගත හැකිබව
- චිත්තවේග නිසා සුව නින්දක් නොලැබේ. භාවනාවෙන් කය මෙන් ම මනස ද සංවර වන බැවින් සුව නින්දක් ලබාගත හැකි බව.
- පාරාසරිය බ්‍රහ්මණයාගේ ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් දේශිත ඉන්ද්‍රිය භාවනා සූත්‍රයෙන් භාවනාව මඟින් ගැටලු විරහිත සමාජ ජීවිතයක් ගත කරන ආකාරය පිළිබඳ උපදෙස් ලබා දී ඇති බව
- සංගාරව සූත්‍රයේ දී පංචනීවරණ පිළිබඳ උපමානුසාරයෙන් කරන විග්‍රහය බොහෝ අභ්‍යන්තර සහ බාහිර (මානසික සහ සමාජ) ගැටලු නිරාකරණය කර ගැනීමට අදාළ කරගත හැකි බව
- සමථ- විදර්ශනා භාවනා පුහුණු කරන ලද මනසක් ඔස්සේ ලෝකය දෙස බලන කල්හි සියලු ගැටලුවලින් තොර ජීවිතයක් ගොඩනඟා ගත හැකි බව

**භාවනාවේ උපයෝගීතාව පිළිබඳ නූතන ඇගයීම්**

- භාවනාව නිසා සිතේ ඇතිවන ප්‍රීතිය නිසා මොළයේ පිටියුටරි ග්‍රන්ථියෙන් එන්ඩොපින් නමැති හෝමෝනයක් ශ්‍රාවය වන බව විද්‍යාඥයන් තහවුරු කරගෙන ඇත. එයින් බොහෝ රෝග සුව කරගත හැකි යැයි ඔප්පු කර ඇති බව.
- අකමැත්ත හෙවත් කේන්තිය නිසා වැඩි වැඩියෙන් මනස විසිරීම නිසා ශරීරයට අහිතකර ආකාරයට ස්‍රාවය වන හෝමෝන හා තවත් ජෛව රසායනිකයන් නිසා ශරීරයේ ප්‍රතිශක්තිය හීනවීම , රුධිර සංසරණයේ වේගය වැඩිවීම මඟින් නොයෙකුත් රෝග හට ගැනීම ආදිය භාවනාව මඟින් පාලනය කළ හැකි බව.

- මානසික අවපීඩනය හෙවත් විශාදයට හේතුව වන්නේ ලේවල ඇති ස්නායු පද්ධතියට සම්බන්ධ ජෛව රසායනිකයන් අඩුවීම බව වෛද්‍ය විද්‍යාත්මක සොයා ගැනීම වන අතර භාවනාව මගින් එය පාලනය කළ හැකි බව විද්‍යාඥයන් තහවුරු කොට ඇති බව
- මොළයේ නියුරෝන සෛල වර්ධනය කිරීමට භාවනාව උපයෝගී කරගත හැකි බව
- භාවනා කිරීමේ දී ස්‍රාවය වන සංවෘත්තික හෝමෝන මගින් ශරීර ශක්තිය වැඩිවන නිසා ක්‍රීඩාවේ දි ඉහළ ජවයක් ලබා ගැනීමට භාවනාව උපයෝගී කරගත හැකි බව
- බටහිර නවීනතම ප්‍රතිකාරවලින් සුවකර ගත නොහැකි වූ රෝග පවා භාවනාව මගින් සමනය කළ හැකි යැයි සායනික මෝහන වෛද්‍යවරුන් විසින් සනාථ කරනු ලැබ ඇති බව
- ''ආධ්‍යාත්මික හා සියලු සචේතන නිමැවුම් කෙරෙහි මෙත් සිත් වැඩීම අනුදැන වදාළ බුදු රජාණන් වහන්සේ. අකුසල් ගැන නොවදාළහ. කාරුණිකත්වය හා අවබෝධය මඟින් අවිද්‍යාව හා මෝහය දුරු කළ හැකි බැව් වදාළහ '' යනුවෙන් ආචාර්ය සර්ව පල්ලි රාධාක්‍රිෂ්ණන් පඬිතුමාගේ ''ගෞතම බුද්ධ'' නම් කෘතියේ එන ප්‍රකාශයෙන් ද විද්වතුන් බුදුදහමට විශේෂයෙන්

  පැහැදීම කෙරෙහි භාවනාව උපයෝගී වූ බැව් සනාථ වන බව.
- ''ගින්දර සමග සෙල්ලම් කරන ළමයින් කෙරෙහි විමසිල්ලෙන් බලන පියකු මෙන් බුදු රජාණන් වහන්සේ උපායශීලී ව ලෞකික ආශාවන් නමැති ගින්නෙන් දැවෙන මිනිසා, ඉන් මුදවා නිවන නමැති අභය භූමිය වෙත යොමු කරති'' 'ද එසෙන්ස් ඔෆ් බුඩිසම්' කෘතියේ දී ආචාර්ය ලක්ෂ්මී නරස පඩිතුමා කරන ප්‍රකාශයෙන් ද භාවනාමය ක්‍රියාවලිය අගය කොට ඇති බව
- ''වසර දෙදහස් පන්සිය ගණනකට ඉහත විසූ බෞද්ධයන් නූතන මනෝවිද්‍යාත්මක ගැටලු වඩා හොඳින් අවබෝධ කරගෙන සිටි බවට කරුණු හෙළි වී ඇත. සුළු වශයෙන් නමුත් බුදු දහම කියවා බැලීමෙන් ඔවුන් තව වන තුරුත් ඒ පිළිබඳ ව ගරුත්වය ලබා සිටින බව වටහාගත හැකි වෙයි. ඈත අතීතයේ සිට ම ඔවුහු මෙවන් ගැටලු අධ්‍යයනය කර අවශ්‍ය විසඳුම් ද සොයා දැන ගත්හ'' යන මහාචාර්ය ග්‍රෙහැම් හෝව්ගේ ප්‍රකාශනයෙන් ද මානසික සංවර්ධනය හා ගැටලු නිරාකරණය හෙවත් බෞද්ධ භාවනාව බුදු දහමේ විශේෂත්වය ලෙස තහවුරු වන බව
- ''චිත්ත බලය ගැන මෙකල බෙහෙවින් ම අසන්නට ලැබේ. ලොව හමුවේ ඇති සිත දියුණු කිරීමේ අතිපරිපූර්ණ මෙන් ම අතිශයින් ම ඵලදායී ක්‍රමය පවත්නේ බුදු දහමෙහි ය'' ඩඩ්ලි රයිම්ගේ මේ ප්‍රකාශයෙන් ද භාවනාව පිළිබඳ වැදගත්කම අවධාරණය කෙරෙන බව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. භාවනාවේ අනුසස් දැක්වෙන පුවරුවක් නිර්මාණය කරන්න.
2. ''භාවනාව අධ්‍යාපනය ලබන දරුවන්ට ඵලදායක වන අයුරු'' යන මැයෙන් පුවත්පතකට ලිපියක් ලියන්න.
3. ''භාවනාව හා කායික මානසික සෞඛ්‍යය'' පිළිබඳ පොත් පිංචක් නිර්මාණය කරන්න.
4. භාවනාව හා ගැටලු නිරාකරණය පිළිබඳ පැහැදිලි කරමින් පුවත්පතකට ලිපියක් ලියන්න.
5. භාවනාවෙන් විසිරී පවතින මනස එකඟ කරගත හැකි අයුරු පිළිබඳ සාකච්ඡාවක් කරන්න.
6. භාවනාව පිළිබඳ නූතන ඇගයීම් ඇතුළත් ප්‍රදර්ශන පුවරුවක් නිර්මාණය කරන්න.

**පරිශීලනයට :**

- සාමඤ්ඤඵල සූත්‍රය - දීඝ නිකාය
- මහාසතිපට්ඨාන සූත්‍රය - දීඝ නිකාය
- අලගද්දූපම සූත්‍රය - මජ්ඣිම නිකාය
- නළකපාන සූත්‍රය - මජ්ඣිම නිකාය
- ලටුකිකෝපම සූත්‍රය - මජ්ඣිම නිකාය
- මහාලුංකප්පත්ත සූත්‍රය - සංයුත්ත නිකාය
- සමාධි භාවනා සූත්‍රය - සංයුත්ත නිකාය
- සීල සූත්‍රය - සංයුත්ත නිකාය
- විභංග සූත්‍රය - සංයුත්ත නිකාය
- දුතිය උරුවේල සූත්‍රය - අංගුත්තර නිකාය
- නීවරණ සූත්‍රය - අංගුත්තර නිකාය
- ව්‍යග්ගපජ්ජ සූත්‍රය - අංගුත්තර නිකාය
- මෙත්තානිසංස සූත්‍රය - අංගුත්තර නිකාය
- සංගාරව සූත්‍රය - අංගුත්තර නිකාය
- මේඝිය සූත්‍රය - ඛුද්දක නිකාය
- ධම්මපදය - මග්ගවග්ග
- විසුද්ධිමග්ග -
- බුදුන් වදාළ ධර්මය - වල්පොල රාහුල හිමි
- බෞද්ධ භාවනා ක්‍රම හා මනෝ චිකිත්සාව - මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ
- භවය, විඥාණය සහ කර්ම බලය - අතුල මංචනායක
- අසීමිත සුවතාව - වෛද්‍ය ප්‍රියංග ද සොයිසා
- විමුක්ති සඟරාව - කඳුබොඩ සියනෑ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ කම්මට්ඨානාචාර්ය සංගමයේ වාර්ෂික ප්‍රකාශනය, 1978

## පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම

ඉගෙනුම් - ඉගැන්වීම් සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගැයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දීය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයකුට අවශ්‍යය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවර්ධනාත්මක සැලැස්මක් යොදාගත යුතු ය.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩිදියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. තව ද මෙය ඉගෙනුම්-ඉගැන්වීම් දීර්ඝ කිරීමක් වශයෙන් ද හැඳින්විය හැකි ය. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියකට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්ය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක් විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරුණු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මඟින් සිදුවිය යුත්තේ සිසුන්ට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුභවතාගේ වගකීමකි. ඇගයීමේ (තක්සේරු කිරීමේ ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබාදිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මඟහරවා ගැනීමට ප්‍රතිපෝෂණයෙන් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයක් ලබාදීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම්

වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශ්වවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතුය. මේ සඳහා යොදාගත හැකි හොඳම ක්‍රමය වන්නේ සන්තතිකව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණු සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් ක්‍රියාවලිය සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම්-ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේ ය.

| | |
|---|---|
| 1. පැවරුම් | 2. ව්‍යාපෘති |
| 3. සමීක්ෂණ | 4. ගවේෂණ |
| 5. නිරීක්ෂණ | 6. ප්‍රදර්ශන /ඉදිරිපත් කිරීම |
| 7. ක්ෂේත්‍ර චාරිකා | 8. කෙටි ලිඛිත පරීක්ෂණ |
| 9. ව්‍යුහගත රචනා | 10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12. ශ්‍රවණ පරීක්ෂණ |
| 13. ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14. කථනය |
| 15. ස්ව නිර්මාණ | 16. කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17. සංකල්ප සිතියම් | 18. ද්විත්ව සටහන් ජර්නල |
| 19. බිත්ති පුවත්පත් | 20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් |
| 21. ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22. විවාද |
| 23. සාකච්ඡා මණ්ඩල | 24. සම්මන්ත්‍රණ |
| 25. ක්ෂණික කථා | 26. භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්-ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම සෑම එකක් ම සෑම විෂයයක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, නිපුණතා මට්ටමට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වගබලා ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශවල ගුරවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්වීම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මඟ හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන් ම ආවේදනික ගති ලක්ෂණත් මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

වාරය : 1

උපකරණ අංක : 01

නිපුණතාව : 06

නිපුණතා මට්ටම : **6.1**

උපකරණයේ ස්වභාවය : ධර්ම පත්‍රිකාවක් සැකසීම

**ක්‍රියාවලිය** : සිසුන් කණ්ඩායම් 03ට බෙදා නම් කර ලෝක ධර්මතා, ත්‍රිලක්ෂණය සහ අටලෝ දහම යන මාතෘකා තුන සිසුනට ලබා දී ඊට අදාළ ධර්ම කරුණු රැස් කිරීමට උපදෙස් ලබා දී එම කරුණු ඇසුරින් ධර්ම පත්‍රිකාවක් සැකසීම

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | නිපුණතා මට්ටමට අදාළ ව මූලාශ්‍ර පරීක්ෂා කොට තොරතුරු රැස් කිරීම | නිවැරදි මූලාශ්‍රයන්ගෙන් තොරතුරු ගොනු කිරීම. | ලේඛන හැකියාව | ප්‍රමාණාත්මක බව | නිර්මාණාත්මක නිමාව | ලකුණුවල එකතුව (20 න්) | මුළු ලකුණු / 2 අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය** :

| **තත්වය** | **ලකුණු** |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

| | | |
|---|---|---|
| **වාරය** | : | 1 |
| **උපකරණ අංක** | : | 02 |
| **නිපුණතාව** | : | 06 |
| **නිපුණතා මට්ටම** | : | **6.2** |
| **උපකරණයේ ස්වභාවය** | : | පරිසර වැඩසටහනක් |

**ක්‍රියාවලිය** : නිපුණතා මට්ටමට අදාළ ව ජීව-අජීව පරිසරය පිළිබඳ කරුණු සොයන්නට සිසුන් යොමු කරන්න. පාසල අවට පරිසරය පිරිසිදු කිරීමේ ශ්‍රමදානයක් හා රුක්රෝපණ වැඩසටහනක් සංවිධානය කර ක්‍රියාත්මක කරන්න.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | සම්පත් සොයා ගැනීම හා උපදෙස් ලබා ගැනීම | ක්‍රමානුකූල ලෙස හා සංවිධානාත්මක ලෙස | ශ්‍රම දායකත්වය හා සංවිධානාත්මක ලෙස | නිර්මාණශීලී සැලසුම් සහගත ගෙවත්තක් සැකසීම | සංරක්ෂණ කටයුතු ක්‍රියාමාර්ගය හා නිමාව | ලකුණු එකතුව (20 න්) | අවසාන ලකුණ $\frac{\text{මුළු ලකුණු}}{2}$ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය** :

| **තත්වය** | **ලකුණු** |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

| | | |
|---|---|---|
| **වාරය** | : | 1 |
| **උපකරණ අංක** | : | 03 |
| **නිපුණතාව** | : | 7.0 |
| **නිපුණතා මට්ටම** | : | **7.1** |
| **උපකරණයේ ස්වභාවය** | : | පොත් පිංචක් (නිර්මාණය කිරීම) |

**ක්‍රියාවලිය** : 7.1 නිපුණතා මට්ටමට අදාළ ව චතුරාර්ය සත්‍යය පිළිබඳ දැක්වෙන මූලාශ්‍රයාගත තොරතුරු රැස් කරවා විශ්ලේෂණය කොට චතුරාර්ය සත්‍යය පැහැදිලි කෙරෙන පොත් පිංචක් නිර්මාණය කරන්න.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | නිපුණතා මට්ටමට අදාළ මූලාශ්‍රයයන් හඳුනා ගැනීම | මූලාශ්‍රයාගත තොරතුරු රැස් කිරීම | අන්තර්ගතයේ ක්‍රමානුකූල බව | ලේඛන හැකියාව | නිර්මාණශීලී බව හා නිමාව | ලකුණු එකතුව (20 න්) | අවසාන ලකුණ $\frac{\text{මුළු ලකුණු}}{2}$ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

වාරය : 2
උපකරණ අංක : 04
නිපුණතාව : 8.0
නිපුණතා මට්ටම : 8.1
උපකරණයේ ස්වභාවය : බිත්ති පුවත්පතක් සැකසීම

ක්‍රියාවලිය : අදාළ නිපුණතා මට්ටමේ ඇති මිනිසාගේ ස්වාමීත්වය සහ ශ්‍රේෂ්ඨත්වය යන මාතෘකාව ඔස්සේ ලිපි එකතුවක් මඟින් බිත්ති පුවත්පතක් සකසන්න.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියට ඇති උචිත බව | සංවිධානාත්මක බව හා ප්‍රමාණාත්මක බව | ගුණාත්මක භාවයෙන් ඉහළ නිර්මාණවලින් යුක්ත බව | අන්තර්ගතය හා නිර්මාණශීලී බව | බිත්ති පුවත්පතක් ලෙස නිර්මාණකරණයෙහි සාර්ථක බව | ලකුණු එකතුව (20 න්) | මුළු ලකුණු / 2 අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

| | | |
|---|---|---|
| **වාරය** | : | 2 |
| **උපකරණ අංක** | : | 05 |
| **නිපුණතාව** | : | 8.0 |
| **නිපුණතා මට්ටම** | : | **8.2** |
| **උපකරණයේ ස්වභාවය** | : | බුද්ධි මණ්ඩල සාකච්ඡාවක් |

**ක්‍රියාවලිය** : 8.2 නිපුණතා මට්ටමට අදාළ මූලාශ්‍රය ඔස්සේ කරුණු රැස් කරන්නට සිසුන්ට පවරන්න. රැස් කරගත් කරුණු ආශ්‍රය කොටගෙන 'කුසල් අකුසල්, කර්මය හා පුනර්භවය' යන මැයෙන් බුද්ධි මණ්ඩල සාකච්ඡාවක් මෙහෙයවන්න.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ඉගෙනුම් ක්‍රියාවලියට අදාළ බව හා මාතෘකාවට අදාළ බව | සාකච්ඡා මණ්ඩල සංවිධානය කර ගැනීම මෙහෙයවීම හා තේමා වෙන් කර ගැනීම | මාතෘකාවලට අදාළ ව සංවිධානාත්මක අයුරින් සාකච්ඡාව පවත්වා ගැනීම | ඉදිරිපත් කරන කරුණුවල පදනම, තර්කානුකූල බව හා නිවැරදි බව | සම්පිණ්ඩනය, නිගමන හා නිගමනවලට හේතු ඉදිරිපත් කිරීම | ලකුණු එකතුව (20 න්) | අවසාන ලකුණ $\frac{\text{මුළු ලකුණු}}{2}$ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

වාරය : 2
උපකරණ අංක : 06
නිපුණතාව : 9.0
නිපුණතා මට්ටම : **9.1**
උපකරණයේ ස්වභාවය : ප්‍රශ්න හා පිළිතුරු පොතක්

**ක්‍රියාවලිය** : ධනෝපායනය හා කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හා එහි වැදගත්කම ආශ්‍රය කර ගනිමින් කෙටි ප්‍රශ්න 50ක් සහ ඒවාට පිළිතුරු ඇතුළත් පොතක් නිර්මාණය කිරීම.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | මාතෘකාවට අදාළ පරිදි ප්‍රශ්න සකස් කිරීම | නිවැරදි පිළිතුරු සකස් කිරීම | ලේඛන කුසලතාව | අන්තර්ගතයේ නිර්මාණශීලී බව | කාලානුකූල බව හා නිමාව | ලකුණු එකතුව (20 න්) | මුළු ලකුණු / 2 අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

| | | |
|---|---|---|
| **වාරය** | : | 3 |
| **උපකරණ අංක** | : | 07 |
| **නිපුණතාව** | : | 9.0 |
| **නිපුණතා මට්ටම** | : | **9.2** |
| **උපකරණයේ ස්වභාවය** | : | සාකච්ඡා මණ්ඩල |

**ක්‍රියාවලිය** : සිසුන් කණ්ඩායම් 4කට බෙදා බෞද්ධ දේශපාලන මූලධර්ම ඇතුළත් වන පහත සඳහන් මාතෘකා ලබා දෙන්න.

- දසරාජධර්ම හා දසසක්විති වත්
- සප්ත අපරිහානීය ධර්ම හා සතරඅගති විරතිය
- සතර සංග්‍රහ වස්තු සහ පංචසීලය
- රාජ්‍ය පාලනයට අදාළ වෙනත් ඉගැන්වීම්
- මූලාශ්‍රය අධ්‍යයනයෙන් කරුණු ගවේෂණයට සිසු කණ්ඩායම් මෙහෙයවන්න.රැස් කළ කරුණු අතර සංවාධාත්මකව සාකච්ඡාවක් කරන්න.

| **නිර්ණායක** / **කණ්ඩායම් අංකය හෝ නම** | රැස්කරගත තොරතුරුවල ඇති තේමාවට අදාළ බව හා නිවැරදි බව | තේමාවට ගැළපෙන තොරතුරු ඉදිරිපත් කිරීම හා කාල කළමනාකරණය | නිවැරදිව මූලාශ්‍රය දැක්වීම | තාර්කිකව හා නිරවුල්ව කරුණු ඉදිරිපත් කිරීම | ඉදිරිපත් කරන ලද කරුණුවලින් ප්‍රස්තුතය තහවුරු කිරීම | ලකුණු එකතුව (20 න්) | මුළු ලකුණු / 2 අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය** :

| **තත්වය** | **ලකුණු** |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

| | | |
|---|---|---|
| **වාරය** | : | 3 |
| **උපකරණ අංක** | : | 08 |
| **නිපුණතාව** | : | 10.0 |
| **නිපුණතා මට්ටම** | : | **10.1** |
| **උපකරණයේ ස්වභාවය** | : | නිර්මාණාත්මක ක්‍රියාකාරකම් |
| **ක්‍රියාවලිය** | : | පාසලේ පොහොය වැඩසටහනකට සමගාමීව බෞද්ධ භාවනාවේ සුවිශේෂතා සහ එහි උපයෝගීතාව පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම. |

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | නිපුණතා මට්ටමට අදාළ මූලාශ්‍රයාශ්‍රිත තොරතුරු ඉදිරිපත් කිරීම | වැඩමුළුවට සහභාගිවීම හා කාල කළමනාකරණයෙන් කටයුතු කිරීම | නිපුණතා මට්ටමට අදාළ බ සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීම | ඉදිරිපත් කරන ලද අදහස්වල නිර්මාණශීලීත්වය හා අදාළ බව | සම්බන්ධනය හා සමස්ත ක්‍රියාවලියේ සාධනීය බව | ලකුණු එකතුව (20 න්) | මුළු ලකුණු / 2 අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| **තත්වය** | **ලකුණු** |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

වාරය : 3
උපකරණ අංක : 09
නිපුණතාව : 10.0
නිපුණතා මට්ටම : **10.2**
උපකරණයේ ස්වභාවය : ප්‍රායෝගික ක්‍රියාකාරකම්

ක්‍රියාවලිය : 10.2 නිපුණතා මට්ටමට අනුව භාවනා වැඩසටහනක් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | නිපුණතා මට්ටමට අදාළ බව | සහභාගීත්වය සහ සක්‍රිය දායකත්වය | සම්පූර්ණ කාලසීමාව වැඩසටහන තුළ රැඳී සිටීම | සංවිධානාත්මක බව | සමස්ත ක්‍රියාවලියේ සාර්ථකත්වය | ලකුණු එකතුව (20 න්) | $\frac{\text{මුළු ලකුණු}}{2}$ අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |